

# දළදා වරුණ

මහනුවර ශ්‍රී දළදා මාලිගාව මාසිකව නිකුත් කරන
ලංකාවේ වැඩිම පිරිසක් කියවන බෞද්ධ සඟරාව

■ ශ්‍රී බුද්ධ වර්ෂ 2558 ඉල් මස 06 වන ගුරු දින ■ 2014 නොවැම්බර් මස 06 වැනි බ්‍රහස්පතින්දා



■ [illegible] ■ [illegible]



## විපාක දුන් කර්ම දෙළහ

# පෙර කළ අකුසල් පසුපස ආ හැටි


**දශබලධාරී බුදුරජාණන් වහන්සේටද පූර්වයේ කරන ලද කර්ම දොළහක් මෙලොවදී විපාක දුන් බව දිනක් හිමාලයේ අනෝතත්ත විල අසලදී 500 ක් භික්ෂූන් හමුවේ වදාළ සේක. පුබ්බ කම්ම පිලෝතික අපදානයට අනුව ඒ මෙසේය.**

1. සුන්දරී පරිබ්‍රාජිකාවගේ විහාර ස්ථානයට එන යන ගමන හේතුවෙන් විශාල අපවාදයක් නැගුණි. එයට හේතුව පෙර මුනාලි ධූර්තකව සිටියදී සුරභි නම් පසේ බුදුරජුන්ට කළ දෝෂාරෝපණයයි.
2. පෙර ලොව පහළ වූ සර්වාභිභූ නම් බුදුරජුන්ගේ නන්ද නම් ශ්‍රාවකයන් වහන්සේට කාමභෝගිකය කියා දෙස් නගන්නට විය. ඒ හේතුවෙන් සසර බොහෝ දුකට පත්විය. මේ සාරසංඛෙය්‍ය කල්ප ලක්ෂයකටත් පෙර කරන ලද කර්මය බුදු බව ලබාද, [illegible] අම්මා කෙනෙකුගේ වේශයෙන් චිංචි මාණවිකාව හේතුවෙන් පහත් වූ අපවාදයකට ලක්විණ.
3. පසු කාලයකදී සුන්දරී පරිබ්‍රාජිකාව මරා මල් අසුන ළඟ වළලා බුදුරජුන් ඇයව දූෂණය කොට මරා සඟවන ලද්දේ යැයි මහත් දෝෂාරෝපණයකට දින 7 ක් තුළ භාජනය විණි. දින 7 කින් පසු සත්‍ය එළිවිය. මෙසේ නිගුණ වී නින්දාවට හේතුව පෙර භීම නම් සාසින් වහන්සේට බැණ වැදීමය.
4. මහ බෝසතාණන් වහන්සේ පෙර වස්තු ලෝභය නිසා තම සොයුරා කන්දකින් පහළට තල්ලු කර ගලක් පෙරළා මරා දැමුවේය. ඒ හේතුවෙන් සසර බොහෝ දුකට පත්වී බුදු වූ ජීවිතයේද දෙව්දත් තෙර ගලක් පෙරළීය.
5. බෝසතුන් දිනෙක කුඩා ළමයෙකුව සිටියදී පසේ බුදු කෙනෙකුන් දැක ගල්කින ගැසීය. ඒ කර්මය හේතුවෙන් මේ ජීවිතයේ තම ජීවිතය නැති කිරීමට දෙව්දතුන් දුනුවායන් යොදවනු ලැබීය.
6. පෙර බෝසතුන් ඇත් ගොව්වෙක් වී සිටියදී පසේ බුදු කෙනෙක් වඩිනා බව දැක දුෂ්ට සිතින් මැරීම සඳහා ඇතා මෙහෙයවීය. මෙවිට උන්වහන්සේ සෘද්ධියෙන් වැඩියේය. තමන් පහත් සිතින් කළ කර්මය නිසා මේ ජීවිතයේ තමන් වහන්සේ මැරීම පිණිස මත් වූ නාලාගිරි ඇතු ඉදිරියට පැමිණියේ.
7. දෙව්දත් තෙරුන් තථාගතයන් වහන්සේ කෙරෙහි ගැටුණු සිතින් ගිජු කුළු පව්වේදී මහ ගලක් [illegible] කරන බුදු පිහිටේ නිසා පෙරළුවේය. පෙර වීරිය පාරමී බලයෙන් මහ ගලක් ඉවතට මතුවී ඒ ගල වැටෙන්නට නොදී රඳවා ගනු ලැබිය. නමුදු ගල් පතුරක් ගැලවී අවුත් ශ්‍රී පතුලේ වැදී පයට ඇඟිල්ල තැලී ලේ කැටි ගැසුණේය. ජීවකතුමා ශ්‍රී පතුල පලා ලේ අස් කළේය. මෙසේ ශ්‍රී පතුල පලන ලද්දේ පෙර [illegible] සිටියදී මිනිසෙකු මරවන ලද පවින් සිදුවිණි.
8. තථාගතයන් වහන්සේගේ හොඳ නොවන හිස රුජාවකට හේතුව පෙර කෙවුල් පවුලක ඉපදී සිටියදී තම ඥාතීන් බොහෝ මාළුන් කොටා මරනවා දැක සතුටු සිතා පසළ කළ බවය බව දැන ගනු. එදා ඒ මෙසේ සිදුවූ සියලු ඥාතීන් මේ දිවියේද ඥාතීන් වී ඉපදුණේය. ඒ සැමට ඒ ප්‍රාණඝාත කර්මය විපාක දීම ලෙස විඩූඩභ කුමරු අතින් මිය යන්නට සිදුවිය.
9. තුන් ලොවම පුදා ලැබිය යුතු දෙයා උපස්ථායක ශ්‍රාවක ශ්‍රාවිකා පිරිසක් ඇති තථාගතයන් වහන්සේට වේරංජාවේ වස් කාලයේ එක් වත් ආහාරයක් නොලැබී ගියේය. අශ්වයන්ට දෙන යවහාල් වළඳා ජීවත් වෙන්න සිදුවිය. මෙසේ වීමට හේතුව පෙර ඵුස්ස බුදුරජාණන් වහන්සේ. හිමිවරුන්සේ මේ භික්ෂූන් හැල් හාල් වළඳනවාට වඩා හොඳයි යවහාල් වළඳවා නම් කියා දෙස් නැගූ පාපය.
10. බුදුරජුන් වහන්සේට හොඳ නොවන කොන්දේ ආබාධයක් විය. ධර්ම දේශනා කරන අවස්ථාවල එය [illegible] සැරියුත් හිමිට දේ දෙසුම පවරා විවේක ගැනීමට වඩින පරිද [illegible] වෙයි. මෙයට හේතුව පෙර මල්ලව පොර අල්ලන යෝධයකුව සිටියදී විරුද්ධවාදී මල්ලවපොරකාරයකුගේ කොන්ද කැඩූ පවය.
11. බුදුරජුන්ට වැළඳුණු ලෝහිත පක්ඛන්දිකා (ලේ අතිසාරය) රෝගයට හේතුව පෙර වෛද්‍යවරයකුව සිටියදී සිටුවරයකුට බෙහෙත් කළේය. ඔහු නියමිත මුදල නොගෙවා සිටියේය. පසුව විරේක බෙහෙත් දීමෙන් ඔහුට ලේ සහිත විරේක විය. සිටුවරයා බිය වී නියමිත මුදල් ගෙවූ කල නැවත සනීප කළේය. නමුදු ඒ කර්මය විපාක දුන්නේය.
12. මහ බෝසතාණන් වහන්සේට බුදුවීම පිණිස සය අවුරුද්දක් දුෂ්කර ක්‍රියා කිරීමට සිදුවූයේ පෙර ජෝතිපාල මාණවකයාව සිටියදී ඝටීකාර බඹුණා සමඟ කාශ්‍යප බුදුරජාණන් වහන්සේට දෙස් කී පාපය නිසා බව දැනගත යුතුය.

සත්පුරුෂ පින්වතුනි, [illegible] මහත් වූ ගුණයක් ඇති මහත් වූ බලයක් ඇති, [illegible] වූ යසසක් ඇති, මහත් වූ පිරිවර සම්පත්තියක් ඇති, මහත් වූ ඥාන සම්පත්තියක් ඇති, මහත් සෘද්ධි බලයක් ඇති තථාගත සම්මා සම්බුද්ධරාජාණන් වහන්සේට පූර්වයේ කරන ලද කර්ම සහ එහි විපාකවලින් ගැලවී සිටීමට නොහැකි නම්, එතරම් පාරමී සම්පත්තියක් [illegible], ගුණයක්, පිරිවරක්, සෘද්ධි බලයක් නැති අප වැනි [illegible] කෙසේ නම් ගැලවෙන්නද? එබැවින් [illegible] නොකරන්න. සිත් දිනා [illegible], පිරිවරක්, [illegible] ඇති නොකරන්න [illegible], [illegible], දොෂ්, දෙමිනසත් [illegible] වෙහෙසත් නොකරන්න.

පූජ්‍ය රිදීයගම සුධම්මාභිවංශ හිමි

"මේ ලෝකයේ කවරදාවත් වෛරයෝ වෛරයෙන් නොසන්සිඳෙත්. අවෛරයෙන්ම වෛරයෝ සංසිඳෙත්."



# ඉවසන්න
## ඔබට සැනසීම ලැබෙනු ඇත

බුදුන් වහන්සේගේ ඉගැන්වීම්වල පොදු ලක්ෂණයක් වන්නේ සියල්ලන්ටම ස්වාධීනව ජීවත් විය හැකි සමාජයක් ගොඩනැගීමයි.

දෙවි, මිනිස්, තිරිසන් හා අමනුෂ්‍ය සියලු දෙනාම පීඩාවකින් තොරව සිය ජීවිතය ගත කිරීමට ප්‍රිය කරති. ඒ නිසා සියල්ලෝම දඬුවමට හා හිංසනයට බිය වෙති. අවම වශයෙන් දඬු මුගුරු අවි ආයුධ දරාගෙන සිටින අයෙකු දුටුවිට වුවද කවරෙකු තුළත් බියක් හා තැතිගැන්මක් ඇතිවීම ස්වභාවික සිදුවීමකි. මේ නිසා සෑම අයෙකුටම නිදිවසු සමග ගැටීමෙන් තොරව ජීවත්වීමට හැකියාව ඇති කිරීමට මග කියා දීම බුදු දහමෙහි අරමුණයි. ඒ පිළිබඳව පවත්නා ප්‍රධානම ඉගැන්වීම වන්නේ ඉවසීමයි. ඉවසීම නැති තැනක උපදින්නේ ගැටුමයි.

මිනිසුන්, දෙවියන්, අසුරයන්, නාගයන්, ගාන්ධර්වයන් හා අනෙක් නොයෙක් සත්වයන් අතරද ගැටුම් ඇතිවේ. ඔවුහු අනොන්‍යය වෛරයෙන්, හිංසාවෙන්, සතුරුකමින් හා තරහාවෙන් තොරව වාසය කරමු යැයි කොපමණ සිතුවද අනොන්‍යය වෛරයෙන්, සතුරුකමින්, තරහාවෙන් යුතුවම වාසය කරති. එසේ මෙම සියලු දෙනාම ගැටුමට පොළඹවන මානසික නාඹුරුකම් කිහිපයක් වේ. තමා කැමති දෙයට බෙහෙවින් ඇලීම, තමා අප්‍රිය වූ දෙයට එරෙහිවීම, සතුට ඇති කරන දෙය සුලුබැද යාම, අසතුට ගෙන දෙන අරමුණු නිසා පීඩාවට පත්වීම, තමා සතු දෙය ආරක්ෂා කරගැනීමට ඇති දැඩි වුවමනාව, තමාට ලබාගැනීමට නොහැකි සම්පත් අන් අය භුක්ති විඳින විට ඇතිවන අසහනකාරී බව, සීමාසහිත සම්පත්වලට ඇති තරඟකාරිත්වය හා අයිතිවාසිකම් කීම, තමා පිළිට විශ්වාසයන් සමග ඇති දැඩි ඇලීම වැනි නාඹුරුකම්ය.

ඉවසීම යනු ගුණ ධර්මයකි. යමෙක් එය පුරුදු පුහුණු කරයිද ඔහු තුළ ගුණාත්මක සංවර්ධනයක් ඇතිවේ. මෛත්‍රිය, කරුණාව, මුදුසිලිත්වය, සුහදත්වය, පොදු හැඟීම, සංයමය වැනි ධනාත්මක සිතිවිලි හා ඒ හා බැඳුණු ක්‍රියාකාරකම් ඇති වේ. පොදුවේ ඉවසීම තුළ අවස්ථා දෙකක් දක්නට ලැබේ. එනම්,

- විරුද්ධ පුද්ගලයාට ඇති බය නිසාත්, තමා කායිකව හා මානසිකව දුර්වලයකු නිසාත් ඇතැමෙක් ඉවසති.
- තමා පීඩාවට පත් කරන්නා පරාජය කිරීමට තමා තුළ කායික හා මානසික හැකියාව තිබියදී ඉවසීම දෙවැනි කරුණයි.

ගැටුමකට හෝ අනොන්‍යය අරගලයකට මැදිහත් වීමට වඩා ඉවසීම ඉතාමත් ප්‍රායෝගිකය. ඉවසීම අධ්‍යාත්මික හා බාහිර වශයෙන් හිතකරය. සමාජයේ ජීවිත පන්තිය පැමිණීටම බොහෝ සෙයින් ඉවසයි. අරගලයකට මැදිහත් වීමට වඩා එයක් උසස් ගුණාංගයකි. එහෙත් තමාට එරෙහි වන පුද්ගලයා පරදවා දිනීමට තමාට හැකියාව ඇතිව ඉවසීම එයට වඩා උතුම් ගුණාංගයකි. අධ්‍යාත්මික ගුණ ධර්මයන්ගෙන් යුක්ත කායිකව ශක්තිමත් පුද්ගලයාගේ ඉවසීම ප්‍රශස්ත කරුණකි. නුවණැත්තා කායිකව හා මානසිකව ශක්තිමත් අයෙකි. එබැවින් නුවණැත්තා බාලයන් හා සටන් නොකරයි.

ඉවසීම පුරුදු කළ සත්පුරුෂයාගේ උසස් ලක්ෂණ කිහිපයක් දක්නට ලැබේ. ඔහු කිසිවිටෙක බාලයන් හෙට්ට පහත් අදහස් ඇති අය සමග නොගැටෙයි. එසේම ඔහු නිපුණ නැණැත්තා ඉදිරියේ සිහි ඇතිව කල් ගෙවයි. මෙසේ සත්පුරුෂයාගේ ඉවසීම දුක බාලයා 'ඔහු තමාට ඇති බිය නිසා ඉවසයි' යනුවෙන් සිතුවත් නුවණැත්තා ඉවසීම ස්වකීය දියුණුව ඇති කරන හෙයින් ඉවසීම තවදුරටත් පුරුදු කරයි. තවද නුවණැත්තා ගුණ ධර්මයන්ගෙන්ද ශක්තිමත් අයෙකි. ඔහු තුළ ධර්මයෙන් යුතු බලයක් පිහිටා ඇත. එය ඉවසීම වැනි ගුණධර්මයන් නිසා උපන් බලයකි. එය නියම බලයක් නොවේ යැයි කීමට සුදුසු කිසිවෙක් ලෝකයේ නැත.

ඉවසීම නැති සිතක උපන් ක්‍රෝධය නිසා අනුන් සමග ගැටෙන අය වමිනින් තමාට හානි සමුණුවා ගනියි. එහෙත් නිපුණ නැණැත්තා ඉදිරියේ නුවණැත්තා නොසිතෙයි. එයම නොදිනිය හැකි වූ සටන දිනීමම එකම මගයි. එසේ සිහි ඇතිව ඉවසීමෙන් හැසිරීම නිසා තමාටද අනුන්ටද යහපත ඇති කරයි. එසේම මානසික වශයෙන් ඔහු තුළ නරක සිතිවිලි නැතිව යහපත් සිතිවිලිම හටගනියි. ඒවා වර්ධනය වීමෙන් කායිකව හා මානසිකව
නිරෝගීමත් හා ප්‍රසන්න පුද්ගලයෙක් බවට පත්වෙයි. සියල්ලෝම ඔහුට ප්‍රිය කරයි. එබඳු සත්පුරුෂ පුද්ගලයන් නිසා සමාජයක් යහපත් වේ. කිපෙන්නවුන්ට නොකිපීමද ක්‍රෝධ නොකිරීමද, අවිහිංසාවද ආර්යයන් (උසස් පුද්ගලයන්) සතු වූවකි. එබැවින් මෛත්‍රිය, ඉවසීම හා අවිහිංසාව සාමකාමී සදාචාරාත්මක සමාජයක පදනම වේ.

**එච්. එම්. මහින්ද හේරත්**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

"යමෙකු බැරිවීමකින් පවක් කළත් නැවත නැවත එය නොකළ යුතුය. පව් කිරීම නියතවම දුකට හේතු වේ."

4

# භික්ෂුවට වස්සාන සමයක් අවශ්‍ය වූයේ ඇයි?





සැබැවින්ම වස්සානය යනු කුමක්ද? වස්සාන කාලයක් භික්ෂුවකට අවශ්‍ය වූයේ මන්ද? එය පැනවීමට හේතු මොනවාද? යන කරුණු මෙහිදී විමසා බැලීම සාධාරණ යැයි සිතමි. සම්මා සම්බෝධියෙන් පසු ලෝකයෙහි රහතන් වහන්සේලා එක් සැටක් වූ කල "චරථ භික්ඛවේ චාරිකං බහුජන හිතාය, බහුජන සුඛාය ලෝකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දේව මනුස්සානං" (මහාවග්ගපාළි, මහාඛන්ධක) යනුවෙන් වදළ සේක. බොහෝ ජනයාගේ හිතසුව පිණිස අර්ථය පිණිස දෙව් මිනිසුන්ගේ යහපත පිණිස චාරිකාවෙහි හැසිරෙන ලෙස බුදුන් සේක. ඒ ලෙස නිදහසේ තැනින් තැන චාරිකාවෙහි වඩිමින් කාලය ගත කරන මහරහතන් වහන්සේලාට කාලය දේශගුණය බාධාවක් නොවීය. සම්බෝධියෙන් පළමු පස්විසි වස ඉක්මවන තුරුත් උන්වහන්සේලා එලෙස ඒකස්ථාන නොවූ චාරිකාමය පිළිවෙලක් අනුගමනය කළහ.


වස්සාන ශික්ෂාපදය පැනවෙන්නේ එබඳු සමයක වේරඤ්ජාය. සැමකල්හි භික්ෂූන් චාරිකාමය ජීවිතයක් ගතකරන නිසා එකල මිනිසුන්ගෙන් ඒ සඳහා විරෝධයක් පැන නැඟුනි. එකල වන විට බුදු දහම සියුහාමි ලෙස ව්‍යාප්තව තිබිම මෙයට එක් හේතුවක් වන්නට ඇත. කෙසේ හෝ වස්සාන ශික්ෂාපදය පැනවීමට හේතුව වූයේ ඒකින්ද්‍රිය ප්‍රාණීන් පෙළමින් නිල්තණ මිරිකමින් කුඩා සතුන් විනාශ කරමින් චාරිකා කරන ඔවුහු භික්ෂූන්ට කළ චෝදනාවයි. (වස්සූපනායික ඛන්ධකය) එය හේතුකොටගෙන කරුණු කිහිපයක් සලකා බුදු පියාණන් වහන්සේ මෙම ශික්ෂාපදය පනවා වදළ සේක. චාරිකාමය ජීවිතයක් ගතකරන භික්ෂුවට බවුන් වැඩීමට විවේකයක් එම වස්සාන සමය තුළ ඇතිවෙයි. එය ආත්ම විමුක්තියට අතිශය උපකාර වූවක් වන්නා සේම කල්‍යාණ මිත්‍රයන් උන්වහන්සේලා ඇසුරට උපාසක උපාසිකාවන්ටත් අවස්ථාව සලසා දෙන්නකි.

චාරිකාවෙහි හැසිරෙන්නාහුට ප්‍රඥා පහසුකම් දුබල බැවින් ඉන්ද්‍රිය සංවර ගැනීමද අපහසුය. වස් තුන්මස එක තැනක ගත කිරීම තුලින් භික්ෂුවට ප්‍රඥා පහසුකම් සැලසෙන්නාක් මෙන්ම ඉන්ද්‍රිය සංවර ගැනීමටද එය හේතු වේ. මෙබඳු ආනිසංස රැසක් දුටු බුදුපියාණන් වහන්සේ වස්සාන ශික්ෂා පදය අනුදැන වදළ සේක.

මේ සසුනෙහි පෙන්වන ශිෂ්ටාන්ත වස්සාන ලෙස සතු කාල තුනක් දක්වෙයි. එක් එක් සෘතුවකට මාස සතරක් අයත්ය. එලෙස අවුරුද්දෙහි සෘතු තුනක් වේ. සිව්මසක් ඇති වස්සාන සමයෙන් තුන් මසක් වස්වසන ලෙස බුදු පියාණන් වහන්සේ දේශනා කළේ මන්ද? මහ මඟේ සිතට අපක්ෂපාතිව සාධාරණව තර්කය ඉදිරිපත් කොට බලන්න. බුදු පියාණන් වහන්සේ වස් විසීමට පෙන්වා වදාළේ සමාජ උද්ඝෝෂණය නිසාත් භික්ෂූවට ආධ්‍යාත්මික විවේකය සපයා ගැනීම සඳහාත්ය. එය පරම අවිහිංසාවාදයට ගත් කළ වන්නේ සැබවින්ම අපූරුවකි. සාර මාසයක් ඇති වැසි සමයෙන් වස්සාන ශික්ෂාපදය බල පවත්වනුයේ තුන් මසකටය. එසේනම් අනෙක් ඉතිරි වස් මාසයේ පහළ වන සතුන් කෙරෙහි මහාකාරුණික බුදුපියාණන් වහන්සේගේ

"පව් කරන්නා මෙලොවත් ශෝක කරයි. පරලොවත් ශෝක කරයි. දෙලොවම ශෝක කරයි."

# දහම් දැනුම



# අට මහා කුසල් කවරේද?

කාරුණිකත්වයක් නොතිබුණේද? වස්සාන ශික්ෂාපදය පැනවීමට පෙර අවුරුදු 25 දී තණ කොළවල සතුන් නොසිටියේද? නැත්නම් එකල බුදු සිතේ කරුණාව නොතිබුණේද?

වැසි සමය පසුකරන් තබා ගිම්හානය ගෙන බැලුවද අප දෛනික චරියාවෙන් සතුන් මියයයි. මිදුලේ ඔබ අඩිය තබන ප්‍රදේශය හොඳින් පරීක්ෂා කර බලන්න. කුඩා කුහුඹියන් වැනි සතුන් බොහෝ ගණනක් එහි ඇත. ඔබ ඇවිදින විට එයින් ඇතැම්හු විනාශ වෙති. එසේ ගත් කළ වස්සාන කාලයේ පමණක් නොව අනෙක් සෑම දෙසකද එළියට නොබැස සිටින්නට සිදුවේ. නැතිනම් වස්සාන කාලයේ ඇති සතුන් නිසා ශික්ෂාපද දේශනා කළ මහා කාරුණික බුදු පියාණන් වහන්සේට අනෙක් සෑම දෙසකෙහි ඇති සතුන් කෙරෙහි කරුණාවක් නැද්ද? බුද්ධ දේශනාවකින් විසින් ඇතිකරන සමබිඳ ගැටලුවලට විසඳුම්ද ඔවුන් විසින්ම සැපයිය යුතුය. තම මතය සනාථ කිරීමට දහම් අදහම් යන කිසිවක් ඔවුනට අදාළ නැත. ඒ සඳහා අලුත් දහම් පොතක් (නිවරණ වැනි) පැන වීමටද ඔවුන් පසුබට නොවෙති. බෞද්ධ ජනතාව නිවන අරමුණු කොටගත් පිරිසකි. එහෙයින් නිවරණ පිණිස පවතින දේ ඔවුන් දුරු කිරීමට උත්සාහයක් වෙති.

වස්සාන කාලයේ විශේෂයෙන් තම දෛනික ක්‍රියාවලි නිසා සතුන් මියයෑම සිදුවේ. එසේ කරන බවුන් වැඩීම ඵල රහිත යැයි කියන විට සිතට නැගෙන ප්‍රශ්නය අනෙක් සෑම කාලවලට දෛනික ක්‍රියාවලින්ගෙන් සතුන් මරණයට පත් කරමින් කරන බවුන් වැඩීම පරමාර්ථ සහිත වූවක්ද? යන්නය එය සිතා බැලිය යුත්තකි.

''ඉධ පන භික්ඛවෙ උපාසකෙන සංඝං උද්දිස්ස විහාරො කාරාපිතො හොති... ගච්ඡෙය්‍යාථ භික්ඛවෙ සත්තාහ කරණීයෙන, පහිතෙ'' (මහාවග්ග, වස්සූපනායික ඛන්ධකය) යනුවෙන් භික්ෂුවක් උදෙසා වෙහෙරක් සම්පාදනය කිරීම වැනි විශාල කාප කිරීමක් කරන ලද්දෙකු දානයක වැනි කටයුත්තකට ආරාධනා කළහොත් සත්තාහ කාරණයෙන් (සත් දිනක් ඇතුළත එය යන අධිෂ්ඨානයෙන්) වස්කාලයේ බැහැර යාම අනුදැන වදාළ සේක. එසේ නම් බුදුපියාණන් වහන්සේ අප දන් වේලක් යනුවෙන් ඇවිදීමෙන් සිදුවන සතුන් මැරීම අනුදැන වදාළේද? බෞද්ධ ජනයාද ධර්මය සංග්‍රහ කළ උතුමන්ටද කවර චෝදනාවක් කළද අප වෙනුවෙන් පෙරුම් දම් පුරා බුදුවූ මහා කාරුණිකයන් වහන්සේට නගන එම අභූත චෝදනා ඉවසිය නොහැක. එහෙයින් දන ගෝ නොදන එම චෝදනා කරන පිරිසගෙන් තථාගතයන් වහන්සේට අභූත චෝදනා නොනගන ලෙස ඉල්ලා සිටිමි.

දිනක් දිවස් ලාභීන් අතර අග තැන්පත් අනුරුද්ධ මහ රහතන් වහන්සේ දිවැසින් තම පැන් කෝප්පය බලා වදාළ සේක. අරුමයකි එහි ප්‍රාණීන් සමූහයකි. බොහෝ සත්ව කොටස් එහි ජීවත් වෙති. ඒ පිළිබඳව බුදුපියාණන් වහන්සේට දැන්වූ විට දිවසින් ජලය දෙස බැලීම වරදක් කොට ශික්ෂාපද පැනවූවා මිසක පැන් බොන්නට එපා යැයි දේශනා නොකල සේක. එයින් කියැවෙන්නේ පැන් කෝප්පයේ සිටින සතුන් ගැන මහාකරුණා සිතේ අනුකම්පාවක් නැති බව නොවේ. පැන් කෝප්පය වළඳන භික්ෂුවට හෝ ඕනෑම පිපාසය නිවාගැනීම අරමුණු වන්නා මිසක සතුන් මැරීමේ චේතනාවක් ඇති නොවේ.

පූජ්‍ය පටලුගල සුමනසාර හිමි - කැලණිය

- බුදුරජාණන් වහන්සේ විසින් පූනීසට කතා කොට ''ඔබ ඔය උස්සලාගෙන සිටින කද බිම තියන්න කැමතිද?'' කියා ඇසුවේ කුමන පිළිතුරක් බලාපොරොත්තුවෙන්ද?

  පංචේන්ද්‍රියන්ගෙන් අල්ලාගෙන සිටින නාම සහ රූප නමැති කෙලෙස් කද බිම තැබීමට පුනීස කැමතිදැයි යන්න දැනගනු සඳහාය.

- බුදුරජාණන් වහන්සේ විසින් ලෝකයා හට පෙන්වා දීමට යෙදුණු අට මහා කුසල් කවරේද?

  කඨින පූජාව, අටපිරිකර පූජාව, සංඝාවාස කරවීම, සාංඝික දානය, බණ පොත් ලියවීම, පොත් පූජාව, බුද්ධ ප්‍රතිමා කරවීම සහ වැසිකිළි සෑදීම.

- බුදුරජාණන් වහන්සේට බොහෝ සමාන රූපකායක් තිබූ මහා කාශ්‍යප මහ රහතන් වහන්සේගේ ගිහි කල නාමය කුමක්ද?

  මෙතුමන්ගේ ගිහි කල නාමය 'පිප්පලි' නම් විය.

- තම ක්ෂත්‍රිය කුලයෙහි ගෝතම ගෝත්‍රයෙහි බව හැඳුරා බුදුරජාණන් වහන්සේ පැවසුවේ කිනම් ස්ථානයක, කිනම් ධර්ම දේශනයකදීද?

  දෙව්රම් වෙහෙරෙහිදී 'මහා පදාන සූත්‍රය' දේශනා කිරීමට යෙදුණු අවස්ථාවේදී බුදුරදුන් විසින් මෙසේ පැවසීමට යෙදුණි.

- සිදුහත් බෝසතුන් බුද්ධත්වයට පත්වීමෙන් පසු පළමුවෝ හැඳුරා ''පුබ්බේ අනනුස්සුතෙසු ධම්මේසු'' යනුවෙන් තදින් පැවසුවේ කා හටද?

  ''පෙර නොඇසූ ධර්මයෙකි'' යන තේරුම ගෙන දෙන මෙම වාක්‍ය ඛණ්ඩය පස්වග තවුසන් හට කීමට යෙදුණි.

- බුදු දහමෙහි දක්වෙන 'කුසලා කුසල ධර්මයෝ සිත පෙරටුකොට ඇත්තාහ' යන්නට දිය හැකි හොඳම උදාහරණය කුමක්ද?

  'තමාගේ සෙවණැල්ල තමා අත් නොහැර පසුපසම ගමන් කරන්නාක් මෙනි' යන්න මෙයට හොඳම උදාහරණය වේ.

- අතරමග දුක බුදුන් බව නොදැන එතුමන්ගෙන් ප්‍රශ්න අසා ''එසේ නම් ඔබ 'අනන්තජින' විය යුතු'' යයි පැවසූ බමුණු කවරෙක්ද?

  උපක ආජීවකයා, පස්වග තවුසන් සොයා ගිය ගමනේදී බුදුරජාණන් වහන්සේට අතරමගදී මෙහුව හමුවිය.

- ''බමුණ, දහම් දෙසා ආහාර පිළිගැනීම තමාගේ සිරිත නොවේ'' යයි බුදුරජාණන් වහන්සේ පවසනු ලැබුවේ කිනම් අයෙකුටද?


  මගධ රට, එකනාළ බමුණුගම විසූ, කසී භාරද්වාජ බමුණා හට බුදුරජාණන් වහන්සේ එසේ පැවසීමට යෙදුණි.

- වෙසක් පොහෝ දින සම්මා සම්බුද්ධත්වයට පත් අප බුදුරජාණන් වහන්සේ ඒ බව ලොවට හඬ ගා ප්‍රකාශ කළේ කෙසේද?

  ''ගෙය සාදන තණ්හා නමැති වඩුවා මා විසින් දකින ලදී. මින්පසු මේ ගෙය නැවත නොසාදන්නට ඔබගේ පරාල සියල්ලම මා විසින් බිඳ දමනලදී. තණ්හාව නොවන් ඇලීම නැතිකර මාගේ සිත නිවනට යොමු කළෙමි'' යනුවෙන් ප්‍රකාශ කිරීමට යෙදුණි.

විද්‍යාකීර්ති, අනුර සී. පෙරේරා

''අනුන්ගේ රළු පරළු බසුත් අනුන් කළ නොකළ දේත් නොසෙවිය යුතුය. තමාගේම කළ නොකළ දේ සෙවිය යුතුය.''



## මම ඕන තරම් පින් කරලා තියෙනවා
## මේ කරපු පින් හොඳටෝම ඇති

# මෙහෙම කියපු සමහරුන්ට බුදුරදුන් කියාදුන් පණිවුඩය කුමක්ද?

අප ජීවත් වන ලෝකය තුළ දුන් කළා ඇති යැයි නොසිතිය යුතු දේවල් පිළිබඳ බුදුරජාණන් වහන්සේ දේශනා කොට ඇත. මේ ලෝකයේ සමහර දේවල් එක් වතාවක්, දෙවතාවක්, තෙවතාවක් කර අවසන් නොකළ යුතුය. ඒවා පිළිබඳ බුදුරජාණන් වහන්සේගේ අවධානය යොමු වී ඇත්තේ පින්කම් පිළිබඳ විවරණය වීමේ සමයක. සිත පිළිබඳ විවරණය කර දීමට උපමා, උපමේය වශයෙන් එම කාරණා පැහැදිලි කර දී ඇත. "පින" පිළිබඳ ධම්ම පදයේ පාප වර්ගයේ සඳහන් කර ඇත්තේ,

"පුඤ්ඤං චේ පුරිසෝ කයිරා
කයිරාථේනං පුනප්පුනං
තම්හි ඡන්දං කයිරාථ
සුඛෝ පුඤ්ඤස්ස උච්චයෝ" ආදී වශයෙනි.

ඉදින් යම් පුරුෂයෙක් පිනක් කෙරේ නම් නැවත නැවතත් කරන්නේය. ඒ පිනෙහි ආසාව ඇති කර ගන්නේය. (කුමක් නිසාද යත්) පින් රැස් කිරීමට සැපයට හේතු වන හෙයිනි.)

පින නැවත නැවත කළ යුතු වන්නේ එම පින සත්වයාගේ භව ගමනය වාසනාවන්ත කරන බැවිනුත්, පින් නිසා සත්වයා පවතින බැවිනුත්ය. පුණ්‍ය ශක්තියෙහි අඩු වැඩිතාවය අනුව සැප විපාක ලැබෙන බව බුද්ධ දේශනාවේ සඳහන් වී ඇත. අප සසර කළ පුණ්‍ය ශක්තිය හේතු කොට ගෙන සැප විපාක ලැබෙනු ඇත. එම පුණ්‍ය ශක්තිය අවසන් වූ කල එම ලබන සැප විපාකද අවසන් වනු ඇත. එබැවින් පුණ්‍ය ශක්තිය අඩු වන්නා, අඩු වන්නා තව තවත් පින් කළ යුතුය. ඒ බව ඉහත ධම්ම පදයෙහි සඳහන් ගාථාව තුළින් දේශනා කොට ඇත. පින් කරන අය එය දැන් ඇතැයි සිතා නොසිටිය යුතුය. පින් කරන අය එය නැවත නැවත කළ යුතු වන්නේය. එයට හේතුව පින් රැස් කිරීම සැප විපාක ලබා ගැනීමට හේතු වන බැවිනි. අද සමාජය දෙස සැලකිල්ලෙන් බැලීමේදී මනාව පෙනෙන දෙයක් ඇති බව පෙනෙන්, සමහරු පොහොසත්, සමහරු දුප්පත්, සමහරු රූමත්, සමහරු විරූපීයත්, සමහරු කුලවත්, සමහරු කුල හීනවත්, මේ ආදී වශයෙන් පින්වල අඩු වැඩිවීමය අනුව සැප විපාකද අඩු වැඩි වශයෙන් ලැබේ. මිනිස් සමාජය තුළ සමහරක් දෙනා අගනා ආහාරපාන, ඇඳුම් පැළඳුම්, මැණික් ගල්, ගෙවල් දොරවල් ආදී අනේකවිධ අංගෝපාංගයන්ගෙන් කිසිදු අඩුවක් නොමැතිව ඒවා භුක්ති විඳියි. විශාල වශයෙන් සුඛෝපභෝගී ගෙවල් දොරවල් ඇතිව, අතට පයට වැඩකාරයන්ද ඇතිව සමාජයේ සමහර දෙනෙක් ජීවත් වෙති. සමහරු මධ්‍යස්ථව එදිනෙදා ජීවිතය සාමාන්‍ය විදියට පවත්වා ගෙන යති. සමහර දෙනෙක් ඉතුරුකට ජීවත් වන ආහාරයන්ද දුක ගත හැකිය. සමහර දෙනෙක් එදිනෙදා ජීවිතය ගැට ගසා ගන්නේ බොහෝම අමාරුවෙනි. තවත් පිරිසක් බත් නැතුවම, පාරක තොටක හරිහැටි රැගෙන අනුන්ගෙන් යමක් කමක් ඉල්ලා පණ තබා ගැට ගසා ගනිමින් සිටියි.

මෙම විෂමතාවය මුළු ලෝකය තුළම දක ගත හැකි සුලභ දෙයකි. එසේ නම් පුණ්‍ය ශක්තිය මෙතරම් බලවත්ද යන්න ඉන් පැහැදිලි වේ. සමාජ ව්‍යවහාරයේද ඒ අනුව ගොඩනැගී ඇත. එනම් "පුණ්‍යවන්තයෙක් පින් කරලා ඉපදුණොත් එහෙම තමා" ආදී ව්‍යවහාරයන් භාවිත වන්නේද පිනෙහි ඇති ශක්තියයි. "මීන අම්මෙයි තරම්කටත් සැතීම" ආදී වශයෙන් කියවන්නේද එම හේතුව මතයි. ධම්ම පදයෙහි සඳහන් අප්පමාද වර්ගය තුළින් සඳහන් වන්නේ පුණ්‍ය ශක්තිය තුළ ඇති වටිනාකමයි. එනම්,

"මෝඩයා මට දරුවෝ ඇත. මට ධනය ඇත කියා සිතමින් උද්දාම වෙයි. තමාට තමනුත් නැති කල කුමන දරුවෝද? කුමන ධනයද?"

"ඉධ නන්දති පෙච්ච නන්දති
කත පුඤ්ඤෝ උභයත්ථ නන්දති
පුඤ්ඤං මේ කතන්ති නන්දති
භීය්‍යො නන්දති සුග්ගතිං ගතො"

පින් කළ පුද්ගලයා මෙලොවදීත් ප්‍රීතියට පත් වේ. පරලොවදීත් ප්‍රීතියට පත් වේ. දෙලොවදීම ප්‍රීතියට පත් වේ. මා විසින් පින් කරන ලදැයි සිතා මෙලොව ප්‍රීතියට පත් වේ. පරලොවදී සුගතියට ගොස් විපාක විඳ වඩාත් ප්‍රීතියට පත්වේ.

පුණ්‍ය නමැති ශක්තිය එක වෙලාවකට, එක දිනකට, කාලයකට සීමා නොවන දෙයක් බව බුදුරජාණන් වහන්සේ පැහැදිලිව දේශනා කොට ඇත. වතාවක් දෙවතාවක් කර දුන් පින් කළා ඇතැයි නොසිතිය යුතුය. "චින්තං පුනප්පුනං පුඤ්ඤං" යනුවෙන් සිත සිතා යළි යළි පින් කළ යුතු වේ. එහිදී තම අධ්‍යාත්මය තුළ ඇතිවන අභ්‍යන්තර පිරිසුදු සිතුවිලි ඉතා වැදගත්ය. විශේෂයෙන් ඒවා කායිකව ක්‍රියාවක් ලෙස නොව සිත එක සිය උතුම් ක්‍රියාවන් සමග බැඳී පවතී. ඒවා පින්කම් වශයෙන් හැඳින්වීම සාධාරණය. ඒ අනුව පලකා බැලීමේදී දන් දීම පුරවන තැනක් ගනී. දානය නමැති වචනය ඇති තැනකම පුණ්‍යචේතනාව යොදා තිබීමෙන්ම ඒ බව පැහැදිලි වේ. දාන පාරමිතා, දාන පුණ්‍ය ක්‍රියා, සතර සංග්‍රහ වස්තු, පිංපුණ්‍ය ක්‍රියා ආදී සෑම තැනකම දානය මුලට යොදා ඇත. එයට හේතුව බුද්ධත්වය උදෙසාද පළමුව සම්පූර්ණ කළ යුත්තේ එම පාරමිතාව බැවිනි. සත්වයාට සැප විපාක ලබා දෙන්නේද එම උතුම් ක්‍රියාව හා බැඳීම තුළිනි. එබැවින් දානය නම් වූ පුණ්‍ය ක්‍රියාව වරක් දෙවිතාවක් කර දුන් ඇතැයි නොසිතිය යුතුය.

ඒ බවට හොඳම උදාහරණයක් ලෙස බ්‍රාහ්මණ සංයුත්තයේ උදය සූත්‍රය තුළින් පැහැදිලි වේ. එම සූත්‍රය විමසා බැලීමෙන් එම කරුණ වඩාත් අවබෝධ වනු ඇත. එම සූත්‍රයේ නිධානය ගත් කළ මෙසේ සඳහන් කළ හැකිය.

බුදුරජාණන් වහන්සේ උදය බමුණාට අනුකම්පා පිණිස දින තුනක්ම බමුණගේ නිවසට පිණ්ඩපාතයේ වැඩි සේක. එම දින තුනෙහිදීම උදය බමුණා බත්වලින් පාත්‍රය පුරවාලීය. තුන්වන දිනයෙහි උදය බමුණා බුදුරජාණන් වහන්සේගේ පාත්‍රය බතින් පුරවා මෙසේ කීය.

"පකට්ඨකෝයං සමණෝ ගොතමෝ පුනප්පුනං ආගච්ඡතීති"

රසයෙහි ගිජු වූ මේ ශ්‍රමණ ගෞතමයෝ නැවත නැවත එති යනුවෙනි.

බුදුරජාණන් වහන්සේටද අවශ්‍ය වූයේ උදය බමුණාගෙන්ම එම වචනය ප්‍රකාශ කරවා ගැනීමටය. ඒ නිසාම බුදුරජාණන් වහන්සේ වතාවකින් දෙවතාවකින් නතර නොවී තුන් වතාවක්ම පිණ්ඩපාතයෙහි වැඩියහ. තුන්වෙනි වතාවේදී උදය බමුණා පිණ්ඩපාතය පූජා කොට කළ එම ප්‍රකාශය ඉතා වැදගත් එකකි. එයට හේතුව උදය බමුණාගේ ශ්‍රද්ධාවේ ප්‍රමාණය එයින් ප්‍රකට කිරීමක් සිදුවීමය.

එම ප්‍රකාශයෙන් පසු බුදුරජාණන් වහන්සේ උදය බමුණාට දේශනා කළ ධර්මය ඉතා වැදගත්ය. එම ධර්මය ගාථා කිහිපයකින් දේශනා කොට ඇත. එම ගාථා කිහිපය පිළිවෙලින් විමසා බැලීම තුළින්, පුණ්‍ය ක්‍රියා නැවත නැවත කළ යුතු බවත් වතාවක්, දෙවතාවක් කර නොනැවැත්විය යුතු බවත් පැහැදිලි වේ.

"පුනප්පුනං චේව වපන්ති බීජං
පුනප්පුනං වස්සති දේවරාජා
පුනප්පුනං ඛෙත්තං කසන්ති කස්සකා
පුනප්පුනං ධඤ්ඤමුපේති රට්ඨං"

(ගොවීයෝ නැවත නැවත බීජ වපුරති. වැස්ස නැවත නැවත වසී. ගොවීයෝ නැවත නැවත බිම් සාති. නැවත නැවත රටට ධාන්‍ය ලැබේ.)

"පුනප්පුනං යාචකා යාචයන්ති
පුනප්පුනං දානපතී දදන්ති
පුනප්පුනං දානපතී දදිත්වා
පුනප්පුනං සග්ගමුපෙන්ති ඨානං"

(නැවත නැවත යාචකයෝ ඉල්ලති. නැවත නැවත දානපතියෝ දන් දෙති. නැවත නැවත දානපතියෝ දන් දී නැවත නැවත සුගතියට යති.)

"පුනප්පුනං ඛීරනිකා දුහන්ති
පුනප්පුනං වච්ඡෝ උපෙති මාතරං
පුනප්පුනං කිලමති ඵන්දති ච
පුනප්පුනං ගබ්භමුපෙති මන්දෝ"

(කිරි දොවන්නෝ නැවත නැවත දොවති. වස්සා නැවත නැවත මව වෙත එළඹෙයි. මේ ආකාරයෙන් සත්වයෝ නැවත නැවත වෙහෙස ලබති. කම්පා වෙති. බාලයෝ නැවත නැවත මව් කුසට පැමිණෙති.)

"පුනප්පුනං ජායති මීයති ච
පුනප්පුනං සිවථිකං හරන්ති
මග්ගඤ්ච ලද්ධා අපුනබ්භවාය
න පුනප්පුනං ජායති භූරිපඤ්ඤො"

(නැවත නැවත උපදියි. නැවත නැවත මිය යයි. නැවත නැවත සොහොනට ගෙන යති. නිවන් ලැබූ නුවණැත්තා නැවත නැවත නූපදී.)

මෙම දේශනය ඇසීමෙන් පසු උදය බමුණා බුදුරජාණන් වහන්සේට මෙසේ පැවසීය.

"භගවත් ගෞතමයන් වහන්ස, යම් සේ යටිකුරු වූ දෙයක් උඩුකුරු කරන්නේද, වැසුණු දෙයක් විවෘත කරන්නේද, මංමුළා වූවෙකුට මග කියා දෙන්නේද, ඇස් ඇත්තෝ රූප දකිත්වායි අඳුරෙහි තෙල් පහනක් හෝ දරන්නේ වේද, එසේම භගවත් ගෞතමයන් වහන්සේ විසින් නොයෙක් අයුරින් දහම් දෙසන ලදී. මම බුදුරදුන්ද, ධර්මයද, සංඝයාද සරණ යමි. භවත් ගෞතමයන් වහන්සේ අද පටන් මා දිවි හිමියෙන් තුනුරුවන් සරණ ගිය උපාසකයකු ලෙස සලකත්වා."

ඉහත සූත්‍රය තුළින් බුදුරජාණන් වහන්සේ පැහැදිලි කොට ඇත්තේ දන් දීම ආදී පින්කම් වතාවක් දෙවතාවක් තෙවතාවක් කර නොනැවැත්විය යුතු බවය. එයට හේතුව පුණ්‍ය ශක්තිය ජීවිතයේ සෑම අවස්ථාවකම අවශ්‍ය වන දෙයක් බැවිනි. ඒ බව ඉහත සූත්‍රය තුළින්ද



මනාව බුදුරජාණන් වහන්සේ විග්‍රහ කර ඇත. උදය බමුණා දෙවරට නැවැත්වූ තැනදී බුදුරජාණන් වහන්සේ උපමා උපමේය සහිතව තරමින් එම දේශනය කළහ.


බාලයා නැවත නැවත මව් කුසට වන අතර ප්‍රඥාවන්තයා පින් දහම් කොට සසර ස්වභාවය අවබෝධ කරගෙන සසරින් මිදීමට උත්සාහවත් වනු ඇත. පින්වල අඩුපාඩු නිසා අපට නොයෙක් ප්‍රශ්න ගැටලුවලට මුහුණ දීමට සිදුවේ. ඒ නිසා පින් කළ යුතුය. එයට ප්‍රමාණයක් නැත. නොයෙක පුණු අතර නැවත නැවත එය කළ යුතුය. තමන්ට අවස්ථාවක් උදාවන සෑම අවස්ථාවකම දන්දීම ආදී පින්කම් කළ යුතුය. එසේ සිත පිරිසිදු කොට ගෙන විලසක්, පහනක් හෝ බත් සරුවක් හෝ දන්දීම ඉතා වැදගත් වේ. තම තමන්ගේ ප්‍රමාණයට අනුව දන් දී මෙලොව ජීවිතය ආයු, වර්ණ, සැප, බල ප්‍රදානයෙන් ආරක්ෂා පරලොව සා පිපාසාදී දුකකට පත් නොවී, නැ මැ කියන වචන අසන්නට නොලැබී නරක, තිරිසන්, ප්‍රේත, අසුරාදී සතර අපායකට නොවැටී උතුම් මනුෂ්‍ය සැප සම්පත්, දිව්‍ය සැප සම්පත් කෙළවර උතුම් නිවන් සුවය ලබා ගැනීමට් ප්‍රාර්ථනා කර ගනිමින් ඒ සඳහා අප සැම දෙනාම උත්සාහ විය යුතුය.


[illegible] ශ්‍රී සාරානන්ද පිරිවෙණේ
ආචාර්ය ගලගෙදර රතනවංශ හිමි


"යමක් කොට පසුතැවෙන්නට වේද යමක විපාකය කඳුළු පිරි මුහුණෙන් යුක්තව හඬමින් විඳින්නට සිදුවේ."

## නොපෙනෙන ලෝකය

# නින්දා අපහාස කිරීමත් බලවත් අකුසලයක්



බුදුන් දවස සෘද්ධි ප්‍රාතිහාර්යයන් පාන්නන් අතරින් අග තැනට පත් මුගලන් මහරහතන් වහන්සේ උන්වහන්සේගේ සතු සෘද්ධි ප්‍රාතිහාර බලයෙන් අපායට ගොස් අපායේදී අනේකවිධ දුක් විඳිනා, මද වේදනා විඳිනා මිනිසුන් දක ඒ මිනිසුන් එලෙස විපාක විඳීමට හේතු කවරේද යන්නද, දිව්‍ය ලෝකයේ දිව්‍ය සැප සම්පත් විඳීමට කළ කුසලකර්ම කවරේද යන්න අසා එම සියලු කරුණු මිනිස් ලෝකයට වැඩම කර දේශනා කළ සේක.

දිනක් මුගලන් මහරහතන් වහන්සේ එලෙස සෘද්ධි ප්‍රාතිහාර්යයෙන් තොරතුරු සෙවීමේදී පන්සල් භූමියක ඇති වැසිකිළියක එක් ප්‍රේතයෙක් වැසිකිළි වළෙහි අපද්‍රව්‍ය ආහාරයට ගනිමින් ජීවිතයේ අනන්ත අප්‍රමාණව දුක් විඳිමින්, වේදනා විඳිමින් පසුතැවිල්ලෙන් ජීවත් වෙන බව දුටුහ.

එම ප්‍රේතයා දුටු මුගලන් මහරහතන් වහන්සේ ඔහුගෙන් විමසා සිටිනවා ඔබ මෙසේ වන්නට හේතු කවරේද යන්න. එවිට ඔහු මෙලෙස පිළිතුරු දෙනවා.

“මුගලන් හාමුදුරුවනේ, මම පෙර ආත්මයේ ධනය හොඳට තිබුණු හොඳ ජීවිතයක් ගත කළ කෙනෙකි. මම බොහෝ පින්දහම් පවා කළ අයෙක්. මම බොහෝ ධන සම්පත් තිබෙන අයකු නිසා මම මගේ මූලික ධන පරිත්‍යාගයෙන් හාමුදුරු නමකට විහාරස්ථානයක් පවා සාදවා පූජා කළා. ශාසනයට විහාරස්ථානයක් පූජා කිරීම නිවන් දකින්න හැකි පිනක් බව මා දැන සිටියා.

මා සෑදවූ විහාරස්ථානයේ ප්‍රධාන හිමිගේ කැමැත්ත පරිදි ප්‍රධාන දායකයා බවට පත්වූයේ මම. මා යටතෙහි ඒ අනුව පන්සල පැවතියේ. කාලයත් සමඟ පන්සල ග්‍රාමයේ බෞද්ධයන් අතර ප්‍රසිද්ධියට පත්වූ අතර ටික කාලයකදී නගර දිශාවේම වැඩ සිටි හාමුදුරුවරු නිතර නිතර මෙම විහාරස්ථානයට යන්න එන්න පටන් ගත්තා. පන්සලට කිසියම් භික්ෂුවක් වැඩම කළ විට එම භික්ෂූන්ට සිව්පසයෙන් උපස්ථාන වැඩිවෙනව එනවිට විහාරස්ථානයේ ප්‍රධාන හිමියන් එයට වැඩි කැමැත්තක් දක්වූයේ නැහැ.

අනෙකුත් විහාරස්ථානවලින් තම විහාරස්ථානයට පැමිණි පන්සලට පැමිණෙන සැදැහැවතුනට බණ දහම් කියා දෙන සැදැහැවතුන් අතර ගෞරවයට පාත්‍රවුණු ස්වාමීන් වහන්සේලා කෙරෙහි තරහින් බැඳුණා. එම තරහා පිටකර ගනු ලැබුවේ නොයෙක් මත අන් අයට ප්‍රකාශ කර, උන්වහන්සේගේ සිල්වත්කම පෙන්වා පන්සලට වඩින අනෙක් හාමුදුරුවරු ගුණවත්කමින්, සිල්වත්කමින් තොරයි කියා කියමින් මාගේ සිතත් අවුල් කරපු එක. පසුව විහාරයේ ප්‍රධාන හිමියනුත්, මාත් එක්ව පන්සලේ වැඩ සිටිනා අනෙකුත් ස්වාමීන් වහන්සේලාට නින්දා, අපහාස, අවලාද කියමින් කටකතා පතුරුවනු ලැබුවා. වෙන අය මාර්ගයෙන් කටපිල්වල, පොළවල් වැනි මහජනයා විශාල වශයෙන් රැස්වන ස්ථානවල හිමිවරුන්ගේ නැති වැරදි ප්‍රකාශ කළා.

එපමණක් නොවේ, මාත් එම හිමි සමඟ එක්ව නිතරම දෙස් පරොස් කියන්නට පටන් ගත්තා. මම එලෙස ස්වාමීන් වහන්සේලාට චෝදනා කළත්, ඇත්ත තත්ත්වය කුමක්ද යන්න මම දැනසිටියේ නැහැ. පන්සලේ නායක හිමියන් කිවූ නිසා සොයා බැලීමකින් තොරව මා සිල්වන්ත, ගුණවන්ත හිමිවරුන්ට බොරු චෝදනා එල්ල කළා.

මෙසේ කාලය ගෙවී යද්දී, ටික කලකදී මට නායක හිමියන්වත් එපාවුණා. අවසානයේදී උන්වහන්සේ අපවත් වුණා. කාලයාගේ ඇවෑමෙන් මමත් මියගියා. දනට මාත්, පෙර භවයේදී විහාරස්ථානයේ සිටි ප්‍රධාන හිමියනුත් සිටින්නේ මගේම ධන පරිත්‍යාගයෙන් කරවූ පන්සලේ ඇති වැසිකිළි වළේ. ගුථඛාදක ප්‍රේතයන් ලෙස ඉපිද දනට වසර ගණනාවක් තිස්සේ එදා කළා වූ පාපයට අනේකවිධ දුක් විඳිනු ලබනවා.

එය කොයිතරම් බරපතළ වරදක්ද කිව්වොත් අද මා අනුභව කරන්නේ මිනිසුන්ගේ ශරීරයෙන් බාහිරවූවක ද්‍රව්‍ය ලෙස බැහැර වෙන මළ සහ මූත්‍රා. විහාරස්ථානයේ වැඩ සිටිමින් අන් අයට අවලාද කළ, අපහාස කළ නායක හිමියන්ගේ කට උඩ තමයි අද මා වාඩි වී සිටින්නේ. මිනිසුන්ගේ අපවිත්‍ර දේ මා අනුභව කරන අතර, මා විසින් බැහැර කරන මළ මූත්‍රයි, පෙර ආත්මයේදී හැම්දී වී සිටිය හිමිනම අනුභව කරන්නේ. අද වෙන විට අපි දෙන්නම අන් අයට නින්ද, අපහාස කිරීමේ විපාක ප්‍රේත ආත්මයක ඉපිද වසර දහස් ගණනක් දුක් විඳිමින් කාලය ගත කරනවා.

මම අද මේ ලෙස ගුථඛාදක ප්‍රේතයෙකුව ඉපිද දුක් විඳින්නේ සිල්වන්ත, ගුණවන්ත ස්වාමීන් වහන්සේලාට ඔවුන් තුළ නැති වැරදි පෙන්වා ඔවුන්ව සමාජයෙන් කොන් කිරීමට සැලසීම, බොරු චෝදනා කිරීම සහ බොරු අපහාස කිරීමේ විපාකයක් ලෙසට.

මෙම කතාවෙන් අපට එක් කරුණක් මනාව වටහා ගත හැකි වෙනවා. එය නම් නොමනා ක්‍රියා කරන්නවුන් ඔවුන් කළ නොමනා ක්‍රියා නිසා අනන්ත සංසාරය පුරාවටම දුක් වේදනාවන්ට ලක්වෙන බව.

**පූජ්‍ය පාතේගම ඤාණිස්සර හිමි**



# බුදු දහමේ සඳහන් කල්ප විනාශය යනු කුමක් ද?

කල්ප යනු කාලපරිච්ඡේදයන්ට නාමෙකි. එහි විභාග දක්වා ඇත්තේ මෙසේය. අන්තඃ කල්පය, අසංඛ්‍ය කල්පය, මහා කල්පයයි. කල්පය තුන් ආකාර වේ.

මේ මිනිස් ලොව මිනිසුන්ගේ ආයුෂය සෑම කල්හි එකම ප්‍රමාණයකට නොපවතී. කලින් කල අඩු වැඩි වේ. මේ මිනිසුන් අතර පාප ධර්මයන් වැඩි වීමෙන් ආයුෂ පිරිහී දස අවුරුද්ද පරමායුෂය වන කාලයක් පැමිණේ. ඒ පිරිහීම නිසා සංවේගයට පත් මනුෂ්‍යයෝ පව්කම් අතහැර කුශල ක්‍රියාවන්හි යෙදෙන්නට පටන් ගනිති. එයින් ඔවුන්ගේ ආයුෂය පරම්පරාවෙන් පරම්පරාවට ක්‍රමයෙන් වැඩේ. අන්තිමට වයස වර්ෂ අසංඛ්‍යය දක්වා වැඩී අසංඛ්‍ය වර්ෂායුෂ ඇති මනුෂ්‍යයන් සිටින කාලයක් ඇතිවේ. ඒ කාලයේදී මනුෂ්‍යයෝ නැවත පව්කමට බසිති. එයින් ඔවුන්ගේ ආයුෂය නැවත පරම්පරාවෙන් පරම්පරාවට මඳින් මඳ පිරිහී දශ වර්ෂය පරමායුෂය වන කාලය පැමිණේ. මෙසේ මිනිසාගේ වයස දස අවුරුද්දේ පටන් අසංඛ්‍යය දක්වා වැඩී නැවත පිරිහී දස අවුරුදු වයසට පැමිණීමට ගත වන අති දීර්ඝ කාලය අන්තඃකල්ප නම් වේ. එය මේ මහා පොළව එක් යොදුන් තුන් ගව්වක් වැඩීමට ගත වන කාලය යයි කියනු ලැබේ.

සංවර්තය, සංවර්තස්ථායිය, විවර්තය, විවර්තස්ථායිය යයි අසංඛ්‍ය කල්ප සතරකි. සාගර ගංගා පර්වත සහිත වූ මේ ලෝකය සදාකාලිකව පවතින්නක් නොව කලින් කල විනාශ වන්නකි. ලෝක විනාශය, ගින්න, දිය, සුළඟ යන තුනෙන් සිදුවේ. මේ මහා ලෝකයේ විනාශයද සුළු කලකින් සිදුවන්නක් නොවේ. එයට අති දීර්ඝ කාලයක් ගතවේ. වරක් ලෝකය විනාශ වීමට ගත වන අතිදීර්ඝ කාලය සංවර්ත කල්ප නම් වේ.

ලෝකය විනාශ වීමෙන් පසු ලෝකයක් නැති ආකාශය පමණක් ඇති හිස් කාලය සංවර්තස්ථායි කල්ප නම් වේ. එයද විනාශ වීමට ගතවූ කාලය පමණ දිගය.

දීර්ඝ කාලයකින් පසු නැවත ලෝකය සෑදීම ආරම්භ වේ. ලෝකය සෑදීම අවසන් වීමට ගත වන කාලය විවර්ත කල්ප නම් වේ. එයද හිස්ව පැවති කාලය පමණ දිගු කාලයකි.



සෑදුණා වූ ලෝකය එසේ පවත්නා කාලය විවර්තස්ථායි කල්ප නම් වේ. එයද හිස්ව පැවති කාලයට සමාන කාලයකි. මේ එක් එක් අසංඛ්‍ය කල්පයක ප්‍රමාණය අන්තඃකල්ප විස්සක් පමණ යයිද සිව් සැටක් පමණ යයිද කියා තිබේ.


අසංඛ්‍ය කල්ප සතරක් මහා කල්ප නම් වේ. බුදුවරුන් ලොව පහළ වීම දක්වා ඇත්තේ මහා කල්ප ගණනිනි.

ශූන්‍ය කල්පය, සාර කල්පය, මණ්ඩ කල්පය, වර කල්පය, සාරමණ්ඩ කල්පය, භද්‍ර කල්පය යි කල්පය සවැදෑරුම් වේ. බුදුවරුන් පහළ නොවන කල්පය ශූන්‍ය කල්ප නම් වේ. එක් බුදුවරයකු පහළ වන කල්පය සාර කල්ප නම් වේ. බුදුවරුන් දෙනමක් පහළ වන කල්පය සාර කල්ප නම් වේ. බුදුවරුන් තිදෙනමක් පහළ වන කල්පය මණ්ඩ කල්ප නම් වේ. බුදුවරුන් තෙනමක් පහළ වන කල්පය වර කල්ප නම් වේ. බුදුවරුන් සතර නමක් පහළ වන කල්පය සාරමණ්ඩ කල්ප නම් වේ. බුදුවරුන් පස් නමක් පහළ වන කල්පය භද්‍ර කල්ප නම් වේ. මේ කල්පයෙහි කකුසන්ධ, කෝණාගමන, කාශ්‍යප, ගෞතම යන බුදුවරයන් වහන්සේලා සතර නම පහළ වූහ. මතුද මෛත්‍රෙය නමින් බුදු කෙනෙකු පහළ වන්නාහ. එබැවින් මේ කපට භද්‍ර කල්පය යි කියනු ලැබේ.


ගංටිපත

"තමාට පිහිට තමාමය. වෙන කවරෙක් තමාට පිහිට වේද? තමා මනාව දැමුණු කල දුර්ලභ වූ පිහිටක් ලබන්නේය."

# නිවනට මග හෙළි කරන සීලයෙහි මනාව පිහිටමු




## ධර්ම දේශනය



දේශනාකරණ - විනයාචාර්ය අභිධර්ම [illegible]
[illegible]
[illegible]
මහනුවර වංශික [illegible]
අස්ගිරි මහා විහාරීය [illegible]
කාරක සංඝ සභික [illegible]
**පූජ්‍ය වේඩරුවේ ශ්‍රී උපාලි**
ශ්‍රී දළදා මාළිගාවේ [illegible] නායක ස්වාමීන්ද්‍රයන්
වහන්සේ

වාසනාවන්ත පින්වත්නි,

"සබ්බදා සීල සම්පන්නො පඤ්ඤවා සුසමාහිතො
අරබ්ධ විරියෝ පහිතත්තෝ ඔඝංතරති දුත්තරං"

අද ඉල් පුන් පොහෝ දිනයයි. මතු බුදුවීමට පෙරුම්දම් පුරමින් සිටින මෛත්‍රී බෝසතාණෝ, ගෞතම බුදුරජාණන් වහන්සේ වෙතින් නියත විවරණ ලද්දේ ඉල් පුන් පොහොය දිනක. බුද්ධ ශාසනයේ ප්‍රථම ධර්මදූත පිරිස ධර්ම ප්‍රචාරය සඳහා ගමන් ඇරඹීම සිදුවන්නේ ද අද වැනි පොහෝ දිනක. මේ පුන් පොහෝ දා තවත් වැදගත් සිදුවීමක් වශයෙන් සඳහන් කළ යුතු වන්නේ නේරංජනා නදී තීරයේ විසූ උරුවේල කාශ්‍යප, නදී කාශ්‍යප, ගයා කාශ්‍යප යන ජටිල තාපසයන් තුන්දෙනා දමනය කොට බුදු සසුනෙහි පැවිදි කිරීමට පත්කරවීමයි. අග්‍රශ්‍රාවක සැරියුත් මහරහතන් වහන්සේ පිරිනිවන් පා වදාළේ ද අද වැනි පුන් පොහොය දිනකදීය. තවද චීවර මාසයේ අන්තිම පොහොය වීම ද කඨිනාස්තරණ විනය කර්මය කළ හැකි අවසාන දිනය වීම ද ඉල් පුන් පොහොය දිනට අයත් සිදුවීම් වෙයි.

"සියල්ලෝ දඬුවමට තැති ගනිත්. සියල්ලෝ මරණයට බිය වෙත්. ඒ නිසා තමා උපමා කොට සිතා අනුන් නොනැසිය යුතුය. නොනැස්විය යුතුය."

අද දින මා විසින් සිත්වන් සිත වෙත සඳහා දෙනු ලබන්නේ පුද්ගලයාගේ සීලසම්පන්න බව, බෞද්ධයාගේ පරම අරමුණ වන නිර්වාණය සඳහා බෞතාවින් ඉවහල් වන බවයි. සංයුක්ත නිකායේ චන්ද සූත්‍රයේ එන මෙම ගාථාවෙන් නිර්වාණාවබෝධය සඳහා ගෙනුවන කරුණු කිහිපයක් පෙන්වාදෙන අතර එම කරුණු දම්වැලක පුරුක් මෙන් එකට සම්බන්ධව පවතී. මෙහි එන "සබ්බදා සීල සම්පන්නො" යන කාරණය පිළිබඳව බෞද්ධයන් වශයෙන් අප දැනුවත් විය යුතුමය.

අප සැමදා සිල්වත් විය යුතුමය. සීලය යනු කුමක් ද? සීලය නම් චේතනාවයි. ශික්ෂණය යන වචනයෙන් අදහස් කරන්නේ ද සීලයයි. හැදීවැඩීම යනු ද සීලයයි. ආචාර සමාචාර බලෙන් යුක්ත වීමම සීලයයි. සීලය තුළ ඇත්තේ සංසුන් බවයි. සිසිල් බවයි. සංවර බවයි. හද බවක්, වෛරයක්, ක්‍රෝධයක්, ඊර්ෂ්‍යාවක් සීලය තුළ නැත.

මෛත්‍රිය, කරුණාව, මුදිතාව, උපේක්ෂාව යන සතර බ්‍රහ්මවිහරණය සීලය හා සම්බන්ධව පවතී. බුදුසමයේ සීලය කොටස් හතරකින් යුක්තය. 1. ප්‍රාතිමෝක්ෂ සංවර සීලය. 2. ඉන්ද්‍රිය සංවර සීලය. 3. ආජීවපාරිශුද්ධි සීලය. 4. ප්‍රත්‍ය සන්නිශ්‍රිත සීලය, යනුවෙනි.

මෙහි මුල්ම සීලය වන ප්‍රාතිමෝක්ෂ සංවර සීලයෙන් භික්ෂූන්වහන්සේලාගේ හා භික්ෂුණීන්වහන්සේලාගේ ශික්ෂාකාමී බව ඉස්මතු කරයි. බුද්ධරාජාණන්වහන්සේ භික්ෂු - භික්ෂුණී දෙපිරිසගේ ශික්ෂාකාමී බව ප්‍රධාන වශයෙන් බලාපොරොත්තු වූ සේක. මෙම දෙපිරිස ගිහිගෙය හැර දමා උතුම් නිවනම අරමුණු කරගෙන කටයුතු කරන පිරිසක් බැවින් ඒ පිරිසම අරමුණු කරගෙන ප්‍රාතිමෝක්ෂ සංවර සීලය පෙන්වා දී ඇත.

ඇස, කන, නාසය, දිව, කය යන මේ පංච ඉන්ද්‍රියන්ගේ සන්සුන් බව ඉන්ද්‍රිය සංවර සීලය මගින් අදහස් කෙරේ. අද බොහෝ විට මෙම පසිඳුරන් සම්බන්ධව සංවර බව නොමැතිකමින් විවිධ වැරදි සඳහා මිනිසා පෙළඹී සිටී.

ආජීව පාරිශුද්ධ සීලය යනුවෙන් අදහස් කර ඇත්තේ ජීවත්වීම සඳහා පිළිපැදිය යුතු ආර්ථික පිළිවෙතකි. වැරදි වෙළෙඳාමෙන් තොරව ධාර්මිකව හොයාගත් වස්තුව මිනිසා ජීවත්වීම සඳහා යොදාගැනීමෙන් පිරිසිදු බව ඇතිවේ. බුද්ධරාජාණන්වහන්සේ සිඟාලෝවාද සූත්‍රයේ දී විශේෂයෙන්ම පුද්ගලයෙකු විසින් සතුන් වෙළෙඳාම, අවිආයුධ වෙළෙඳාම, මස් වෙළෙඳාම, මත්ද්‍රව්‍ය වෙළෙඳාම, විෂ වර්ග වෙළෙඳාම නොකළයුතු බව් හැටියට පෙන්වා දී ඇත. යම් කෙනෙකුන් පුද්ගලයෙකු මෙම අධාර්මික වෙළෙඳාම් තුළින් තම ආර්ථික තත්ත්වය ගොඩනගාගෙන ඇත්නම් ඔහුට ධනය තිබුණ ද මානසික සහනයක් නොලැබෙනු නියතය. බිය සැක ගැන්ම සැකය එම පුද්ගලයා තුළ නිතර පවතී. එවිට ඔහු ධනය ඇතත් අසහනකාරී ජීවිතයක් ගතකරයි. ආජීව පාරිශුද්ධ සීලයක් ඔහු තුළ නොපවතී.

ප්‍රත්‍ය සන්නිශ්‍රිත සීලය යන්නෙන් අදහස් කරන්නේ සිව්පසය පරිභෝජනය පිළිබඳ සීලයයි. භික්ෂූන්ට පැවිද්දට සිව්පසය යනු චීවරය, පිණ්ඩපාතය, සේනාසනය, ගිලන්පසය. ගිහියාගේ සිව්පසය යනුවෙන් ඇඳුම් ආහාර, නිවාස, බෙහෙත් හඳුන්වාදිය හැකිය. මෙහිදී ඇඳුම්, ආහාර, නිවාස, වෛද්‍ය පහසුකම් ආදිය සම්බන්ධව සැලකිලිමත් කටයුතු කිරීම ප්‍රත්‍ය සන්නිශ්‍රිත සීලය ලෙස හැඳින්විය හැකිය. අද බොහෝ දෙනෙකු සිව්පසය සම්බන්ධව සැලකිල්ලක් නොදී කටයුතු කිරීමක් නිසා ලෙඩරෝග ආගොවන් මත්දේ පසුබැද ගෙනත් දැඩි වෙහෙසකට පත්ව සිටිති. කායික මානසික වශයෙන් සංවර බවක් නොමැතිනම් නිසාම නොයෙකුත් රෝග බෝවයනට ලක්ව සිටිති. මෙසේ අසීමිත ආශාවන්ගෙන් තොරව දැඩි සේ ප්‍රත්‍යයෙහි නොඇලී එහි සංවර බවක් ඇතිකර ගැනීම ප්‍රත්‍ය සන්නිශ්‍රිත සීලය නම් වේයි.

පරිපිරිසිදු සීලය නමින් හැඳින්වෙන මෙහි ගිහි පක්ෂයටත් පැවිදි පක්ෂයටත් පොදු සීල ඇතැති. ප්‍රාතිමෝක්ෂ සංවර සීලය පමණක් පැවිදි පක්ෂයට සීමා වේ. සීලය ප්‍රභේද වශයෙන් කොටස් කිහිපයකි.

1. පංච සීලය, 2. අෂ්ටාංග සීලය, 3. ආජීව අෂ්ටමක සීලය, 4. දස සීලය, 5. සාමණේර සීලය, 6 උපසම්පදා සීලය, 7. අභිසමාචාරික සීලය, 8. ආදිබ්‍රහ්මචරිය සීලය යනුවෙනි.

ගිහියාගේ නිත්‍ය සීලය පන්සිල්ය යනුවෙන් හැඳින්වේ. මෙය නොහැඳින්නා කෙනෙක් නැත. මෙය අප නිතර සමාදන් වේ. මෙය නිතර සමාදන් වීමෙහි වඩා වැදගත් වන්නේ ආරක්ෂා කිරීමයි. ශික්ෂාපද පහ සමාදන්වී එය පිළිපැදීමට උත්සුක විය යුතුය. යමෙකු මෙම ශික්ෂාපද පහ ආරක්ෂා කරන්නේනම් නම් ඔහු මානව සදාචාරයේ ඉදිරියට ගිය උසස් පුද්ගලයෙකු ලෙස හඳුන්වාදිය හැකිය. ශික්ෂාපද පහ ආරක්ෂා කරන පුද්ගලයාට පෞද්ගලික වශයෙන් හෝ සමාජමය වශයෙන් කිසිම ගැටලුවක් ඇති නොවන්නේය. සදාචාර සම්පන්න උසස් පුද්ගලයෙකු බවට ඔහු පත්වන්නේය.

ජීවත්වීමේ අයිතිය සතා අනුර සැම සත්වයෙකුටම ඇති අයිතියක් බව බුද්ධරාජාණන්වහන්සේ විසින් පෙන්වා දී ඇත. මෙය බුද්ධ කාලීන බොහෝ ශ්‍රමණ සම්ප්‍රදායන් විසින් ද පිළිගත් කරුණකි. තමන් සන්තක වස්තු ආරක්ෂා කර ගැනීමේ අයිතියක් සැම දෙනෙකුටම ඇත. යමෙක් පස්වනගම් වස්තුන් වැරදි ලෙස පරිහරණය කරන්නේ නම් එය පරිහානියට හේතුවක් ද වන්නේය. සමාජ විශ්වාසය බිඳීයාමට ප්‍රධානතම හේතුවක් වන්නේ බොරුකීමයි. පුද්ගලයා විකෘති පුද්ගලයෙකු බවට පත්වීමට බොහෝ සෙයින් හේතුවන්නේ සුරාපානය කිරීමයි.


යමෙක් පන්සිල් ප්‍රතිපදාව ආරක්ෂා කරන්නේ නම් ඔහු සම්බන්ධව කිසිම ගැටලුවක් ඇති නොවන්නේය. ඒ තුළින් තම පවුල ද සමාජය ද සාමකාමී වන්නේය. ලෝකය ද සාමකාමී වන්නේය. මේ අනුව පන්සිල් සුරැකීම උදාර මිනිසෙකු උදාර සමාජයක් ගොඩනැගීමට හේතු වෙයි.

පොහෝ දිනවල දී අංග අටකින් යුතුව අප සමාදන් වන්නේ අෂ්ටාංග සීලයයි. මෙහි එන ශික්ෂාපද ආරක්ෂා කිරීම සඳහා යම් කැපකිරීමක් කළ යුතුය. අංග දහයකින් යුතුවන්නේ දසසීලයයි. මෙය ආරක්ෂා කිරීමට දැඩි කැපකිරීමක් සිදුකළ යුතුය. උපසම්පදා නොවූ සාමණේර හිමිවරුන් ආරක්ෂා කරනුයේ මෙම දස සීලයයි. මෙම දස සීලයම සාමණේර සීලය යනුවෙන් ද හැඳින්වේ. භික්ෂු ප්‍රාතිමෝක්ෂයෙහි හා භික්ෂුණී ප්‍රාතිමෝක්ෂයෙහි සඳහන් ශික්ෂාපද සමූහය උපසම්පදා සීලයයි. පුද්ගලයා නිවන කරා යාමට සීඝ්‍රව හැකියක් මෙමගින් සිදු කෙරෙයි.

ආදි බ්‍රහ්මචරියක සීලය යනුවෙන් අදහස් කරනුයේ උත්තරීතර හැසිරීමයි. එනම් රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ යන පංචකාමයන්ගෙන් වැළකී සිටීමයි. මෙහි වැදගත්ම අංගය වනුයේ මාර්ග බ්‍රහ්ම චරියාවයි. නිවන් සොයා යන ගමනේ මාර්ගය අනුව විනය කිරීම මාර්ග බ්‍රහ්ම චරියාවයි. නිවනට යාම සඳහා සම්පූර්ණ කළ යුතු සීලය වනුයේ ද ආදි බ්‍රහ්ම චරියා සීලයයි.

නිවන කරා යන ගමනේ දී සීල, සමාධි, ප්‍රඥා යන ත්‍රිශික්ෂා සම්පූර්ණ කළ යුතුමය. එම ත්‍රිශික්ෂාවන්ගේ පළමු අංගය වනුයේ ද සීලයයි. එනම් නිවන් කරා යන ගමනේ පළමු පියවර සීලයයි. සීලය නොගැන, සම්පූර්ණ නොකර, සමාධියටවත්, ප්‍රඥාවටවත් පත්විය නොහැක. අප මේ දක්වා සීලය පිළිබඳව කරුණු සාකච්ඡා කරන ලද්දේ ද එම ප්‍රධාන බව නිසාමය. එනිසා අප බුදුදහමේ පෙන්වාදෙන පරිදි සැමදාම සිල්වත් පුද්ගලයන් වශයෙන් කටයුතු කිරීමට උත්සාහ කළ යුතුය. එසේම එම උත්සාහය, පුරුදුකාවය සංසාරික පුරුදුකාරියක් බවට පත්කර ගැනීමෙන් සීලය දිනෙන් දින වර්ධනය කරගැනීම තුළින් අපගේ පරමාර්ථය අරමුණු වූ නිවන සාක්ෂාවෙන් අවබෝධ කරගැනීමට හැකිවනු ඇත. ඒ බැවින් සිල්වත් පුද්ගලයෙකු වශයෙන් කටයුතු කිරීමට අප උත්සාහ කරමු.

ඔබ සැමට උතුම් වූ දළදා වහන්සේගේ ආශීර්වාදය ලැබේවා.



# රට පුරා පන්සල්වල කඨින පිංකම්

## අරුත් නොම දන ඔබත් පෙරහරේ යන අයෙක්ද?



වැස්ස බලාපොරොත්තු ගොවියාට හෝ ධීවරයාට පමණක් නොවේ. පන්සලේ හාමුදුරුවන්ටද එය බලපායි. වැස්ස නැති විට වැස්ස ඉල්ලා දෙවියන්ට කන්නලව් කරන සිංහලයෝ වැස්ස ඇති විට තවත් විදියක සිරිත් විරිත් අනුගමනය කරති. වැසි සමය හෙවත් 'වස්සාන කාලය' බෞද්ධ ගිහියෙක්, භික්ෂූන් වහන්සේත් එකම දැහැමි පිළිවෙලකින් එක්කරන කාලයයි. කාලය මාසවලට වෙන් කරන්නාක් සෙයින් සෘතුවලටද වෙන් කෙරේ. බටහිර මිනිස්සු අවුරුද්ද සෘතු හතරකට වෙන් කරති. 'ස්ප්‍රිං' (Spring), නම් සෘතුව 'වසන්තය' යනුවෙනුත් 'සමර්' (Summer) නම් සෘතුව 'ග්‍රීෂ්මය' යනුවෙනුත් 'ඔටම්' (Autumn) නම් සෘතුව 'සරත් සෘතුව' යනුවෙනුත් 'වින්ටර්' (Winter) නම් සෘතුව 'හේමන්තය' යනුවෙනුත් දළ වශයෙන් හැඳින්විය හැකිය. ඉන්දියානුවෝ සෘතු සයක් දකිති. 'ග්‍රීෂ්ම', 'මේඝ', 'සරත්', 'හේමන්ත', 'සිසිර' හා 'වසන්ත' යනුවෙනි. ඉන්දියාව පසුබිම්කොට ගත් සස ජාතකය සිංහල කවියට නැගූ 'සසදාවත' කවියා මේ ෂඩ් සෘතු හඳුන්වන්නේ 'ගිම් උතු', 'මේ උතු', යන නම්වලිනි. මේ අතුරින් 'මේ උතු' හෙවත් 'මේඝ සෘතුව' යනු වැසි කාලයයි. 'මේඝය' යනු වර්ෂාවයි. 'වර්ෂා' යන සංස්කෘත පදය පාලි බසෙහි එන්නේ 'වස්සාන' යනුවෙනි. එබැවින් වැසි කාලය 'වස්සාන කාලෝ' යනුවෙන් පාලියෙහි හැඳින්වෙයි. මේ භික්ෂූන් වහන්සේලාගේ 'වස් කාලයයි.' උන්වහන්සේලා මේ කාලයට පන්සලේදී 'වස් වසති.' භික්ෂූන් වහන්සේලාගේ 'වස් කාලය' ආරම්භ වන්නේ ඇසළ පුර පසළොස්වක පෝයෙනි. එය අවසන් වන්නේ වප් පුර පසළොස්වක් පෝයෙනි. නිකිනි හා බිනර මාස මේ අතරට වැටේ. තුන් මාසයක කාලයක් තිස්සේ 'වස් කාලය' පවතියි. වැසි කාලය උදාවන්නේ ඇසළ මසෙහිදී බැවින් දෙවියන්ගෙන් වැසි ඉල්ලා පෙරහර පැවැත්වෙන්නේ ඇසළ මාසයෙහිදීය. මේ පෙරහරවල් හැඳින්වෙන්නේ 'ඇසළ පෙරහර' යනුවෙනි. ලංකාව පුරා පිහිටි දේවාලවල මේ ඇසළ පෙරහරවල් මහත් උත්කර්ෂයෙන් පැවැත්වේ. වස්සාන කාලය එළඹුණු



විට සියලුම භික්ෂූන් වහන්සේලා වස් නොවසති. ඒ සඳහා සුදුසුකම් ලබන්නේ උපසම්පදාව ලත් භික්ෂූන් වහන්සේලා පමණකි. ඇත්ත වශයෙන් භික්ෂූන් වහන්සේ යනු උපසම්පදාව ලත් හාමුදුරුවරුන් සඳහා පමණක් යෙදෙන පදයකි. උපසම්පදාව නොලත් 'සාමණේරයන් වහන්සේලා' වස් නොවසති. 'වස්සාන කාලය' පිළිබඳ චාරිත්‍ර වාරිත්‍ර ආරම්භ වූයේ බුදුන් දවස දඹදිවය. එනම් ක්‍රිස්තු වර්ෂයේ ආරම්භයට අවුරුදු හයසීයකට පමණ උඩදීය. අධික වර්ෂාව නිසා භික්ෂූන් වහන්සේලාට පන්සලෙන් පිට ගොස් පිඬු සිගා වැඩීම දුෂ්කර විය. එබැවින් මේ කාලය තුළදී පන්සලෙහිම නැවතී ආගමික කටයුතු කෙරෙහි අවධානය යොමු කිරීම මැනවැයි බුදුන් වහන්සේ නියම කළහ. වස් කාලය තුළදී භික්ෂූන් වහන්සේලා පන්සලෙන් පිටතට නොයිය හෙයින් උන්වහන්සේලාට අවශ්‍ය ආහාරපාන පන්සලටම ගෙනැවිත් දීමේ වගකීම දායක කාරකාදීන්ට පැවරිණ. එබැවින් මේ කාලය තුළදී පන්සලත් ගමත් අතර සම්බන්ධය බෙහෙවින් වැඩිණ. පන්සලට ගමත් ගමට

''යමෙක් මුලදී පමා වුවත් පසුව නොපමා වේද ඔහු වලාකුළින් නිකුත් වූ සඳක් මෙන් මේ ලෝකය බබුළුවයි.''

පන්සලත් නැතුවම බැරි විය.

සිංහල ගමේ 'වස් කාලය' ආරම්භ වන්නේ ගමේ දායක පිරිස් පන්සලට ගොස් නායක හාමුදුරුවන් හමුවී 'වස් වසන' මෙන් උන්වහන්සේලාට ආරාධනා කිරීමෙනි. මේ 'වස් ආරාධනාව' කෙරෙන්නේ ඇසළ පුරපසළොස්වක් පෝය දා දින කිහිපයකට කලිනි. දානේ අනන්ද සුදු රෙදි කඩක්ද ගත් දායක පිරිසක් පන්සලට යති. මේ රෙද්දට හැඳින්වෙන්නේ 'වැසි සළුව' යන නමිනි. මේ වැසි සළුවත් දානත් අතින් ගත් පන්සලේ නායක හාමුදුරුවන්ට පිළිගන්වා වස් විසන මෙන් ආරාධනා කරති. මේ ආරාධනාව පිළිගන්නා නායක හාමුදුරුවෝ සෙත් පිරිත් කියා වස් අනුශාසනාවක් කරති. එහිදී අවධාරණය කෙරෙන්නේ වස් වැඩීමේ ආනිසංසයි. වස් විසීමෙන් ආනිසංස රැසක් සිද්ධ වෙයි. පළමුවැන්න නම් නැතිනම් තැනින් තැන ඇවිදීමට අවස්ථාවක් භික්ෂූන් වහන්සේට නොලැබීමයි. දෙවැනිනම් වැඩ කටයුතු පන්සලේ පරිපාලනය අඛණ්ඩ නිසා මඟ නාවනා කිරීමට ඇති අවස්ථා බොහෝවිට ඇතිවෙයි. එබැවින් භාවනා කිරීමට පිරිසිමේ අවුරුදු දෙකින් සලකා බලා සම්පූර්ණ ආධ්‍යාත්මික ගුණ වගාව කෙරේ අවධානය යොමු කිරීමට භික්ෂූන් වහන්සේට අවස්ථාවක් සැලසෙන්නේ මේ කාලය තුළදීය. දෙවැන්න පන්සලත් එහි වැඩ සිටි භික්ෂූන් වහන්සේලාත් ගැන සොයා බැලීමට ගමේ දායක කාරකාදීන්ට අවස්ථාවක් ලැබීමයි. ගිහි ගෙයි පවත්නා දහසකුත් එකක් කරදර නිසා පන්සලට එඩවත් භික්ෂූන් වහන්සේලාගේ සුවදුක් විමසා බැලීමටවත් අවස්ථා බොහෝ ගිහියන්ට නොලැබේ. එබැවින් මේ කාලය තුළදී පන්සලට ගොස් භික්ෂූන් වහන්සේගේ හිත දුක් ගැන විමසා බලා කටයුතු කිරීමේ වගකීම ගිහියන්ට පැවරේ. භික්ෂූන් වහන්සේලාට මේ කාලය තුළදී ගිහියන්ට වැඩි වැඩියෙන් අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කරති. වස් කාලයෙහිදී නොයෙකුත් පින්කම් පන්සලෙහි පැවැත්වේ. මේ පින්කම් හැඳින්වෙන්නේ 'වස් පින්කම්' යනුවෙනි. දවස් පතා පැවැත්වෙන බුද්ධ පූජා, බෝධි පූජා, ධර්ම දේශනා ආදියෙන් පන්සල ඒකාලෝක වෙයි. දවස් ගණනාවක් තිස්සේ පැවැත්වෙන පිරිත් පින්කම්ද මේ කාලයෙහිදී බහුලව දක්නට ලැබේ. වස් විසන කාලය තුළදී භික්ෂූන් වහන්සේලා පන්සලෙන් පිටතට යන්නේ අවශ්‍යම කටයුතු සඳහා පමණකි. දුර බැහැරකට ගියහොත් හත් දවසකට කලින් ආපසු පැමිණිය යුතුවේ. එසේ පැමිණීමට බැරි වුවහොත් 'වස් කැඩෙන' බව කියවේ.

වස් කාලුණෙන් වස් කාලය අවසානයේදී පැවැත්වෙන නොයෙකුත් චාරිත්‍ර වාරිත්‍රවලට සහභාගි වීමේ අවස්ථාවද මඟහැරී යයි. එබැවින් පන්සලෙන් පිටතට යන්නේ නම් ඒ ගැන සිහි එළවාගෙන සිටිය යුතු බව අවධාරණය කෙරේ.

මේ අරමුණු ඉටුකර ගනු පිණිස කෙරෙන වස් භාරයක් නම් පන්සලෙන් පිටත් වන්නට කලින් එක්තරා පාලි ගාථාවක් කියා ප්‍රතිඥාවක් දීමයි. මෙහිදී කියවෙන ගාථාව ආරම්භ වන්නේ 'ඉමස්මිං අන්තරායෝ තතාහිස්සාම' යනුවෙනි. මේ ගාථාවෙන් ප්‍රකාශ වන්නේ මෙවැනි අදහසකි.

"ඉදින් මට මේ හත් දවස ඇතුළත යම්කිසි අන්තරාවක්, උවදුරක්, විපත්තියක් හටුගේ නම් හත්වෙනි අරුණ අවසන් වන්නට පෙර මා වස් විසන ආරාමයට ආපසු පැමිණෙන බවට අධිෂ්ඨාන කරගනිමි."

වස් කාලය අවසන් වන්නේ වප් පුර පසළොස්වක් පෝයටය. එහෙත් සියලු වස් පින්කම් එදට අවසන් නොවෙයි. වස් තුන් මසින් පසු මාසය හැඳින්වෙන්නේ 'චීවර මාසය' යන නමිනි. මේ කාලය තුළදී 'කඨින චීවර' නම් සිවුරක් පන්සලට පූජා කෙරෙන හෙයිනි. මේ 'කඨින චීවරය' පිරිනැමෙනු වස් පින්කම 'කඨින පින්කම' නමින් හැඳින්වෙයි. කඨින පින්කම් කාලයට මුළු ගමම මුළු බැතියෙන් ඇළලී යයි. මේ චීවරය කඩ කාප්පුවලින් මිලදී ගන්නා චීවරයක් මෙන් නොවේ. එය මුළු ගමම එකතු වී සකස් කෙරෙන්නෙකි. මේ සිවුර සඳහා අවශ්‍ය සුදු රෙදි ගන්නේ මුළු ගමේම ගෙයක් ගෙයක් පාසා ගොස් 'සම්මාදන් කොට' ගත් මුදලිනි. එය පන්සලට වැඩමවාගෙන යන්නේ උඩද පාන්දරින් පැවැත්වෙන 'කඨින පෙරහැරෙන්ය'. එය පන්සලෙහිදී සිවුරක් සේ මසාදෙන්නේ භික්ෂූන් වහන්සේලා අතිනි. ඊට පසු දුමා සකස් කෙරෙන්නේ ගිහියන් හා දායකයන් දෙපිරිසම එක්වීමෙනි. එය චීවරවලු පසුව මුළු සඟ පරපුරටම පූජා කෙරේ. මෙය එක් භික්ෂූන් වහන්සේ නමකට පැවරීම පන්සලේ භික්ෂූන් වහන්සේලාගේ සම්මුතියෙන් සිද්ධ වන්නකි. බොහෝ විට මෙය සිද්ධ වන්නේ 'පෝය ගේ' හෙවත් 'උපෝසථාගාරය' නම් කුටියක් තුළදීය. මේ සිවුර ලැබූ භික්ෂූන් වහන්සේගේ එය හැඳ විශේෂ ධර්මානුශාසනාවක් පවත්වති. මෙය හැඳින්වෙන්නේ 'කඨිනානිසංස දේශනා' යනුවෙනි. එහිදී අවධාරණය කෙරෙන්නේ 'කඨින චීවරයක්' පූජා කිරීමේ ආනිසංසයි. 'කඨින' යන පදයේ අර්ථය 'බලගතු', 'බලසම්පන්න' යනුයි. මේ සිවුර මුළු ගමම එකතු වී පූජා කෙරෙන්නක් නිසා එයින් ලැබෙන පින බලානුභාව සම්පන්න වෙයි. කඨින චීවරය බලගතු වස්තුවක් වීමට තවත් හේතුවක් තිබේ. එය පූජා කෙරෙන්නේ තනි භික්ෂූන් වහන්සේ නමකට නොව මුළුමහත් සංඝයා වහන්සේලාටම බැවිනි.

කඨින චීවරය දරා සිටින භික්ෂූන් වහන්සේට පැවරෙන වගකීම්ද විශාලය. මේ චීවරය දවස් පසක් හැන්දෑ දිනපතාම අරුණ නැගෙන විට එය තමා ළඟම තිබිය යුතු යැයි සම්මතයකි. මේ අවශ්‍යතාව නිසා තමා කෙරෙහි පැවරී ඇති විශේෂ වගකීම ඒ භික්ෂූන් වහන්සේටද අමතක කළ නොහැකි වෙයි. පන්සලට පූජාකර කරන බඩු භාණ්ඩ පන්සලට ගෙන යෙයි දෙන්නේ 'කඨින පෙරහැරින්ය'. කඨින චීවරය සඳහා වූ රෙද්ද හිසින් දරා හත් දායක මහතෙක් උඩු වියන් යටින් ගමන් කරයි. මල්, කොඩි ආදිය ගත් දරු දැරියෝ, වැඩිහිටියෝත් එහි ගමන් කරති. පන්සලට අවශ්‍ය කොතු, ඉඳල් කොට්ට, මෙට්ට, පට්ටිකම්, සීනි, තේ කොළ, මෙන් ආදියද පන්සලට ලැබෙන්නේ මේ පෙරහැරෙනි.

මේ පෙරහැර පන්සලට පිවිසෙන මොහොතේම පන්සලෙහි පිරිත් කියනු බොහෝ විට ඇසිය හැකිය. පන්සලට අවශ්‍ය සම්භාර භාණ්ඩ එල්ලා තැබීම සඳහා ගසක්ද ඇතැම් පන්සල්වල මඟ මඬුවෙහි ඉදිවෙයි. මෙය හැඳින්වෙන්නේ 'කප්රුක' යනුවෙනි. සිතූ සැතූ හැම දෙයක්ම ලබාදෙන ගසක් දිව්‍ය ලෝකයෙහි ඇතැයි විශ්වාස කරන බෞද්ධයෝ ඒ ගසෙහි අනුරුවක් මෙම පන්සලෙහි ඉදිකරගනිති. වස් විසිය හැක්කේ උපසම්පදාව ලත් භික්ෂූන් වහන්සේට පමණකි. එහෙත් උපසම්පදාව ලත් සියලුම භික්ෂූන් වහන්සේලා අනිවාර්යයෙන්ම වස් විසිය යුතු යැයි නියෝගයක්ද නැත්තේය. එහෙත් වස් විසීම භික්ෂූන් වහන්සේලා අතර පවත්නා ජ්‍යෙෂ්ඨත්වය කෙරෙහි බලපාන සාධකයකි. භික්ෂූන් වහන්සේ නමකගේ වයස මැනෙන්නේ ජීවත් වූ කාලයෙන් නොව වස්වලින් බැවිනි. එක් අවුරුද්දක් වස් විසූ භික්ෂුවට අවුරුදු දෙක වස් විසූ භික්ෂුව වැඩි වයස්ය. මේ හේතුව නිසා වයසින් වැඩි අලාම් භික්ෂූන් වයසින් අඩු භික්ෂූන්ට පසුව ගමන් කරන හැටි දකින්ට ලැබෙයි.



**මහාචාර්ය ජේ. බී. දිසානායක**



# නීතිය හමුවට ගිය භික්ෂුවට උසාවියෙන් ලැබෙන ගරු සැලකිලි මොනවගේද?

බුදු දහමෙහි විනය වශයෙන් දක්වෙන්නේ භික්ෂුවකගේ පෞද්ගලික ජීවිතයට පමණක් නොව සමාජ යහපතට හේතුවන නීතිරීති සමූහයයි. බුදුරදුන් ඇතැම් විනය නීති පැනවීමේදී මිනුම් දඬු ලෙස සලකා තිබෙන්නේ රාජ නීතිය හා සමාජය වරදක් ලෙස සලකන කරුණුයි. යම් පුද්ගලයකු සිදුකරන කිසියම් ක්‍රියාවකට රජු විසින් ගහු අල්ලා නීතියෙන් දඬුවම් කරයි නම්, රාජ නීතියට පටහැනි එවැනි ක්‍රියා නොකරන්න යැයි බුදුරදුන් භික්ෂූන්ට නියම කොට ඇත. භික්ෂුව රාජ නීතියට අවනත විය යුතුය.

අනුරාධපුර රජ සමයේ භාතිය රජු ගෝදත්ත නමැති තෙරුන්ට ලක්දිව අගවිනිසුරු තනතුර පිරිනැමූ බව ඉතිහාසයේ සඳහන් වේ. 1806 වසරේදී ඇලෙක්සැන්ඩර් ජොන්ස්ටන් විනිසුරුවරයා අධිකරණ විනිශ්චය සඳහා ජූරි සභාවට භික්ෂූන් පත්කළේය. ජනතාව නඩුකාරවරයකුට අමතන්නේ භික්ෂූන් සඳහා යෙදෙන හාමුදුරුවනේ යන ගෞරවාන්විත වචනයෙනි. ඒ අනුවින් විනිසුරුවරයා භික්ෂුවට සමාන කරන්නේ දෙදෙනාගේ පූජනීයත්ව භාවය හේතුවෙනි. අනුන් යහමග යැවීමට කැපවන භික්ෂුව හැසිරිය යුත්තේ සමාජයට නීතිගරුක අයුරිනි.

අධිකරණය යනු උත්තරීතර ආයතනයකි. විවිධ හේතු කාරණා නිසා භික්ෂූන්ට අධිකරණයට යාමට සිදුවෙයි. ඇතැම් විට විත්තිකරුවකු වශයෙනි. තවත් විටෙක පැමිණිලිකරුවකු හෝ සාක්ෂිකරුවකු වශයෙනි. එවැනි අවස්ථාවල විනිසුරුවරුන් ඉදිරියේ භික්ෂූන් කටයුතු කළයුත්තේ කෙසේද? යන්න සමාජයේ සාකච්ඡා වන මතභේද සහිත ප්‍රශ්නයකි. නඩුකාරවරයා සහ භික්ෂුව සමාජයේ උත්තරීතර චරිත දෙකකි. නඩුකාරවරයා රටේ පොදු නීතිය අනුව විනිශ්චය කටයුතු සිදුකරයි. රටේ පවත්නා නීතිය මගින් ඔහුට නිල බලය ලැබෙයි. ශ්‍රී ලාංකික භික්ෂුවටද ඒ සමාන බලයක් තිබුණත්, එය රටේ නීතියෙන් නොව බෞද්ධ සමාජයෙන් ආරෝපිත වූවකි.

අපේ බෞද්ධ සමාජය තුළ භික්ෂුවට වඩා උසස් තැනැත්තකු නොමැත. නඩුකාරවරයා බෞද්ධයකු

නම්, උසාවියෙන් පිටත දී ඔහු කිසිදු පැකිලීමකින් තොරව භික්ෂූන්ට හිස නමා වඳියි. භික්ෂූන් ඉදිරියේ උස් අසුනක වාඩි නොවෙයි. එසේ වුවද, අධිකරණයේදී ඔහු පෞද්ගලිකත්වයෙන් මිදෙයි. භික්ෂුවක කෙරෙහි දක්වන ආකල්ප හා හැසිරීම් පෙරදරිව උසාවියේ ක්‍රියා කරන්නට නඩුකාරවරයාට නොහැක. විනිසුරු ලෝගුව සහිතව විනිශ්චය ආසනයට නැගුණු විට ඔහු ඉදිරියේ සිටින සියලු දෙනා දෙස බලන්නේ නීතිමය ඇසකිනි. ඔහුට සියලු දෙනාම පෙනෙන්නේ කිසියම් විනිශ්චයක් ලබාගැනීමට තමන් ඉදිරියට පැමිණි පිරිසක් වශයෙනි. ඔහු නීතියේ අධිපතිත්වය දරන්නා වශයෙන් සියලු රටවැසියන්ට සමානව සැලකිය යුතුය. නීතිය සංකේතවත් කරන තුලාධාර කාන්තාවගේ දෙඇස් වසා තිබෙන්නේ නීතිය කිසිවකුගේ විශේෂත්වයක් නොසලා සමානව සලකන බව පෙන්වීමටයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වගන්තියේ සර්ව සාධාරණත්වයේ අයිතිවාසිකම යටතේ ඒ බව විස්තර කෙරේ.

**12 (1) නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීමද, නීතියේ රැකවරණයද, සර්ව සාධාරණ විය යුත්තේය.**


**(2) කිසිම පුරවැසියකුට වර්ගය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂ භේදය, දේශපාලන මතය හෝ උපන් ස්ථානය යන හේතු මත හෝ ඉන් කවර හේතුවක් මත හෝ වෙනස්කමකට හෝ විශේෂත්වයකට හෝ භාජන නොවිය යුත්තේය.**

උසාවියේ හැසිරෙන ආකාරය සම්බන්ධයෙන් භික්ෂූන් වහන්සේ ගැටලුවකට මුහුණ පා සිටිති. නඩුකාරවරයා අධිකරණ ශාලාවට පැමිණෙන විට සියලු දෙනා අසුන්වලින් නැගිට ගරු කිරීම සම්ප්‍රදායකි. නමුත් අපේ සමාජයේ භික්ෂුවක් අසුනින් නැගිට කිසිදු ගිහියකුට ගරු බුහුමන් දක්වන්නේ නැත. නඩුකාරවරයා උසාවියට එනවිට භික්ෂුවක් තම ආගමික සම්ප්‍රදායට අනුව අසුන් ගෙන සිටීම නීතියට පටහැනි වීමක්ද? භික්ෂුවක් ඒ අවස්ථාවේ අනුගමනය කළයුතු පිළිවෙත කුමක්ද? යන්න නිරවුල් කරගත යුතුය. ඒ සම්බන්ධව සිදුවීමක් මෑතකදී අධිකරණයෙන් වාර්තා වුණි.

2008 සැප්තැම්බර් මස කඩිද දූෂණය පිළිබඳ චෝදනාවට භික්ෂුවක් අධිකරණයට පමුණුවන ලදී. උන්වහන්සේට සහය දක්වීමට එහි පැමිණිය භික්ෂූන් අගවිනිසුරුතුමා එන විට අසුන්වලින් නොනැගිටීම හේතුවෙන් අර්බුදයක් මතු විය. එයින් අධිකරණයට අපහාසයක් සිදුවේ යැයි සැලකූ අගවිනිසුරුතුමා භික්ෂු පිරිසට අධිකරණයෙන් පිටතට ගොස් නැවත පැමිණෙන ලෙස විත්තිකාර හිමිනමගේ නීතිඥයා මගින් දැනුම් දුන්නේය. භික්ෂුවක් එලෙස ගිහියකු එනවිට නැගිටිය යුතුදැයි එම සිද්ධිය මුල්කරගෙන තර්ක විතර්ක මතුවිය. විත්තිකාර හිමි නම රක්ෂිත බන්ධනාගාර ගත කෙරුණි. බෞද්ධ සංවිධාන කීපයක් අගවිනිසුරුතුමාට එරෙහිව ජනාධිපතිවරයාට පැමිණිලි කළේය. ඒ ගැන විශේෂ අවධානය යොමු කළ ජනාධිපතිතුමා නීත්‍යනුකූලව ඒ හිමියන්ට ඇප ලබාදෙන්නට පියවර ගත්තේය. නමුත් එතුමා ඒ සිද්ධියේ නීතිමය තත්ත්වය ගැන කිසිදු අදහසක් ඉදිරිපත් කළේ නැත. ජනාධිපතිතුමා පැවසුවේ භික්ෂූන්ගේ ගෞරවය සුරැකීම පිණිස භික්ෂූන් සම්බන්ධ නඩු වෙනම අධිකරණයකදී විභාග කිරීම සුදුසු බවයි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 15 පරිච්ඡේදයේ අධිකරණය 4 වගන්තියෙන් භික්ෂූන්ට වෙනම උසාවි පිහිටුවා ගන්නට ප්‍රතිපාදන ලබාදී ඇත. භික්ෂූන් වහන්සේලාගේ විනය සම්බන්ධ කාරණා හෝ භික්ෂූන් වහන්සේලා අතර ඇති යම් ආරවුලක් හෝ විහාරස්ථානවල යම් ආරවුලක් හෝ විනිශ්චය කොට සමථයකට පත්කිරීම සඳහා අධිකරණ, විනිශ්චය අධිකාර හෝ ආයතන ඇතිකොට පිහිටුවීමට පාර්ලිමේන්තුව විසින් නීතියෙන් විධිවිධාන සැලැස්විය හැක්කේය යනුවෙන් එහි සඳහන් වේ. භික්ෂූන්ට ලැබී ඇති මෙම විශේෂ වරප්‍රසාදයෙන් ප්‍රයෝජන ගැනීමට මෙතෙක් වගකීම් දරන භික්ෂූන් අවධානය යොමුකොට නොමැත. ඒ නිසා භික්ෂූන් අධිකරණය තුළ නොයෙකුත් අපහසුතාවන්ට පත්වෙයි. විහාර දේවාලගම් පනත යටතේ පවතින භික්ෂූන් සම්බන්ධ සිවිල් නඩු ඇසීම සඳහා 2013 ඔක්තෝබර් මස මහනුවර අධිකරණ සංකීර්ණයේ වෙනම ඒකකයක් පිහිටුවන ලදී. එය සංඝාධිකරණයක් නොව පවතින අධිකරණ නීති සම්ප්‍රදාය යටතේ නඩු විභාග කරන ආයතනයකි.

රටේ නීතිය සියල්ලන්ටම පොදු වූවකි. උසාවිය තුළ නිල වශයෙන් අසුන්ගෙනු සිටින නඩුකාරයා නියෝජනය කරන්නේ නීතියේ අධිපතිත්වයයි. එම පුද්ගලයා නොවේ. භික්ෂුවද නීතියට යටත්ය. භික්ෂුව නීතියට ගරු කළ යුතුය. යන්න මහානායක හිමිවරුන් ලබාදී ඇති තීරණයයි. ඒ ගැන විවාදයක් නොමැත. ගැටලුව



පවතින්නේ අධිකරණ සම්ප්‍රදාය සම්බන්ධයෙනි. ජනාධිපතිවරයාද නීතියේ උපරිම බලය උසුලන කෙනෙකි. එතුමා ඉදිරියේ වුවද භික්ෂුව නොනැගිටියි. එසේ නම්, භික්ෂුව නඩුකාරවරයා ඉදිරියේ නැගිටිය යුතුද? යන ප්‍රශ්නය නිරාකරණය වී නොමැත.

සංඝ ගෞරවයත්, නීති ගරුත්වයත් යන දෙකම සුරැකීමට උසාවියේදී උපායශීලීව කටයුතු කිරීමට භික්ෂූන් වහන්සේලා පුරුදු වී සිටිති. නඩුකාරවරයා උසාවියේ අසුන් ගත් පසු ශාලාවට ඇතුල්වීම භික්ෂූන් අනුගමනය කරන පිළිවෙතයි. තීරණයක් නොමැති තර්ක විතර්ක පවතින ප්‍රශ්නයට ප්‍රායෝගික පිළිතුර එයයි. පාර්ලිමේන්තු සභා ගැබට සෙංකෝලය රැගෙන එනවිට හා කථානායකවරයා පැමිණෙන විට භික්ෂුව ක්‍රියා කළයුත්තේ ඒ අයුරිනි. සමාජයේ සාම්ප්‍රදායික රීතියට ගරු කරමින් ඇතැම් නඩුකාරවරු භික්ෂූන් උසාවියේ අසුන් ගන්නා ලෙස දැනුම් දෙති.

**මැදගම ධම්මානන්ද හිමි**
**අස්ගිරි මහා විහාරීය කාරක සංඝ සභික, ගරු අනුශාසක, සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩලය**

16

# ඔබත් බාහිර ඔපයට රැවටෙන කෙනෙක්ද?

## සප්ත ජටිල සූත්‍රයේ එන මේ කතාව අහන්න

බාහිර ස්වරූපයෙන් කිසිවක හෝ කිසිවකුගේ සැබෑ ස්වභාවය තේරුම් ගත නොහැකිය. වෙළෙඳ පොළ ඇති භාණ්ඩයක හොඳ නරක එය අසුරන ලද හෝ නිෂ්පාදනය කර ඇති ප්‍රියමනාප ස්වභාවයෙන් තේරුම් ගත හැකි නොවේ. බාහිර ස්වභාවයට රැවටී ගෙදරට ගෙනයන බොහෝ දෙයෙහි දුර්වලකම් පේන්නේ කලක් භාවිතයට ගන්නා විටය.

අප ඇසුරු කරන හෝ ඇසුරට එකතු වන කෙනකුගේ ගුණ යහපත්කමද බාහිරව මැනිය නොහැක. කෙනකු බොහෝ සත්පුරුෂව කතා කළත් ඒ වචන යට අසත්පුරුෂයකු සිටිය හැකිය. යමෙක් සත්පුරුෂව හැසිරුණේ ඒ හැසිරීම මගින් ඔහු තවත් කෙනකු රැවටීමට කරන උත්සාහයක් වෙන්නට පුළුවන.

සිල් රෙදි පෙරවූවාට හැමදෙනාම සිල්වතුන් නොවේ. පන්සිල් ගන්නාට හැමෝම පන්සිල් රකින්නෝද නොවේ. බාහිරව දකින කිසිවක් වහා තේරුම් නොගත යුත්තේ එබැවිනි.

රූපයට, කතාවට, හැසිරීමට රැවටී ගත් තීරණ නිසා සමාජයේ වැඩි දෙනෙක් අඳුරු ජීවිත ගත කරති. සමහරු රූපයෙන් ජීවිතයට ආලෝකයක් වේ යැයි සිතා ඇසුරට ගියෝය. තවත් අය හැසිරීමට හා කතාවට රැවටී ඇසුර සෙවූවෝය. අවසානයේ ඒ කිසිවෙක් ලැබූ සැපක් හෝ සැනසිල්ලක් නැත. සියල්ලෝම අඳුරෙන් අඳුරටම ගොස් ඇත. බාහිර ස්වරූපයෙන් කිසිවක් තීරණය නොකරන්නැයි බුදුරජාණන් වහන්සේද දේශනා කර තිබේ. මේ පිළිබඳව වන අපූරු දේශනාවක් සංයුත්ත නිකායේ සත්ත ජටිල සූත්‍රයෙහි දක්වේ.

කොසොල් මහ රජතුමා බුද්ධකාලීන භාරතයේ සිටි බලසම්පන්න රජෙකි. ඔහු තෙරුවන් සරණ ගිය, එසේම දහම් අවබෝධයද ලබාගත්තෙකි. කොසොල් රජතුමා බුදුහිමියන් හමුවන්නට නිතර දෙව්රම් වෙහෙරට සැවැත්නුවර ජේතවනාරාමයට පැමිණියේය. එයට විශේෂ කාරණා කීපයක්ද තිබිණි. එනම් රාජ්‍යත්වය සඳහා අනුශාසනා ලබාගැනීමය. තවත් අතකින් බුදුහිමියන් හා හිමි කල පැවති රාජ්‍ය සම්බන්ධතාව හා ඇති හිතෛෂීභාවයයි. එසේම බුදුන් වහන්සේ හා සම වයසකි වීමය.

දිනක් බුදුරජාණන් වහන්සේ මිගාර මාතු ප්‍රාසාදයේ වැඩ සිටින අවස්ථාවක කොසොල් මහරජු පැමිණ කරුණාකයන් වහන්සේ වන්දනා කළේය. ප්‍රාසාදයට නුදුරින් බොහෝ දුරුකතාව වැටුණු මගෙකි. එහි ඇවිද කරන්න වෙළෙඳ කණ්ඩායම් නිතර ගමන් කරති. ඒ අතර විවිධ ශ්‍රමණ පිරිස්, නුවර වැසියෝ ගමන් කරති.

කොසොල් මහරජතුමා බුදුරජාණන් වහන්සේ හා ධර්ම සාකච්ඡාවක යෙදෙන විට ඈතින් මාර්ගයේ පිළිවෙළට, සානුව වඩිනා ශ්‍රමණ පිරිසකි. රජු තම උතුරු සළුව ගලවා පොළොවේ එලා පෙරළී පෙරළී ඒ දෙසට නමස්කාර කරන්නට විය. ඒ ශ්‍රමණ කණ්ඩායම බොහෝ දුර යනතුරුම රජතුමා කිසිවක් නොකියා බලා සිටියේය.

මොහොතක් සිට කොසොල් රජතුමාම කතාව ආරම්භ කළේය.

"ස්වාමීනි බලන්න... අර වඩින ශ්‍රමණ පිරිස දිහා. ඒ පිරිස හරිම ශාන්තයි, සිල්වන්තයි, කල්‍යාණයි තියෙනවා. තිවු පැහැපත් සිරියක්, සමහරවිට ඒ රහතන් වහන්සේලා වෙන්නට ඇති. නැත්නම් අනාගාමී උතුමන් වෙන්න ඇති. උතුම් පිරිසක් බව හොඳට පේනවා."

ඒ වචන අසා සිටි බුදුරජාණන් වහන්සේ "මහරජතුමනි, ඔබ රජෙක් වුවත් ඔබ ළඟ යෝග්‍ය භාවයක් නැහැ. ඔබට මිනිස්සු හරියට හඳුනා ගන්න වැටහීමක් නැහැ. ඔබ දකින, පේන ආකාරය සියල්ල තීරණය කරනවා" යි වදාළහ. එසේ වදාරමින්,

"න වණ්ණ රූපේන නරෝ සුජානෝ
න විස්සසේ ඉත්තර දස්සනේන
සුසඤ්ඤතානං හි වියඤ්ජනේන
අසඤ්ඤතා ලෝක මිමං චරන්ති."

"මිනිස්සු බාහිරින් පේන ස්වරූපයෙන් හෝ රූපයෙන් සිල්වත්ද, ගුණවත්දැයි හඳුනාගත නොහැකිය. ඒ ඇයි? ගුණවතකුගේ ස්වරූපයෙන් කිසිම සංවරකමක් නැති අය වහාම පෙනී සිටිය හැකියි. බොහෝ පහත් අය පවා රැසී ප්‍රයෝජන ලැබීමට උගතුන්, ගුණවතුන්ගේ ස්වභාව ගන්නා බව එදිනෙදා සමාජයෙහිද අපට පෙනේ.


සංස්කෘත ඉතිහාසයේ දක්වෙන පරිදි සර්පයාගේ විෂ ඇත්තේ දත්වලය. මදුරුවාගේ විෂ ඇත්තේ හිසෙහි ඇති තුඩේය. ගෝනුස්සාගේ විෂ ඇත්තේ වලිගයේය. නමුත් මිනිසාගේ සියලුකයම විෂ තිබේ. හිස සිට පාදාන්තය දක්වා මිනිසා විෂ සහිතය. එබැවින් රවටන මිනිසුන් මැද නොරැවටී සිටින්නට අවශ්‍ය කරුණු හතරක් බුදුරජාණන් වහන්සේ කොසොල් මහරජතුමාට දේශනා කළහ.

එනම්,

1. සංවාසේන ඛෝ මහාරාජ සීලං වේදිතබ්බං
   මහරජ, කෙනකුගේ සීලය හඳුනා ගන්නට නම් කාලයක් ඔහු ඇසුරු කළ යුතුය. එය දවසින්, දෙකින් කළ නොහැකිය.
2. සංවෝහාරේන ඛෝ මහාරාජ සෝචෙය්‍යං වේදිතබ්බං
   මහරජ, කෙනකුගේ ව්‍යවහාර පැවැත්මෙන් හෝ ව්‍යවහාර කතාබහින්ද ඇතුළත පිරිසිදු බව හඳුනාගත හැකිය.
3. ආපදාසු ඛෝ මහාරාජ ථාමං වේදිතබ්බං
   තමාට විපතක් පැමිණි විට එය දරාගැනීම ඔහු තුළ පවතින ශක්තිය අනුව ඔහු ඒ වේලාවේ ක්‍රියාකරන ආකාරය අනුව හඳුනා ගැනීමට පුළුවන.
4. සාකච්ඡාය ඛෝ මහාරාජ පඤ්ඤා වේදිතබ්බං
   මහරජ, කෙනකුගේ ප්‍රඥාව දැනගන්නට නම් ඒ සඳහාද කාලයක් ඇසුරු කළ යුතුය.



"ඇත්ත කිව යුතුය, අනුන්ට නොකිපිය යුතුය, යාචක යමක් ඉල්ලූ කල ටිකක් වුවත් දිය යුතුය. මේ තුන් කරුණෙන් කෙනෙකුට දෙවියන් වෙත යා හැකිය."



ඉහත කරුණු කාරණා දෙස විමසිලිමත් වන කල යමෙක් දෙස බැලූ පමණට ඔහු සතු මිල මුදල් අනුව, ඔහුට ඇති තනතුරු නම්බුනාම අනුව, කතාබහ අනුව, මිනිසුන්ගේ වර්ණනා අසා කිසිවෙක් තීරණය නොකළ යුතුය. මේ ලෝකය සකස් වී ඇත්තේම ඔබ රැවටීමටය. එහි රවටෙන දේ බොහෝය. ඒ අතර නොරැවටී සිටීම විශිෂ්ට ගුණාංගයක් වන්නේය.

බුදුරජාණන් වහන්සේගේ දේශනය අසා සිටි කොසොල් රජතුමා,

"ස්වාමිනි, ඔබවහන්සේගේ දේශනාව ආශ්චර්යමත්ය. විශිෂ්ටය. ඔබවහන්සේ කියන්නේ සැබෑවකි."

මඳක් සිනහා නංවා බුදුරජු "පෙර ගිය ශ්‍රමණ වෙසින් සංයමව වැඩියේ මාගේ හට පිරිසකි. ඔවුන් සංයමයට හැසිරුණ අපූරුව" යි ප්‍රකාශ කළහ.

**පූජ්‍ය අත්කඩුවේ සුමනසාර හිමි**

"යකඩයෙන් හැදුණු මලකඩ එම යකඩයම කා දමයි. නුවණින් තොරව වසන තැනැත්තාගේ අකුසල් ඔහු දුගතියට යවයි."

# දළදා වරුණ

මාධ්‍ය විකාශ ඒකකය කාර්යාලය
ශ්‍රී දළදා මාළිගාව
මහනුවර
දුරකථන : 0812204684
ෆැක්ස් : 0812236202
E mail : media@sridaladamaligawa.lk
Web : www.sridaladamaligawa.lk

## පින්කම් සංවිධානයේදී සිහි තබාගත යුතු කරුණු

[illegible]








## යමුද වඳින්නට අටමස්ථානේ එනවා නිවාඩුව දෙසැම්බර් මාසේ

[illegible]

ඉන්දුමතී පෙරේරා

"[illegible] මට බැන්නේය. මට ගැසුවේය. මා පැරදවූයේය. මා සතු දේ පැහැර ගත්තේය යනුවෙන් යම් කෙනෙකු ක්‍රෝධය සිතෙහි දැඩි කොට බැඳ ගනිද්ද ඔවුන්ගේ වෛරය නොසන්සිඳේ." - (ධම්ම පදයේ 3 වන ගාථාව)




# බුදුරැස් විහිදුනේ මෙහෙමයි

මහා බෝධි සත්වයන් වහන්සේ එදා ඒ වෙසක් මස පුණු පොහෝදා දිනයේ පස් මරුන් පරයා සව් කෙලෙසුන් නසා ලොව්තුරා බුදු වී තමන් වහන්සේ වැඩ හුන් බෝධි පර්යංකයෙහි අනේක සමවත්වලට සම වදිමින් සමවත් සුවයෙන් සතියක්ම විසූ සේක. සති අන්තයේ ඒ පලඟින් නැගී සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් මුල්ලෙහි මා විසින් සෙවූ මේ ධර්මය මේ පර්යංකයෙහිදී අවබෝධ කර ගතිම්යි දෙවන සතියේදී ඒ පර්යංකයටත්, බෝධින් වහන්සේටත් පූජාවක් වශයෙන් දෙවන සතිය මුළුල්ලෙහි පර්යංකය දෙස බලා ගෙන නිශ්චලව විසූ සේක. එසේ සිටින කල්හි මේ පර්යංකය අත් නොහැර තවමත් මෙතැනි මුනිවහන්සේ සිටින්නේ බුදුවීම පිළිබඳ මුනිවහන්සේගේ කටයුතු තවමත් අවසන් වී නැතැයි යන කල්පනාවක් දෙවියන්ට ඇති විය. භාග්‍යවතුන් වහන්සේ ඔවුන්ගේ අදහස් දැක ඔවුන්ගේ ඒ අදහස් දුරු කිරීම පිණිස අහසට පැන නැගී යමක ප්‍රාතිහාර්යය දක්වූ සේක. ඉක්බිති උන්වහන්සේ ආකාශයෙන් බැස පර්යංකයටත්, සිටි තැනටත් අතර සතියක් සක්මන් කළ සේක. ඒ එක්විසි දිනයෙම තථාගත ශරීරයෙන් රැස් විහිදීමක් සිදු නොවීය.

සතර වන සතියේ භාග්‍යවතුන් වහන්සේ බෝධින් වහන්සේට වයඹ දිග එක් ස්ථානයක වැඩ හිඳ අභිධර්ම පිටකයේ සප්ත ප්‍රකරණය මෙනෙහි කිරීම ආරම්භ කළහ. ඒ ප්‍රකරණයන්ගෙන් ධම්මසංගණී, විභංග, ධාතු කතා, පුග්ගලපඤ්ඤත්ති, කථාවත්ථු, යමක යන ප්‍රකරණ සයේ ධර්ම උන්වහන්සේගේ තියුණු නුවණට ලොකු දෙයක් සේ, ගැඹුරු දෙයක් සේ, සියුම් දෙයක් සේ නොදැනිණ. එබැවින් ඒ ප්‍රකරණ මෙනෙහි කිරීමෙන් උන්වහන්සේට එතරම් සතුටක් ඇති නොවීය. අභිධර්ම පිටකයේ සත්වන ප්‍රකරණය වන මහා පට්ඨාන ප්‍රකරණයට බැස හේතුපච්චයෝ ආරම්මණ පච්චයෝ යනාදීන් ප්‍රභේද ධර්ම මෙනෙහි කරන්නට වන් කල්හි උන්වහන්සේගේ අනන්ත නිර්මල අනන්ත තීක්ෂණ නුවණට එහි සෙ හැසිරෙන්නට ලැබිණ. ඒ ප්‍රකරණයම උන්වහන්සේගේ සර්වඥතා ඥානයට හැසිරීමට ප්‍රමාණවත් විය. කුඩාවක සිර වී සිටි පන්මියකුට එළිමහනට පැමිණීමට ලද විට ඉමහත් ප්‍රීතියක් ඇති වන්නාක් මෙන් පට්ඨාන ප්‍රකරණයෙන් තථාගතයන් වහන්සේට ඉමහත් ප්‍රීතියක් ලැබිණ. එයින් උන්වහන්සේගේ ලේ ධාතුව පැහැදිනි. ඒ අනුව සකල ශරීරයම පැහැදිනි. ගින්න පැහැදිලි දෙයක් වන නිසා එයින් පිටතට ආලෝකයක් නික්මෙන්නාක් මෙන් තථාගතයන් වහන්සේගේ ශරීරයෙන් ආලෝකය නික්මෙන්නට විය. බුද්ධත්ව කියනුයේ ඒ ආලෝකවලටය. තථාගත ශරීරයේ කෙස් ලොම්වලින් හා නේත්‍රවල නිල් තැන්වලින් නීල රශ්මිය නික්මිණ. සමින් හා නේත්‍රයන්හි කහ පැහැය ඇති තැන්වලින් පීත රශ්මිය නික්මිනා. ලේ මස්වලින් හා නේත්‍රයන්හි රතු තැන්වලින් ලෝහිත රශ්මිය නික්මිණ. ඇටවලින් හා දත්වලින්ද නේත්‍රයන්හි සුදු තැන්වලින්ද ඕදාත රශ්මිය නික්මිණ. මාංජිෂ්ඨ ප්‍රභාස්වර රශ්මීහු ශරීරයේ ඒ ඒ තැන්වලින් නික්මුනාහ. ඒ රශ්මීහු ලොව පුරා අහසෙහි පැතිර ගියහ.

පට්ඨාන ප්‍රකරණය සම්මර්ශනයෙන් පසු තථාගත ශරීරයෙන් අසූ රියනක් තැන් පැතිර සිටින නිශ්චල රශ්මියක් ඇති විය. කේතුමාලා යයි කියනුයේ අසූ රියනක් උසට තථාගත සිරසෙන් විහිදී පවත්නා නීල රශ්මියයි. ව්‍යාමප්‍රභාවය යි කියනුයේ තථාගත දේහය වටා බඹයක් තැන පැතිර නිශ්චලව පවතින රශ්මියයි.

ධර්ම ගවේෂී



# මහළු, අන්ධ මව රැගෙන කීර්ති ශ්‍රී රාජසිංහ රජු ශ්‍රී පාදය වඳින්නට ගිය හැටි

උඩරට කීර්ති ශ්‍රී රාජසිංහ රජු රජ කරන අවධියයි. (1747-1782) නැතිවී ගිය උපසම්පදාව පිහිටුවා භික්ෂු ශාසනය බබළවා සවිහෙර විහාර රාශියක් යළි අලුතින් ඉදිකර හැඩිවුන් වූ, වෙහෙර විහාර රැසක් ප්‍රතිසංස්කරණය කරවූ රජු බුදු දහමට කළේ අමිහිත සේවයකි. සෙන්කඩගල දළද මැදුර තුඩුරුව එද රජුගේ රජ්වාසල විය. රජුගේ මව රජ මැදුරේම වාසය කළාය. ඇය මහළුය. දෑස් අන්ධව සිටියාය. බුදු දහම පිළිබඳ මහළු මව තුළ වූයේ අසීමිත භක්තියකි. මහළු මව ශ්‍රී පාදය වන්දනා කිරීමේ දැඩි ආශාවෙකින් දිගු කලක් සිටි අතර මහළු අන්ධ අයෙකුට සමනළ කන්ද නැගීම ඉතා අසීරු බව රජු වටහාගෙන සිටියේය. ඇය දෝලාවක තබා ශ්‍රී පාදය මුදුනට ගෙන යාමට ඇමැතිවරු යෝජනා කළත් කීර්ති ශ්‍රී රජු එයට එකඟ වූයේ නැත.

තම මහළු මවගේ ආශාව කෙසේ ඉටුකරන්නේදැයි රජු බොහෝවිට දිගු කාලයක් තනිව කල්පනා කරන්නට විය. එද මහනුවර නගරය තුළම මහළු මවට ශ්‍රී පාදය වන්දනා කරවීම රජුගේ උපාය විය. අම්පිටිය කඳුවලින් ඇරැඹී දුනුමඩලාකන්ද හරහා ගලන සීතල ජලධාරා එකතු කරගෙන පිංගොල්වෙල වෙල්යාය ඔස්සේ මහමිට්ට දෙසට ගලා එන හීල්පැන්කඳුරේ සීතල පවිත්‍ර ජලය මහමිට්ට පාමුල කොටසක ජලය සමග සේදී ආ මඩ තැන්පත් වී 'අලකොළේ' නමින් විශාල වගුරු බිමක් නිර්මාණය වී තිබුණි. ඒ වගුරු බිම මහමිට්ට කෙළවර සිට පත්තිනි දේවාලය දක්වා පැතිර තිබුණි. හීල්පැන්කඳුරේ ජලය අලකොළේ වගුරු බිම විසාගත් අලකොළයාය මැදින් දළද මාලිගාව හා නාථ දේවාලය දෙසට ගලා ගෙන ගියේය. එම වැසි වතුර දළද මැදුර ඉදිරිපිට පැරණි දියඅගල් ඔස්සේ බෝගම්බර දක්වා ගලා ගියේය.

පත්තිනි දේවාලය අසල ඉතා පුරාණයට ඉතා උස් පිම්බනක පිහිටි වැල් බෝධිය නොහොත් හෙන් බෝධිය රජුට මතක් විය. මහමිට්ට හරහා ගලන හීල්පැන්කඳුර බිමේ සිට පත්තිනි දේවාලයේ වැල් බෝධිය පිහිටි උස් ගොඩැල්ලේ මිදුල දක්වා රටුම් වැලු සහිත ඉහළට නගින පඩි අඩි පාරක් සකස් කොට එය දෙපස ගල්වැල් සිටුවා වැල් බෝධිය පාමුල විශාල සිරිපතුල් ගලක් පිහිටුවා මහනුවර අදිකෂ ශ්‍රී පාද කන්දේ හැඩරුව රැගත් උන්නත වංගු සහිත පවිත්‍ර සීතල පරිසරයක් මැදින් මව කැටුව ඉහළට රැගෙන ගොස් වැල්බෝධිය පාමුල පිහිටි වූ ශ්‍රී පාද ලාංඡනය වන්දවා ඇය ශ්‍රී පාදය වැඳීමට කැටුව ගිය බව එත්තු ගන්වා මවගේ සිත සතුටු කිරීම රජුගේ උපාය විය. පැණෙන පවිත්‍ර සීතල හීල්පැන්කඳුරේ ජලය අපට වටහා දුන්නේ ශ්‍රී පාද කඳුමුදුනින් ගලන සීත ගඟුල ලෙසයි. ඇය කැටුව පරිවාර වන්දනාකරුවන්, බෙර දවුල්කරුවන්, සම්මැටිබම්කරුවන්, පිරිවර ගමන් කිරීමට විය. වටරවුම් ගණනාවක් පත්තිනි දේවාලයේ වැල් බෝධිය වටා ඉහළට ගිය පිරිස, ශ්‍රී පාද පද්මය ඉහළට නගින බව අඟවා බෝධිය හඟවා අලුතින් සකස් කළ සිරිපතුල් ගල ආගේ ආශාව යනතුරු වන්දනා කිරීමට ඉඩ දෙන ලදී. මහළු මව උතුරා යන භක්තියකින් ශ්‍රී ලිව නාථ දේවාල උස් බිමේ පිහිටි වැල් බෝධිය පාමුල පිහිටි වූ සිරිපතුල් ගල මුදියාලම්භන ප්‍රීතියෙන් උතුරා යමින් වැඳ පුද ගත්තාය.


එස්. කේ. ජයවර්ධන



# ඉල් පොහොයට යෙදෙන ශ්‍රී දළදා මාලිගාවේ කාර්තික මංගල්ලය

මානව ඉතිහාසයේ මුල සිටම වාගේ අග්නි පූජාව විශේෂ වැදගත්කමකින් යුතුව සලකා ඇත. හින්දු සමයේ අග්නි පූජාව තුළින් උපන් ප්‍රදීප පූජාව, අඛණ්ඩ උපන ලැබූ බුදු සමයෙහි ද ආමිස පූජාවක් වශයෙන් ප්‍රධාන තැනක් ගන්නා පූජාවක් බවට පත්විය. අසූ හාර දහසක් ධර්මස්කන්ධය සංකේතවත් කොට අසූ හාර දහසක් පහන් පූජා පින්කම් පැවැත්වීම බෞද්ධයන් අතර අදත් බහුලව පවතී. ස්කන්ධ පුරාණයට අනුව කැති නැකතින් උපන් කාර්තිකේය හෙවත් කඳ කුමරු උදෙසා ඉල් මැදි පෝය දින ප්‍රදීප පූජා පැවැත්වීම හින්දූන් තුළ දුරාතීතයේ පටන් පැවතෙන පූජා චාරිත්‍රයකි.

ස්කන්ධ හෙවත් කතරගම දෙවියන්ගේ උපත පිළිබඳ ප්‍රධාන මත දෙකක් පවතී. ඊශ්වරයාගේ නළලත පිහිටි තෙවන ඇසින් නික්මුණු වූ අග්නි රස් දහරාවෙන් උපන් දරුවන් හය දෙනෙකු උමා දේවිය විසින් එකට බදා ගැනීමෙන් අසූ එක් දරුවෙක් බවට පත්වී කතරගම දෙවියන් පහළ වූ බව ඉන් එක් මතයකි. එම දරුවන් හය දෙනා සංකේතවත් කරමින් මුහුණු සයක් ද අත් දොළොසක් ද කතරගම දෙවිඳුන්ට තිබිය ඇත.





ඊශ්වරයා සතුව බලවත් මන්ත්‍රයක් විය. එය මිනුරා කෙනෙකුගේ හිස මත අත තැබූ විට ඔහු අළු කළ හැකි බලයක් පැවතිණ. එම මන්ත්‍රය ඊශ්වරයාගෙන් උගත් අසුරයා ඊශ්වර දෙවි අළු කිරීමේ අදහසින් ඔහු පසු පස පළවාගෙන යද්දී, මේ බව දුටු විෂ්ණු සිදුවීමට යන විනාශය දැක රූමත් ස්ත්‍රී රූපයක් මවා ගෙන අසුරයා හමුවට ගොස් උපක්‍රමයෙන් අසුරයා රවටා එම මන්ත්‍රයෙන් අසුරයා දවා අළුකොට ඊශ්වරයා බේරාගන්නා ලදැයි කියැවේ. අනතුරුව තමා පසුපස පළවාගෙන ආ අසුරයා වෙනුවට රූමත් ස්ත්‍රියක් ඊශ්වරයාට දක්නට ලැබිණ. මෙසේ දක්නට ලැබුණු රූමත් ස්ත්‍රිය කෙරේ බැඳුණු ඊශ්වරයා ඇය විවාහ කරගැනීමට කැමැත්ත පළ කළේය. මෙහිදී එම ස්ත්‍රී රූපය ගෙන සිටි විෂ්ණු දරුවන් හයදෙනෙකු දක්වා ඉදිරියේ ඇති ස්ත්‍රියක විවාහ කරගැනීමට උමා දේවියගෙන් අවසර ලබාගෙන එන ලෙස වරින් වර ඊශ්වරයා ආපසු හරවා යවන ලදී.

මෙය විෂ්ණුගේ මායාවක් බව දැනගත් උමා දේවිය දරුවන් ළඟට ගොස් කුමාර ස්කන්ධ කියා දරුවන් හය දෙනාම එකට බදා ගත්තාය. එම කුමාරවරුන් හයදෙනා එක්වීමෙන් කතරගම දෙවියන් බිහිවූ බව දෙවන මතයවේ. මේ ආකාරයෙන් බිහි වූ කඳ කුමරු සිහිපත් කොට ඉල් මස ප්‍රදීප පූජා පැවැත්වීමේ සිරිත දුරාතීතයේ සිටම හින්දූන් අතර පවතින චාරිත්‍රයකි.

කුරු රට ධනංජය රජු ඉල් මාසයේදී කාර්තික නම් සැණකෙළියක් පැවැත්වූ බව කුරු ධම්ම ජාතක කතාවෙහි සඳහන්වේ. ලක්දිව අනුරාධපුර පණ්ඩුකාභය රජු සමයෙහි චිත්‍රරාජ හා කාලවේල යක්ෂ නායකයන් උදෙසා කාර්තික පූජාව පැවැත් වූ බව මහාවංශ පරිච්ඡේදයක සඳහන් කරයි. කුරුණෑගල යුගයේ රචිත දළදා සිරිතේ හත්වන පිරිසිදෙහි වාවස්ථාගතව ඇති අයුරු ,අවුරුද්දේ කාර්තිකයේ රජ දරුවනට පඬුරු පාහා හෙයෙක් දුරයෙන් අළුතින් දළදා පඬුරු පා පසුව රජ දරුවනට පඬුරු පාහා ඉසා. යනුවෙන්, වසරේ කාර්තිකයේදී පළමුව දළදා වහන්සේට පඬුරු පූජාකොට දෙවනුව රජතුමාට පඬුරු පිළිගැන්විය යුතු බව පවසයි.

මහනුවර යුගයේදී දෙවන රාජසිංහ රජතුමාගේ සමයෙහි ද ප්‍රදීප පූජාමය කාර්තික උත්සවය පැවති බව රොබට් නොක්ස්ගේ වාර්තාවෙහි සඳහන්වේ. කන්ද උඩරට නායක්කර් වංශික රජදරුවන් යටතේ කාර්තිකයෙහි, ප්‍රදීප පූජෝත්සවය පැවැත්වීම වඩාත් ප්‍රචලිත වූවායැයි සිතිය හැකිය. මහාවංශයේ සඳහන්වන අයුරින් ශ්‍රී විජය රාජසිංහ රජතුමා ,ජීවිතය පුරාවෙහි ද රටවල ද ඒ ඒ තැන චෛත්‍යාදියෙහි එක දවසින්ම පහන් පුද කෙරෙව්වායි ඇසා කොට එක රජ ජන සමූහයා රැස් කරවා එක් ලක්ෂ අනූදහස් සත් සියයක් පහනින් පූජාවක් ද කෙළේය. මෙසේ එකල් හි රජ තෙමේ ලංකාද්වීප භූමිය උස්ව බබලන පහනින් තාරකාවන් විසින් ගැවසුණු අහස සේ කෙළේය, යනුවෙන් විචිත්‍ර ප්‍රදීප පූජාවක් පැවැත්වූ බව කියැවේ.

මෙසේ කලින් කලට රජ වූ ඒ ඒ රජදරුවන් විසින් අඛණ්ඩ සිද්ධ කළා වූ දිනපතා, සතිපතා, මාසික, හා වාර්ෂික විවිධ බුද්ධෝපස්ථාන, වත් පිළිවෙත් පූජා චාරිත්‍ර රැසියක් චිරාගත සම්ප්‍රදායික අනුරූපී චාරිත්‍ර වශයෙන් අදත් ශ්‍රී දළදා මාලිගාවෙහි පැවැත්වේ. රජ කුමරුවන්ට පසුව දළදා වහන්සේගේ සිහි භාරකාරත්වය දරන දියවඩන නිලමේතුමන්ලා විසින් ද අඛණ්ඩව එම පුද සිරිත් පවත්වාගෙන ඒම සේ ආගමික, ජාතික, සංස්කෘතික උරුමයන් වඩ වඩාත් ඔපවත් කොට ආරක්ෂා කරගැනීමට අවිහල් විය.

සිංහලේ අවසන් රාජධානිය වූ මහනුවර ශ්‍රී දළදා මාලිගාවේ වැඩ සිටින අති උත්තම ශ්‍රී දළදා වහන්සේ උදෙසා පූජා චාරිත්‍ර වශයෙන් පැවැත්වෙන වාර්ෂික ප්‍රධාන මංගල්ලයන් සතරකි. වසරේ පළමු මාසය වන ජනවාරි මාසයේ දී අලුත් සහල් මංගල්ලයත්, අප්‍රේල් මාසයේ දී අලුත් අවුරුදු මංගල්ලයත්, ජූලි/ අගෝස්තු මාසයන්හි ඇසළ පෙරහර මංගල්ලයත්, වර්ෂයේ අවසාන භාගයේ කාර්තික පෙරහර මංගල්ලයත්, චිරාගත සම්ප්‍රදායානුකූලව පැවැත්වෙන එම සතර මංගල්ලයන් වේ. මෙම ප්‍රධාන සතර මංගල්‍යට අමතරව මැයි මාසයේදී වෙසක් පෙරහර

"උත්සාහවන්තයා සියල්ල ජයගනී - වණ්ණුපථ ජාතකය"

මංගල්ලය ද පුර මාසයේ දී පොසොන් පෙරහර මංගල්ලය ද, ඇසළ/පුර මාස තුළ වසළ කාල උපසම්පදා පෙරහර මංගල්ලය ද වාර්ෂික පූජා මංගල්ලයන් වශයෙන් අඛණ්ඩව පැවැත්වේ.

සතර මංගල්ලයන් හා ඊට අමතර අනෙකුත් මංගල්ලයන් නොකඩවා චිරාගත සම්ප්‍රදායානුකූලව උත්කර්ෂවත් ලෙස පැවැත්වීම දියවඩන නිලමේවරයා සතු කාර්ය භාරයන් අතර ඉතා වැදගත් තැනක් ගනී. මල්වතු අස්ගිරි උභය මහාවිහාරීය අතිපූජ්‍ය මහානායක හිමිපාණන් වහන්සේලාගේ හා ජේෂ්ඨාචාර නායක ස්වාමීන්වහන්සේගේ අනුශාසනා ලබාගෙන පුද සිරිත් කඩ නොකර, මනාව සංවිධානය කොට, සැදැහැවතුන්ගේ ශ්‍රද්ධා භක්තිය වැඩි වර්ධනය වන අයුරින් එම මංගලෝත්සව පැවැත්වීම දියවඩන නිලමේවරුන් විසින් මෙතෙක් අඛණ්ඩව ඉටු කිරීම සැමගේ බුද්ධාලම්බන ප්‍රීතියට හේතුවේ.

ශ්‍රී දළදා මාළිගාවේ නැකැත් මෙහෙකරුවාල විසින් සාදා දෙනු ලබන සුබ නැකැත් මුහුර්තිය අනුව (නොවැම්බර් මාසයේ) ඉල් පුර පසළොස්වක පොය දිනයේදී ප්‍රදීප පූජා පැවැත්වීම හා පෙරහර මංගල්ලය සිදුකිරීම සාමාන්‍ය සිරිතය. මෙවර වාර්ෂික කාර්තික පූජා මංගල්ලය රාජ්‍ය වර්ෂයෙන් 2014 ක් වූ නොවැම්බර් මස 06 වන දා අපරභාග 6.12 ට උදාවූදියකිමුකිය ශ්‍රී දන්තධාතු මන්දිරය සුමුඛ කොට ඇති විහාර දේවාලයන්හි පැවැත්වේ. ඒ සඳහා අවශ්‍ය තෙල් බෙදා දීම වර්ෂ 2014 ක් වූ නොවැම්බර් මස 03 වන සඳු දින පස්වරු 3.10 ට නාථ දේවාල භූමියේ සිදුකෙරිණ.

කාර්තික මංගල්ලය දින පහන් දැල්වීමට අවශ්‍ය තෙල් බෙදා දීම සිදුකෙරෙනුයේ ශ්‍රී දළදා මාළිගාවෙනි. කාර්තිකේය දිනට පෙර පෙරහරකින් තෙල් නැලි 103 ක් පමණ ශ්‍රී දළදා මාළිගාවේ සිට නාථ දේවාල භූමියට රැගෙන ගොස් එහිදී කාර්යකරවන කෝරාළ ඇතුළු නිලකරුවන් විසින් කාර්තික වට්ටෝරුව අනුව සතර දේවාලය ඇතුළු අනෙකුත් සිද්ධස්ථාන හා දේවාලවලට තෙල් බෙදාදීම සිදුකෙරේ. ඉල්පොය දිනට පෙර දින ගම් දනයේ විදානේවරු ලවා වැවිසිටින මාලිගාව විසිතුරු ලෙස ගොක්කොළින් සරසවා පුර පෝය දින සුබ මුහුර්තියට අනුව පහන් දල්වා මාළිගා චතුරශ්‍රය වටා කොඩි පේනත්, අලි ඇතුන්, බෙරකරුවන් හා නැට්ටුවන් සහිත කුඩා පෙරහරක් පැවැත්වීම චාරිත්‍ර වශයෙන් සිදුකෙරේ. මෙම පෙරහරේ දියවඩන නිලමේතුමා ගමන් කරන්නේ නැති අතර කාර්ය කරවන කෝරාළ කරඬුව භාරව පෙරහරේ ගමන් කරයි. මේ දිනම කාර්තික වට්ටෝරුවේ සඳහන් අනෙකුත් විහාරස්ථාන හා දේවාලවල ද ප්‍රදීප පූජා පැවැත්වීම සිදුවේ.

මෙවර ද චිරාගත සම්ප්‍රදායානුකූලව පැවැත්වෙන වාර්ෂික කාර්තික පූජා පෙරහර මංගලෝත්සවය, ශ්‍රී දළදා වහන්සේ උදෙසා සිදුකෙරෙන උත්තම වාර්ෂික පූජාවක් වශයෙන් අති උත්කර්ෂවත් ලෙස පැවැත්වීමට වෙහෙසෙන දියවඩන නිලමේ ප්‍රදීප් නිලංග දෑල මැතිතුමා විසින් පියවර ගෙන තිබීම බෞද්ධ සැදැහැවතුන්ගේ බුද්ධාලම්බන ප්‍රීතිය වඩා වර්ධනය වීමට හේතු වේ.

**කේ. මිගහකුඹුර**

# අපිරිසිදු තැන්වලට දෙවියන් වඩිනවාද?

දේවාලයන්හි නොයෙකුත් හාස්කම් පානවා යැයි ප්‍රචලිත බොහෝ ස්ථාන අද වන විට රට පුරා විසිර පවතී. ඒ අතර අංජනම් බලන, නිමිති අල්ලන, සාස්තර කියන හා මළවුන් ගෙන්වනවා යැයි පවසන ස්ථානද වේ.

මෙවැනි බොහෝ ස්ථාන සම්බන්ධයෙන් දකිනට හැකි පොදු ලක්ෂණයක් වන්නේ ඒ බොහෝ ස්ථානවල ඇති අපිරිසිදු බව හා අපිළිවෙළය.

පන්සලක් වැනි පූජනීය ස්ථානයකදී සිතට දැනෙන මානසික සුව සහනය කිසිවිටෙකත් එවැනි තැනකදී අත්විඳිය හැකි නොවේ. ජරාජීර්ණ නිවාස සහ කොටනැඹිලි අතර ඉතා සුළු ඉඩකඩක පවත්වාගෙන යන මෙවැනි ස්ථාන බොහෝ විට අඩු ආදායම්ලාභී කලාපවල පිහිටා ඇති බවක් සඳහනට හැකිය. කලාතුරකින් හෝ එවැනි ස්ථානයක් පුද්ගල මැදුරක් ආශ්‍රයේ පවත්වාගෙන යන බවක් දකිනට නොහැකිය. එහෙත් පවත්වාගෙන යන ස්ථානයේද, කිසිදු ආලෝකමත් බවක් නැත. කොතරම් කාලයක් එවැනි ගුප්ත දේ තුළින් ආදායම් ඉපැයුවද ඒ තුවුවරුන් හෝ සිලිගත හැකි තරමේ ධනයකට හිමිකම් කියන ආකාරයක්ද දකිනට හැකි නොවේ.

පෙර කී ස්ථාන සම්බන්ධයෙන් මිනිස් කෙනෙකුගේ සිතට නැගෙන කුතුහලය වන්නේ පිරිසිදු බවේ සංකේතයක් ලෙස සලකන දෙවිවරුන්ගේ ඇල්ම, බැල්ම, ආකර්ෂණය කෙසේනම් එවැනි අපවිත්‍ර ස්ථාන කරා යොමුවේද යන්නය. ඒ අනුව එවැනි ස්ථානවල සිදුකෙරෙන්නේ කෙරාටික, බොරු, වංචාවන් යයි කෙනෙකුට සිතුනි නම් එහිද වරදක් නැත.

ඇත්ත, සෑම නම් එසේ නොවේ. [illegible] ඒ ඉතා පහත් පෙළේ අමනුෂ්‍ය කොට්ඨාස සමඟනි.

දේවාලයන්හි සාස්තර කියන බව පවසන සමහර අයෙකු තුළ ඒ පවසන ආකාරයේ කිසිදු හැකියාවක් නොතිබිය හැකිය. එවැනි අයගේ එකම අරමුණ [illegible]

කළ දේවාලයකට වුවද අමනුෂ්‍ය ආකර්ෂණය ලබාගැනීමෙන් එය පවත්වාගෙන යන අයට සාස්තර කීමට යම් හැකියාවක් ලැබිය හැකිය.

එහෙත්, එවැනි පහත් පෙළේ අමනුෂ්‍යයන්ගේ උදව්වෙන් පවසන ශාස්ත්‍රයකින් බොහෝවිට සත්‍යය පැවසෙන්නේ නැත. ශාස්ත්‍රය අසන අය මංමුළාවන හෝ නොමඟ යැවෙන ආකාරයේ යන්ත්‍රයක් එවැනි අමනුෂ්‍යයන්ගේ මාර්ග යෙන් පැවසිය හැකිය.

ආටානාටිය සූත්‍රයේ සඳහන්ව ඇත්තේ යක්ෂ, ප්‍රේත ආදී අමනුෂ්‍යයන්ගේ පස් පව්, දස අකුසල්වලට බොහෝ ප්‍රියකරන කොට්ඨාස බවය. ඒ අනුව එවැනි අමනුෂ්‍ය කොට්ඨාස කිසිවිටෙකත් සත්‍යය පවසන බවක් විශ්වාස කළ නොහැකිය. ඒ අනුව එවැනි දේ පසුපස යන අය නැම අනිත්‍ය පිරිහීමට ලක්වෙනවා හැරුණු විට ලබන සුගතියක් නැති බව පැවසිය යුතුය.

දේවාලයන්හි නොයෙක් දේ කරනවා යැයි පවසමින් දේවාල පවත්වාගෙන යන අය කෙතරම් මුදල් ඉපැයුවද ආර්ථික අතින් සමෘද්ධිමත් නොවන බව සඳහන් කළෙමු. එලෙසම ඔවුන්ගේ ජීවිතවලට අත්වන වෙනත් යහපතක්ද නොතිබිය හැකිය. එලෙස උපයන මුදල් ඔවුන් අතර නොයෙදෙන්නාවූද නොයෙක් හේතුකාරක යෙදෙන ආකාරයක් දකිය හැකිය. එක්කෝ ඔවුන්ගේ පවුලේ සාමාජිකයන්ගේ අසනීප තත්ත්වයන්, පවුලේ එකිනෙකා අතර අඩදබර, මත පැටලී විනාශ වීම [illegible] ඒ අතර එවැනි පවුල්වල අකල් මරණ සිදුවූ අවස්ථාද වේ.

එවැනි අවාසනාවන්ත තත්ත්වයන්ට හේතුවිය හැක්කේ පෙර කී ආකාරයේ පහත් පෙළේ අමනුෂ්‍යයන්ගේ ඇල්ම, බැල්ම, ආකර්ෂණය එවැනි ස්ථානවලට හා ඒවා වාසය කරන්නන්ට යොමුවීම නිසාය.




මහාචාර්ය දයා අමරසේකරයන්ගේ අදහස් ඇසුරින් සකස් කළේ උපේඛා ප්‍රියංගනී [illegible]

# ඔබ යන්නේ - කොයි පාරේ

ගිහි විනය යන නාමයෙන් හඳුන්වනු ලබන සිඟාලෝවාද සූත්‍රයේදී බුදුරජාණන් වහන්සේ විසින් පුද්ගලයකුගේ මෙලොව පරලොව යන උභය ලෝකාර්ථ සාධනය විෂයෙහි අතිශය වැදගත් ඉගැන්වීම් රැසක් පිළිකොට තිබේ. එහිදී "භෝග විනාශ මුඛ හය" යනුවෙන් හඳුන්වනු ලබන "ෂ" වැදෑරුම් විනාශ මුඛයනට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. ඒ අනුව සිඟාලෝවාද සූත්‍රයේදී බුදුරජාණන් වහන්සේ විසින් සිඟාලක තරුණයාට සතර කර්මක්ලේශ හා සතර අගතියට පසුව මෙම භෝග විනාශ මුඛ හය පිළිබඳ මෙසේ කරුණු ඉදිරිපත් කරයි. එම භෝග විනාශ මුඛ හය මෙසේය.

1. මත්පැන් පානය සුරාමේරය මජ්ජපමාදට්ඨානානුයෝගෝ වෙ යහපති පුත්ත, භෝගානං අපාය මුඛ.
2. අවේලාවේ වීදි සංචාරය විකාල විසිඛාචරියානුයෝගෝ භෝගානං අපාය මුඛ.
3. සමජ්ජවලට යෑම සමජ්ජාභිචරණ භෝගානං අපාය මුඛ.
4. සූදුව ජූතප්පමාදට්ඨානානුයෝගෝ භෝගානං අපාය මුඛ.
5. පවිටු මිතුරන් ඇසුර පාපමිත්තානුයෝගෝ භෝගානං අපාය මුඛ.
6. අලසකම ආලස්සානුයෝගෝ භෝගානං අපාය මුඛ.



මෙම් පළමුවැන්න භෝග විනාශ මුඛය නම් සුරාමේරය මජ්ජපමාද ද්‍රව්‍යපානය යන්නයි. මෙහි අර්ථය වන්නේ මිදියට හා ප්‍රමාදයට හේතුවන සුරාව හා මේරය පානීමට නොකර සිටින්න යන්නයි. කෙසේයම් ආකාරයක සුරාවකින් හෝ මේරයකින් මේවා සිදුවන්නේ මදය හා ප්‍රමාදය ආදීනව දෙක ඇතිවීමයි. ඒ කාරණා දෙකෙන්ම සිදුවන්නේ ධනය විනාශ වීමයි. මෙලෙස විනාශ මගින් ක්‍රියාකිරීම නිසා පහත සඳහන් අනර්ථ රැසටද ගොදුරු වන බව බුදුරජාණන් වහන්සේ පෙන්වා දෙයි.

1. බලා සිටියදී ධනය විනාශ වේ.
2. මිනුට නොයෙක් කලහවලට පැටලෙන්නට සිදුවේ.
3. ඔහු රෝගයන්ට ගොදුරු වේ.
4. ඔහු පිළිබඳ අපකීර්තිය වැඩිවෙයි.
5. ඔහු ලැජ්ජා නැත්තෙක් වෙයි.
6. ඔහුගේ ප්‍රඥාව දුබල වේ.

මෙම් සඳහන් වන දෙවන භෝග විනාශ මුඛය වන්නේ අවේලාවේ වීදි සංචාරයයි. මෙහිදී අවේලාවේ වීදි සංචාරය ලෙස හැඳින්වෙන්නේ රාත්‍රී කාලයේ වීදි සංචාරය යයි වරදවා වටහා නොගත යුතුය. එය ඊට වඩා පුළුල් අර්ථයෙන් යෙදෙන්නකි. රජය මගින් ඇඳිරි නීතිය පනවා ඇති අවස්ථාවක නොහොත වීදි සංචාරය කරයිද එය අයත් වන්නේ අවේලාවේ වීදි සංචාරය කිරීමකටයි. මෙසේ ගමන් කරන්නෙකු බොහෝ අවස්ථාවලදී බොහෝ දෙනාගේ සැකයට, තර්ජනයට භාජනය වීය හැක. විශේෂයෙන්ම අනපේක්ෂිත කරදර, බාධකවලට මුහුණ දීමට ඔහුට සිදුවේ. මෙසේ අවේලාවේ වීදි සංචාරය කරන්නෙකුට මුහුණ පාන්නට වන අනර්ථයන්ද සූත්‍රයේ මෙසේ දක්වා තිබේ.

i. තමා රැකවරණ රහිතයෙක් වේ.
ii. අඹුදරුවන් රැකගන්නට බැරි වේ.
iii. වස්තුව රැකගන්නට බැරි වේ.
iv. (සොරකම්වල) සැකයට භාජනය වේ.
v. අසත්‍ය චෝදනාවලට පත්වේ.
vi. බොහෝ දුක් කරදරවලට මැදිවේ.

සිඟාලෝවාද සූත්‍රයේ සඳහන් පරිදි තුන්වැනි භෝග විනාශ මුඛය නම් "සමජ්ජවලට යාමයි". මෙය වර්තමානයේ "සැණකෙළි" වශයෙන් හැඳින්වෙන්නේ දුරාචාරයටද මඟ පාදන එකරාශී වීම් ලෙස හැඳින්විය හැකිය. වර්තමානයේද ඉන්දියාවේ ආසියානයේ "මේලා" යනුවෙන් මෙබඳු උත්සව පවත්වන බව පෙනේ. එකල මගධ රාජ්‍යයේ කඳු මුදුන්වල "ගිරග්ග සමජ්ජ" යනුවෙන් මෙබඳු උත්සව ක්‍රියාත්මක වූ බවත් පැවිදි වීමට පෙර උපතිස්ස, කෝලිත දෙදෙනා ගියේ මෙබඳු සමජ්ජයකට බවත් බෞද්ධ සාහිත්‍යයට අනුව හැඳිනිය වේ. මෙබඳු සමජ්ජවලට ලොල්වීමෙන් ඇතිවන ආදීනවයන් 6 ක්ද උක්ත සූත්‍රයේ මෙසේ දක්වෙයි.

1. නැටුම් ඇත්තේ කොහේදැයි සොයන්නට වීම.
2. ගැයුම් ඇත්තේ කොහේදැයි සොයන්නට වීම.
3. වැයුම් ඇත්තේ කොහේදැයි සොයන්නට වීම.
4. කතා කියන්නේ කොහේදැයි සොයන්නට වීම.
5. තාලම් ආදිය ගසන්නේ කොහේදැයි සොයන්නට වීම.
6. හක් ආදිය පිඹින්නේ කොහේදැයි සොයන්නට වීම.

සිඟාලෝවාද සූත්‍රයේ බුදුන් වහන්සේ සිඟාලක ගෘහපති පුත්‍රයාට දේශිත සිව්වන භෝග විනාශ මුඛය නම් "සූදුවට ලොල් වීමයි". වර්තමානයේදීද මෙම සූදුව මහා පරිමාණයෙන් සමාජයේ ක්‍රියාත්මක වේ. ඇතැම්විට කැසිනෝ සමාජශාලා වැනි ස්ථාන නිසා පුද්ගලයා මුළු ජීවිත කාලයේදී උපයා සපයා ගන්නා ධනය එක සුළු වේලාවකින් තුළදී නැති කරගන්නා අවස්ථා ඇත. සූදුවට ලොල් වූ පුද්ගලයන් සූදුවෙන් ගලවා ගැනීම ඉතා අසීරුය. සූදුවෙන් යම් ජයග්‍රහණයක් ලදහොත් එම ජයග්‍රහණයෙන් උද්දාමයට පත්ව ඔහු දිගින් දිගටම සූදුව හා ඇලෙයි. එසේම සූදුවෙන් පරාජයට පත්වුවහොත් තමාට සිදුවූ පාඩුව යළි පිරිමසා ගැනීමට ඔහු දිගින් දිගටම සූදුවේ යෙදෙයි. ඒ අනුව සූදුවට ලොල් වීමේ ආදීනව 6 ක්ද බුදුන් වහන්සේ මෙසේ දේශනා කර තිබේ.

1. දිනීම නිසා අනුන්ගේ වෛරයට භාජනය වේ.
2. පැරදීම නිසා තමා ශෝක වේ.
3. බලා සිටියදී ධනය විනාශ වේ.
4. අනුන් විසින් නොපිළිගන්නා පුද්ගලයෙක් බවට පත්වේ.
5. මිතුරන්ට හා සුළුපයන්ට පිළිකුල් වේ.
6. විවාහයට නුසුදුසු වේ.

සිඟාලෝවාද සූත්‍රයේදී බුදුන් වහන්සේ අනුදන වදාරා ඇති පස්වන භෝග විනාශ මුඛය නම් "පාප මිත්‍ර සේවනයයි". එහි ආදීනව දක්වීමේදී බුදුන් වහන්සේ එබඳු පවිටු මිතුරන් 6 දෙනෙකු පෙන්වා දෙයි. අද සමාජයේද මිත්‍ර වෙසින් සිටින මිත්‍ර ප්‍රතිරූපකයින් බහුලව සිටී. ඔවුන් සෑම විටම උත්සාහ කරන්නේ තමන්ගේ මිතුරාට යහපත් මාර්ගය පෙන්වීමට නොව තමන්ගේ මිතුරා දුශ්චරිතයට, පාපයට ඇදගෙන යාමටය. මේ එබඳු පාප මිතුරන් 6 දෙනා වෙයි.

1. ධූර්තයෝ (සූදු සොඬුවෝ)
2. ගෑනු බාලයෝ
3. රා සොඬුවෝ
4. මගඩියෝ
5. වංචනිකයෝ
6. සාහසිකයෝ

මෙයින් ධූර්තයන් සමඟ සූදු ක්‍රීඩාවෙහි නිරතව සිටින්නන් තමන්ගේ මිතුරා සූදුවට රැගෙන යාමටයි. ගෑනු බාලයන් හැම සෑම උත්සාහයක්ම යොදන්නේ තමාගේ මිතුරා ගණිකා නිවාස, වෛශ්‍යාගාර ආදියට රැගෙන යාමටයි. රා සොඬුවන් වෑයම් කරන්නේද තම මිතුරා සමඟ බොන් බීමටයි. මෙලෙසම අනෙක් මිත්‍ර ප්‍රතිරූපකයන්ද තමන්ගේ යහළුවා ඒ ඒ පාපයට රැගෙන යාමට වෑයම් කරයි. ඒ නිසා පාප මිත්‍ර සේවනයද භෝග විනාශ මුඛයක් ලෙස බුදුන් වහන්සේ දේශනා කර තිබේ.

"අධික ලෝභයෙන් යුතුව යුක්තියට පිටුපාන අය වැනසෙති - සේරිවාණිජ ජාතකය"

# 26

## මෘදුලක්ඛණ ජාතකයෙන් හෙළිවන කාම තෘෂ්ණාවෙන් මිදී කෙලෙසුන්ගෙන්

# සිත මුදවාගැනීමේ අනුහස්


ප්‍රඥාවට නිධාන වූ, මෝහඳුර දුරුකළා වූ, අප්‍රමාණ වූ නිවනට මඟ හෙළිකළා වූ, සියලු සතුන් කෙරෙහි සම මෛත්‍රිය පතළ කළා වූ, අප සම්මා සම්බුදුරජාණන්වහන්සේ ජේතවනාරාමයේ වැඩවසන සමයෙහි එක්තරා සංක්ලේශයක් අරභයා මෘදුලක්ඛණ ජාතකය දේශනා කොට වදාළ සේක. සැවැත්නුවර වාසය කළා වූ එක්තරා කුලපුත්‍රයෙක් බුදුරජාණන්වහන්සේගේ ධර්ම දේශනාව අසා පැහැදී ශාසනයට ලැදිව පැවිදිව සියලු ප්‍රතිපත්තීන් පිළිපැද්දාහ. ඒ භික්ෂූන්වහන්සේ හැමවේලාවෙහිම සිහින් නොහරින ලද කමටහන් ඇතිව එක් දවසක් සැවැත්නුවර පිඬුසිගා වැඩියහ. එවිට සර්වාභරණයෙන් සැරසුණු ස්ත්‍රියක් දැක සුභ වශයෙන් ඉන්ද්‍රියන් බිඳවමින් බැලූ සේක. එවිට ඒ භික්ෂූන්වහන්සේගේ අභ්‍යන්තරයෙහි ක්ලේශයන් ඇවිස්සී, සිත වෑයෙන් කොටන ලද කිරි ඇති ගසක් මෙන් විය. ඒ භික්ෂූන්වහන්සේ එතැන් සිට ක්ලේශයන්හි වසගව කායාශ්වාදයක් හෝ සිතෙහි ආශ්වාදයක් නො ලැබ බියට පත්ව වෙව්ලන මුවෙකු හා සමාන වූහ. ශාසනයේ ඇලුම් නොමැතිව කෙස් දික්ව ලොම් නිය කිළිටි වී ඇඳ සිටි සිවුරු කිළිටිව වැහැරී ගොස් සිටියහ. ඒ භික්ෂූන්වහන්සේගේ ඉන්ද්‍රියන් පිරිහී යනු දැක අනෙකුත් භික්ෂූන්වහන්සේ ඇවැත්නි, ඔබගේ ඇස් කන් නාසාදී ඉන්ද්‍රියන් පෙරසේ නොවෙයි. ඊට කාරණය කුමක්දැයි විමසූහ. එවිට ඒ භික්ෂුව පිළිතුරු දෙමින් ශාසනයෙහි ඇලුම් නැතිවීම නිසා මෙසේ විනැයි පැවසීය.

එවිට අනෙක් භික්ෂූහු මෙම භික්ෂුව බුදුරජාණන්වහන්සේ හමුවට කැඳවාගෙන ගියහ. ඒ දුටු බුදුරජාණන්වහන්සේ මහණෙනි, කුමක් නිසා මෙම භික්ෂුව මෙහි කැඳවාගෙන ආවේදැයි විමසූ සේක. එවිට ස්වාමීනි, මේ මහණ ශාසනයෙහි ඇලුම් නැත්තේ යැයි පවසයි යනුවෙන් දැන්වූහ. එය සැබෑවක්දැයි විචාළ විට, සැබෑවක් බව පැවසූ හෙයින්, ඔබ මෙසේ උකටලී කරවූයේ කවුරුන්දැයි විමසූ සේක. ස්වාමීනි, මම පිඬුසිගා ඇවිදින විට එක් ස්ත්‍රියක් කෙරෙහි ඉඳුරන් බිඳගතිමි. එවිට මගේ කෙලෙස් වලිත විය. එසේ කෙලෙස් සිත් පහළවීමෙන් ශාසනයට ඇලුම් නැති විය. එකෙණෙහි බුදුරජාණන්වහන්සේ ඒ භික්ෂුවට මහණ, ඔබ ඉන්ද්‍රියන් බිඳ විසභාගාලම්භනය සුබ වශයෙන් බලන බැවින් ක්ලේශයන් විසින් කම්පා කර ඇත. යමෙක් ක්ලේශයන්ගෙන් විසභාගාලම්භනයට පත්ව එය සුබ වශයෙන් ගන්නේ නම් ඔහු ආශ්චර්යමත් නොවේ.

අතීතයෙහි පඤ්චාභිඥාෂ්ටසමාපත්ති ලාභීව ධ්‍යාන බලයෙන් ක්ලේශයන් නසා පිරිසිදු නිර්මල සිත් ඇතිව අහසින් යන්නා වූ බෝධිසත්වයෝ පවා ඉන්ද්‍රියන් විසභාගාලම්භන වශයෙන් බැලීමෙන් ධ්‍යානයෙන් පිරිහී ක්ලේශයන්ගෙන් කම්පිතව මහත් දුකට පත්වූහ. මහාමාරුතයෙන් නොසෙල්විය හැකි මහාමේරු පර්වතය ද ඇතෙකු හා සමාන කුඩා පර්වතයක් ද සියක් යොදුන් උස ඇති දඹ ගස් ද මුලින් උදුරන්ට හැකි වූ මහාමාරුතය, ඉවුරු කැඩී ගිය ගංතෙරක ඇති කුඩා ගස් ඉදිරියේ පැකිලෙයි ද? මහාසාගරය වියළන්ට සමර්ථ වූ මාරුතයක් වැලෙහෙත්තක දිය වියළා නොසිටී ද? එබැවින් මෙසේ වූ බුද්ධි ඇති පිරිසිදු සිත්සතන් ඇති බෝධිසත්වයන් අඥාන කරන්නා වූ ක්ලේශයන් ඔබ කෙරෙහි කුමක් නිසා ලැජ්ජා වෙත්ද? පිරිසිදු සත්වයෝත් ක්ලේශයන් නිසා කිළිටි වෙති. උත්තම වූ යසසින් යුක්ත වූ සත්වයෝ ආයාසයට පැමිණෙති යනුවෙන් වදාරා, මෙහි අතීත කථාව ගෙනහැර දක්වා වදාළ සේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජකෙනෙකුන් රාජ්‍ය කරන කාලයෙහි අප මහා බෝසතාණන්වහන්සේ කසීරට එක් මහාසම්පත් ඇති බමුණු කුලයක උපන්හ. නැණවත්ව සියලු ශිල්පයෙහි පරතෙරට පැමිණ පඤ්චකාමය හැර දමා ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව අෂ්ටසමාපත්ති උපදවා ධ්‍යාන සැපයෙන් දවස් යවමින් හිමාල වනයෙහි වාසය කළහ. ඒ බෝධිසත්වයන්වහන්සේ එක් කලෙක ලුණු ඇඹුල් සෙවීම සඳහා හිමාල වනයෙන් බැස, බරණැස් නුවරට පැමිණ රජ උයනෙහි වාසය කොට දෙවෙනි දවසෙහි පිළි වැහැරී ගිය නිසා අඳනය, පොරවනය දෙක මනාව ඇඳ පොරවාගෙන අඳුන් දිවිසමක් ඒකාංශ කොට තබා ඉසකේ දරණු කොට බැඳ කෙණ්ඩියක් රැගෙන බරණැස්නුවර පිඬුසිඟිමින් රජතුමන්ගේ මාලිගා දොරටුවට පැමිණියේය. රජ්ජුරුවෝ ඒ තපස්වීන්ගේ ඉරියව්හි පැහැදී සමීපයට කැඳවාගෙන රසවත් ආහාර පානාදියෙන් පිනවා අනුමෝදනා බණ අසා ඒ බෝධිසත්වයන්ට රජ වනෝද්‍යානයෙහිම වාසය කිරීමට ආරාධනා කළේය. ඒ බෝධිසත්වයන්වහන්සේ ආරාධනාව පිළිගෙන රජගෙයි වළඳා රජ කුලයට අවවාද කරමින් උද්‍යානයෙහි සොළොස් අවුරුද්දක් වාසය කළහ.

එක් දවසක් රජ්ජුරුවෝ ප්‍රත්‍යන්ත ජනපදයක ඇති වූ කැරැල්ලක් සංසිඳුවනු පිණිස යන අතර මෘදුලක්ඛණ නම් තම අගමෙහෙසිය අමතා, මගේ තපස්වීන්වහන්සේට අප්‍රමාදව උපස්ථාන කරන්නැයි අණ කොට ගියේය. මහා බෝසතාණන්වහන්සේ රජ්ජුරුවන් නොමැති වුවද රජගෙට ගොස් දන් පිළිගැනීමට පුරුදුව සිටියහ. එක්දිනෙක අගමෙහෙසිය තපස්වීන්වහන්සේ අද ප්‍රමාද වී පැමිණෙනැයි සිතා සුවඳ පැනින් නා සල්වේලා තිබූ බැවින් සියලු විභූෂණාලංකාරයන්ගෙන් සැරසී මතුමහල් තලයෙහි බෝධිසත්වයන් වැඩම කරන මඟ බලාගෙන ඉහළ මාලයේ රැඳී සිටියාය. බෝධිසත්වයන්වහන්සේ වළඳන්ට වේලාව සලකා ධ්‍යානයෙන් නැගී ආකාශයෙන්ම රජගෙට පැමිණියේය. මෘදුලක්ඛණ මෙහෙසිය බෝධිසත්වයන්ගේ සිවුරේ සවනින් හැඳුණු හඬ අසා තපස්වීන්වහන්සේ වැඩිසේකැයි සිතා වහා නැගිට වැද සිටියාය. වහා නැගිටි බැවින් සිනිඳුගේ මටසිළිටු සළුව වැටිණි. තාපසයන් මෙය දැක විසභාග රූපාලම්භනය තුළින් ඉඳුරන් බිඳගෙන සුබ වශයෙන් බැලූහ. එවිට බෝධිසත්වයන්ගේ අභ්‍යන්තරයෙහි ක්ලේශයන් චංචල වූහ. කිරි ඇති ගසකට කෙටුවක් වැනි විය. එකෙණෙහිම මෙසේ කෙලෙස් සිත පහළ වීමත් සමඟ බෝධිසත්වයන්ගේ ධ්‍යානයත් අතුරුදන් විය. පියාපත් සිඳුණු කපුටෙක් මෙන් විය. බෝධිසත්වයන් සිටගෙනම ආහාර පිළිගෙන නොවළඳාම, කෙලෙසින් කම්පිතව



ප්‍රාසාදයෙන් බැස උයනට ගොස් පන්සලට පිවිස පෙරුමැස්ස යට ආහාරය කබා විෂභාගලම්භනයෙන් බැඳී කෙලෙස් ගින්නෙන් දැවෙමින් නිරාහාර බැවින් වියළෙමින් සත්දවසක්ම පෙරුමැස්සෙහිම නිදා සිටියේය.

සත්වන දවස රජතුමා පසල්දනව්ව ජයගෙන නුවරට පැමිණියේය. නුවර පැදකුණු කොට මාලිගාවට නොගොස්ම තපස්විනිවහන්සේ දැක එන්නෙමැයි සිතා පන්සලට ගියේය. එහිදී තපස්විනිවහන්සේ නිදාසිටි තැන දැක අසනීපයක් වෙතැයි සලකා පන්සලෙහි කසල අරවා ස්වාමීනි, අපහසුව කිමෙක්දැයි විචාළේය. එවිට බෝධිසත්වයන්වහන්සේ රජතුමනි, මට අනෙක් අපහසුවක් නැත. ක්ලේශ වසඟයෙන් පිළිබඳ සිත් ඇතිවීම්යි කීවේය. ආර්යන්වහන්ස, ඔබවහන්සේගේ සිත කවුරුන් කෙරෙහි බැඳුණේදැයි විචාළේය. මහරජතුමනි, මෘදුලක්ඛණාවන් කෙරෙහි පිළිබඳ සිත ඇතිවීනැයි පැවසීය. එවිට රජ්ජුරුවෝ ස්වාමීනි, මම ඔබවහන්සේට මෘදුලක්ඛණාව පාවා දෙමියි කියා තාපසයන් රැගෙන මාලිගාවට ගොස් බිසව තපස්විනට පාවාදුන්හ. එසේ පාවාදෙමින් රජතුමා මෘදුලක්ඛණාවන්ට ඔබ විසින් ඔබගේ බලයෙන් මේ තපස්වින් රැකිය යුතුයි කීවේය. ස්වාමීනි, තපස්වින් රකිමියි කීබිස තාපසයන් සමඟ මාලිගාවෙන් පිටත් වූවාය.

පිටත්වන අතරතුරෙහි මෘදුලක්ඛණා බිසව තපස්වින් අමතා, රජුට කියා ගෙයක් ඉල්ලාගෙන එන්නැයි පැවසුවාය. තාපසයාත් එබස් අසා රජුගෙන් ගෙයක් ඉල්ලා සිටියේය. රජ්ජුරුවෝ මිනිසුන්ට ශරීර කෘත්‍යය සපයන වැසිකිළියක් හා සමාන ගෙයක් දුන්නේය. තාපසයෝ බිසව කැඳවාගෙන ඒ ගෙට ගියේය. බිසව ඒ ගෙට වදින්ට මැලිව සිටියාය. කුමක් නිසා ගෙට වදින්ට මැලිදැයි විමසූ විට අපවිත්‍ර නිසාවෙනියි කීවාය.

දැන් කුමක් කළ යුතුදැයි විමසූ විට ගෙයි කසළ පිරිසිදු කරවන්නැයි රජුගෙන් උදැල්ලක් හා පෙට්ටියක් ගෙන්වාගෙන අපවිත්‍රය හා කසළ ඉවත් කරන ලෙසත්, ඇඳක්, පුටුවක්, පහනක්, ඇතිරියක්, පැන් ආදිය ගෙන එන ලෙසත්, රජුට කියා ඒවා ලබාගෙන එන ලෙසත් දන්වා සිටියාය. එවේලේ බෝධිසත්වයන් කළයක් අරගෙන පැන් ගෙනවුත් තබා, රජුට දන්වා අනෙකුත් සියල්ල ලබාගෙන ගෙයි යහනෙහි ළඟින්ට පටන් ගත් විට, බෝධිසත්වයන්ගේ රැවුලෙන් අල්ලා මිරිකා, තොප ශ්‍රමණ බවත්, බ්‍රාහ්මණ බවත් නොසිතා මා සමඟ නිදාගන්නට එන්නේදැයි කියා ඇද දැමුවාය.

මහබෝසතාණෝ එවේලෙහි සිත සිහි ඇතිව මම මෙපමණ කල් කාමයෙහි අඥාන ලෙස බැඳී ගියෙමි. කෙලෙස් වලින් මා අඥාන කොට මුළා කරන ලදී. මේ තෘෂ්ණාව වඩ වඩා ගෙනයන්නට වුවහොත් මතු ආත්මයේදීත් සතර අපායෙන් හිස ඔසවීමට නොලැබෙනු ඇත. ඒ නිසා මා අදම මෘදුලක්ඛණාවන් රජ්ජුරුවන්ට පාවාදී හිමාල වනයට වදින්නට කැමැත්තෙමැයි සිතා, මෘදුලක්ඛණාව කැඳවාගෙන ගොස් රජතුමනි ඔබගේ බිසව ඔබටම සුදුසුය. මට ප්‍රයෝජනයක් නැත. තෘෂ්ණාව බැඳුණු සමණකැයි කියා රජුට බිසව පාවාදුන්නේය. ඔබගේ මෘදුලක්ඛණාව ලබද්දී ගෘහ තෘෂ්ණාව, උපකරණ තෘෂ්ණාව, උපභෝග තෘෂ්ණාව ආදී වූ නොයෙක් තෘෂ්ණාවන් මගේ සිතේ වැඩිනි. ඉදිරියේදීත් මේ තෘෂ්ණාවන් වැඩෙනු ඇත. එසේ හෙයින් සතර අපායෙහි වැටීමට හේතුවන මේ තෘෂ්ණාවන්ගෙන් මිදී ඔබගේ බිසව ඔබම පාවාගන්නැයි කියා කීවේය. එකෙණෙහිම තමාගේ නැතිවූ ධ්‍යානය උපදවාගෙන අහසෙහි හිඳ රජුට අවවාද දී ධර්ම දේශනා කොට අහසින්ම හිමාල වනයට ගොස් නැවත මිනිස් වාසයක් කරා නොපැමිණියේය. අනතුරුව මෛත්‍රී, කරුණා, මුදිතා, උපේක්ෂා යන සතර බ්‍රහ්ම විහාරයන් භාවනා කොට විහාරයෙන් නික්ම බ්‍රහ්ම ලෝකයෙහි උපන්නාහුය.

බුදුරජාණන්වහන්සේ මේ දේශනාව ගෙනහැර දක්වා චතුරාර්ය සත්‍යය ප්‍රකාශ කොට වදාළ සේක. මෙම චතුරාර්ය සත්‍යය ධර්ම දේශනාව කෙළවර ඒ උකටලී වූ භික්ෂුව සෝවාන්ඵලයෙහි පිහිටියේය. බුදුරජාණන්වහන්සේ පූර්වාපර සන්ධි ගළපා මෘදුලක්ඛණ ජාතකය නිමවා වදාළ සේක. එකල රජු නම් ආනන්ද ස්ථවිරයන්වහන්සේය. මෘදුලක්ඛණාව නම් උප්පලවර්ණා මහතෙරණින්වහන්සේය. එසමයෙහි තපස්වින් නම් සම්බුදු වූ මම ම යැයි වදාළ සේක.

මෙම ජාතක දේශනාව තුළින් කෙලෙසුන් කෙරේ තෘෂ්ණාව උපදවා බැඳී යාමෙන් පිරිසිදු සිත් ඇත්තවුන්ගේ පවා සිත් ක්ලේශයන්ගෙන් බැඳී යන ආකාරය මැනවින් විස්තර වෙයි. ඒ බව මැනවින් දැන නිකෙලෙස් සිතක් ඇති කර ගැනීමෙහි අගය වටහාගෙන නිවන් මග පසක් කර ගැනීමට අදිටන් කරගත යුතුය.

**සේ. මීගහකුඹුර**



# බෝධි වන්දනාවේ උපත සහ ඒ ගැන දත යුතු තවත් කතා

ශ්‍රාවක බෝධිසත්වයන්ට හා ප්‍රත්‍යේක බෝධිසත්වයන්ට කොතැනකදී වුවද ඒ තත්ත්වයට පැමිණිය හැකිය. රහත් වීමට පසේ බුදු වීමට නියමිත තැනක් නැත්තේය. මහා බෝධි සත්වයන්ට එසේ කොතැනකදී හෝ බුද්ධත්වයට නොපැමිණිය හැකිය. මිනිස් ලොවෙහිම මිස දිව්‍යලෝක බ්‍රහ්මලෝක නාගලෝකාදියෙහි ලොව්තුරා බුදු බව නොලැබිය හැකිය. එය ලැබිය හැක්කේ මිනිස් ලොවෙහිමය. එහිද සෑම තැනකදීම බුද්ධත්වයට නොපැමිණිය හැකිය. සියලු මහා බෝධි සත්වයන් බුදු බව ලබන විශේෂ ස්ථානයක් මේ පොළොවෙහි ඇත්තේය. ඒ විශේෂ භූමි භාගයට බෝධි මණ්ඩලයයි කියනු ලැබේ. එය අන් තණපතක්වත් නැති රිදී පැහැති වැලියෙන් වැසුණු සම භූමියක්වද ඒ බිමට කිසිවකුට ඇතුළු විය නොහෙන පරිදි එය වටා ප්‍රාකාරයක් මෙන් ගස් වැල් වැවී ඇති තැනක්වද දෙවියකුට, බ්‍රහ්මයකුට වුවද එයට උඩින් යා නොහෙන අනුහසක් ඇති තැනක්වද කාලිංග බෝධි ජාතකයේ කියා ඇත. එය අචල භූමියක්වද එහි කියා තිබේ. එය දඹදිව මධ්‍යදේශයේ සේනානිපුර නම් ගමට නුදුරු තැනකි.

සියලුම බෝධිසත්වයන් වහන්සේලා ලොව්තුරා බුදු බව ලබන්නේ යම්කිසි ගසක් මුලදීය. සිද්ධාර්ථ කුමාරයන් මව් කුසින් බිහිවූ දිනයේම ඉපැද සී එය භූමියෙහි ඇසටු ගසක් පැන නැගිණ. එය පැන නැගුණේ උපදින්නන්ගේ ලොව්තුරා බුදුවීමට ආධාර වීම සඳහාය. ඒ අනුව සියලුම මහා බෝධිසත්වයන්ට උපදින දිනයේම බෝධිය පැන නගින බව කිසිව යුතුය. අප ගෞතම බුදුරජාණන් වහන්සේගේ බෝධිය ඇසටු ගසය. ඇසටු ගස මුල බුදු වූ අන් බුදුවරයකු නැති සඳහන් වී ඇත. ඒ ඒ බුදුවරුන්ට බෝධි වනු පිණිස නොයෙක් වර්ගවල ගස් පැන නගී.

දීපංකර බුදුරදුන් බුදු වූයේ පුළිල ගසක් මුලය. කොණ්ඩඤ්ඤ බුදුරදුන් බුදු වූයේ සාල කල්‍යාණි නම් ගසක් මුලය. මංගල බුදුරදුන් බුදු වූයේ නා ගසක් මුලය. සුමන, රේවත, සෝභිත බුදුවරුන් බුදු වූයේද නාගස මුලමය. අනෝමදස්සි බුදුරදුන් බුදු වූයේ කුඹුක් ගස මුලය. පදුම, නාරද යන බුදුවරුන් බුදු වූයේ මහාසෝණ නම් ගස මුලය. පදුමුත්තර බුදුරදුන් බුදු වූයේ සල් ගසක් මුලය. සුමේධ බුදුරදුන් බුදු වූයේ මහ නී ගසක් මුලය. සුජාත බුදුරදුන් බුදු වූයේ උණ ගසක් මුලය. පියදස්සි බුදුරදුන් බුදු වූයේ කුඹුක් ගසක් මුලය. අත්ථදස්සි බුදුරදුන් බුදු වූයේ සපු ගසක් මුලය. ධම්මදස්සි බුදුරදුන් බුදු වූයේ රත්කරව් ගසක් මුලය. සිද්ධත්ථ බුදුරදුන් බුදු වූයේ කිණිහිරිය ගසක් මුලය. තිස්ස බුදුරදුන් බුදු වූයේ පියාගසක් මුලය. ඵුස්ස බුදුරදුන් බුදු වූයේ නෙල්ලි ගසක් මුලය. විපස්සි බුදුරදුන් බුදු වූයේ පළොල් ගසක් මුලය. සිඛී බුදුරදුන් බුදු වූයේ ඇටඹ ගසක් මුලය. වෙස්සභූ බුදුරදුන් බුදු වූයේ සල් ගසක් මුලය. කකුසඳ බුදුරදුන් බුදු වූයේ මහරි ගසක් මුලය. කෝණාගමන බුදුරදුන් බුදු වූයේ දිවුල් ගසක් මුලය. කාශ්‍යප බුදුරදුන්



"[illegible]"



බුදු වූයේ නුග ගසක් මුලය.

සවසක් දුෂ්කර තපසක් කළා වූ අප මහ බෝසතාණන් වහන්සේ එක් වෙසක් මස පුණු පොහෝ දිනයක අජපාල නම් නුග රුකක් මුල වැඩ හිඳ සුජාතා නම් සිටු දුව විසින් පිළිගන්වන ලද කිරි බතක් වළඳා සමීපයෙහි වූ සල් වනයෙහි නොයෙක් සමාපත්තිවලට සමවදිමින් සවසක් සුවයෙන් කල් ගෙවා සවස් කාලයේ දෙවියන් විසින් පිළියෙළ කරන ලද මඟින් බෝධිය කරා වැඩම කළහ. පෙරමඟ ආවා වූ තණ ගෙන යන සොත්ථිය නමැත්තෙක් උන්වහන්සේට කුඩා තණ මිටි අටක් පිළිගැන්විය. ඒවා ගවයන්ට කැවීමට ගෙන යන තණ නොව මෙට්ටයක් වශයෙන්, දැදිරියක් වශයෙන් බිම අතුරා හිඳීමට හා සැතපීමට පාවිච්චි කරන වියළි තණය. සොත්ථිය බමුණා බෝසතාණන් වහන්සේට ඒවා පිළිගැන්වූයේද බිම අතුරා ඒවා මත වැඩ සිටීම සඳහාය. දඹදිව කවුසන් බොහෝ සෙයින් පාවිච්චි කරන්නේ තණ ඇතිරිය. බෝසතාණන් වහන්සේ ඒ තණ ගෙන ගොස් බෝධීන් වහන්සේගේ නැගෙනහිර පැත්තේ බිම සැලූහ. ඒවායින් තුදුස් රියන් අසුනක් සැදිණ. උන්වහන්සේ බෝධියට පිට දී නැගෙනහිර දිශාවට මුහුණ ලා වැඩ සිටියහ. උන්වහන්සේට බාධා කිරීමට පැමිණි වසවත් මරු හිරු බැසීමට කලින්ම පැරදී පලා ගියේය.

ඉක්බිති මහ බෝසතාණන් වහන්සේ එහිම වැඩ සිට භාවනා කොට රාත්‍රියේ පළමුවන කොටසෙහි තමන් වහන්සේගේ අතීත ජාති පිළිබඳ දැකීමට සමත් පුබ්බේනිවාසානුස්සති ඥානය උපදවා ගත් සේක. රාත්‍රියේ මැද කොටසෙහි ලෝකයෙහි ඒ ඒ තැන මැරෙන උපදින සත්වයන් දක්නට සමත් දිව්‍යචක්ඛුඥානය උපදවා ගත් සේක. දොළොස් පදයක් ඇති ප්‍රතීත්‍ය සමුත්පාදයට ඥානය මෙහෙයවා එය අනුලෝම ප්‍රතිලෝම වශයෙන් මෙනෙහි කොට ඉක්බිති සංස්කාරයන් විදර්ශනා කොට අරුණෝද්ගමනයේ දී මාර්ග ඵල පිළිබඳ සකල ක්ලේශයන් ප්‍රහාණය කිරීමට සමත් අර්හත් මාර්ග ඥානය උපදවා ගත්හ. එය සමඟම සියල්ල දත හැකීමට සමත් සර්වඥතා ඥානය හා දසබල ඥානාදී සකල බුද්ධ ගුණයන් උපදවා ගත්හ. ඒ මහා බෝසතාණන් වහන්සේගේ බුදුවීමය. ලෝකෝත්තර මාර්ග ඥාන සතර හා සර්වඥතා ඥානය ඥානයන් අතුරෙන් සියල්ලට උසස් ඥානයෝය. එබැවින් ඒවා බෝධි නම් වෙයි. ඒවා ලබා ගත්, ඇති කර ගත් උත්තර පුද්ගලයාද ඥානයන් නිසා ලෝකයෙහි අග්‍ර පුද්ගලයා වෙයි. දෙවියන් සහිත ලෝකයා විසින් ගරු බුහුමන්, වැඳුම් පිදුම් කිරීමට සුදුසු පුද්ගලයෙක් වෙයි. එහෙයින් උන්වහන්සේට දෙව මිනිස්සුයෝද වැඳුම් පිදුම් කරති.

**බෝධි වෘක්ෂවල සර්වඥවරයන්ට ඒ තත්ත්වය ලැබීමට උපකාර වන ශක්තියක්,** අනුහසක් ඇත. බෝධියේ පිහිට නොලබා බුදුවිය නොහැකිය. මහ බෝසත්වරුන් බුදු වීම සඳහා බෝධි මූලයන්ට එළඹෙන්නේ ඒ නිසාය. ඒ අනුහස ඇත්තේ ශ්‍රී මහා බෝධියේ පමණකි. එයින්ද ඒ ගස වැඳුම් පිදුම් කිරීමට සුදුසු වේ. බුදුවරුන් පරිභෝග කළ වස්තූහුද වැඳුම් පිදුම් කිරීමට සුදුසුය. තථාගතයන් වහන්සේ බුදු වූ විගසම ඒ අසුනෙන් නො නැගී බෝධියට පිට දී සතියක්ම එතැන වැඩ සිටියහ. තථාගතයන් වහන්සේ එසේ පරිභෝග කිරීම නිසාද බෝධි වෘක්ෂය පූජනීය වස්තුවක් විය. මෙකල ඇති වෘක්ෂවලින් සියල්ලට වඩා උසස් වෘක්ෂය වන බැවින් ඒ වෘක්ෂය මහා බෝධි නම් විය. මහෝත්තම වූ තථාගතයන් වහන්සේගේ බෝධිය වූ බැවින්ද ශක්‍ර බ්‍රහ්මාදී මහත් වූ පුද්ගලයන්ගෙන් පුද ලබන බැවින්ද මහා බෝධි නම් විය.

## පළමුවන බෝධි පූජාව


ශ්‍රී මහා බෝධීන් වහන්සේට පළමු වන පූජාව කළේද තථාගතයන් වහන්සේ විසිනි. ලොව්තුරා බුදු බව ලැබූ භාග්‍යවතුන් වහන්සේ කෙළ ලක්ෂ ගණන් සමාපත්තීන්ට සමවදිමින් බෝධි මූලයේ වජ්‍රාසනයෙහි පළමුවන සතිය ගෙවා ඉන් නැගිට බෝධීන්



වහන්සේට උතුරු දිසින් සිට චතුරසංඛ්‍ය කල්ප ලක්ෂයක් පෙරුම් දම් පිරූ මාගේ අදහස මේ බෝධිමූලයේදී මස්තකප්‍රාප්ත වූයේය. මෙය නිකම්ම අත්හැර නොයා යුතුය. මා හට බුදු බව ලැබීමට උපකාර වූ මේ බෝධි වෘක්ෂයට හා ආසනයට පූජාවක් කළ යුතුය යි සිතා බෝධිය දෙසත්, වජ්‍රාසනය දෙසත් පසන් වර්ණයෙන් බබළන්නා වූ නෙත් දෙකින් ඇසිපිය නොහෙළාම සතියක් මුළුල්ලෙහි බලාගෙන සිටි සේක. එය නේත්‍ර පූජාවකි. එයට **අනිමිසලෝචන පූජාව** යයි කියනු ලැබේ. එය ඉතා දුෂ්කර පූජාවකි. සාමාන්‍ය මිනිසුන්ට මිනිත්තු ගණනක් ඇසිපිය නොහෙළා විසීමද දුෂ්කරය.

## ආනන්ද බෝධීන් වහන්සේ

තථාගතයන් වහන්සේ ජනානුග්‍රහය පිණිස චාරිකාවෙහි වැඩම කළ කල්හි උන්වහන්සේ දක්නට ජේතවන විහාරයට සුවඳ මල් ආදිය ගෙන පැමිණෙන සැදැහැවත්හු උන්වහන්සේ නැති බැවින් ඒ පූජා ද්‍රව්‍යයන් ගඳකිළිය ඉදිරිපිට දමා කිසි සතුටක් නොලබා පෙරළා යන්නාහ. ඒ බව දත් අනේපිඬු සිටුතුමා බුදුරදුන් දෙව්රම් වෙහෙරට වැඩම කළ කල්හි ආනන්ද ස්ථවිරයන් වහන්සේ වෙත එළඹ ඒ කරුණ උන්වහන්සේට දන්වා "ස්වාමීනි, තථාගතයන් වහන්සේ මේ වෙහෙරෙහි නැති අවස්ථාවන්හි සුවඳ මල් ආදිය ගෙන පැමිණෙන්නවුන්ට ඒවා පුදා සිත සතුටු කරගැනීමට තැනක් මේ විහාරයෙහි ඇති කළ හැකිද? නොහැකිද? යන වග දැනු මැනව" යි සැල කළේය. ආනන්ද ස්ථවිරයන් වහන්සේ තථාගතයන් වහන්සේ වෙත එළඹ, "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, කොතෙක් චෛත්‍යයෝ ඇත්තාහුද?" විචාළහ. "ආනන්දය, චෛත්‍ය තුනක් ඇත්තේය" යි උන්වහන්සේ වදාළහ. "ඒ කවරහුද?" යි ආනන්ද



මහ තෙරුණුවෙරි ඇසූහ. "ආනන්දය, ශාරීරිකය, පාරිභෝගිකය, උද්දේසිකය යි චෛත්‍යයෝ තිදෙනෙක් වන්නාහු" යි භාග්‍යවතුන් වහන්සේ වදාළහ. "ආනන්දය, ශාරීරික චෛත්‍යය දැන්ම නොකළ හැකිය. එය කළ හැක්කේ බුදුවරුන් පිරිනිවීමෙන් පසුවය. බුදුවරුන් පරිභෝග කළ මහා බෝධිය වනාහි බුදුවරුන් ඇති කල්හිත්, නැති කල්හිත් චෛත්‍යයක්ම වන්නේය" යි බුදුන් වහන්සේ වදාළ සේක. එකල්හි ආනන්ද ස්ථවිරයන් වහන්සේ "ස්වාමීනි, නුඹ වහන්සේ චාරිකාවෙහි වැඩම කළ කල්හි මේ ජේතවන විහාරය මහජනයාට පිහිටක් නැති තැනක් වන්නේය. මහජනයාට වැඳුම් පිදුම් කිරීම පිණිස මහා බෝධියෙන් ඵලයක් ගෙන්වා මේ ජේතවන ද්වාරයෙහි රෝපණය කරන්නෙමි" පැවසූහ. "ආනන්දය, එසේ කරව. එකල්හි මා ජේතවන විහාරයෙහි නිබඳ විසීමක් වැනි වන්නේය" යි තථාගතයන් වහන්සේ වදාළ සේක. ආනන්ද ස්ථවිරයන් වහන්සේ මුගලන් මහ තෙරුන් වහන්සේ ලවා මහා බෝධි ඵලයක් ගෙන්වා ජේතවන විහාර දොරටුව සමීපයේ අනේපිඬු සිටාණන් ලවා මහත් වූ රන් කටාරමක රෝපණය කරවූහ. එකෙණෙහිම මහජනයා බලා සිටියදීම එයින් පනස් රියනක් උස සතර දිශාවටම විහිදුණු පනස් රියන් අතු ඇති මහා බෝධි වෘක්ෂයක් පැන නැංගේය. ආනන්ද ස්ථවිරයන් වහන්සේගේ මෙහෙයවීමෙන් රෝපණය කළ බැවින් ඒ බෝධීන් වහන්සේ ආනන්ද බෝධිය නම් වූහ."

## ශ්‍රී ලංකාවේ බෝධීන් වහන්සේලා

තථාගත පරිනිර්වාණයෙන් දෙසිය සතිස් වන වසරේ මෙහි සසුන් පිහිට වීම සඳහා මිහිඳු මහ රහතන් වහන්සේ මේ දිවයිනට වැඩම කළ සේක. එකල්හි ලක් රජය කළේ දෙවන පෑතිස් රජතුමාය. එතුමාගේ කාලයේ මිහිඳු මහරහතන් වහන්සේගේ නැගණියන් වන සංඝමිත්තා තෙරණියන් විසින් ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ දක්ෂිණ ශාඛාව ශ්‍රී ලංකාවට වැඩම කරවන ලද්දේය. ලක් පොළොවෙහි එය පිහිටවූ සඳු සතියක්ම නොපෙනී තිබිණ. සත්වන දිනයේ බෝධීන් වහන්සේ දක්නට ලැබුණු කල්හි බෝධීන් වහන්සේ දක්නට රැස් ඇතුළු බොහෝ ජනයා පැමිණියහ. බෝධීන් වහන්සේගේ මහ අතු පසෙහි පල ගෙඩිද පෙනිණ. ඒවා මහජනයා බලා සිටියදීම නටුවෙන් ගිලිහී පතිත විය. මිහිඳු මහ රහතන් වහන්සේ ඒවා පොළොවට වැටෙන්නට නොදී සිවුරෙන් පිළිගෙන රෝපණය කිරීම සඳහා රජුට දුන්හ. රජතුමා රෝපණය කළ කල්හි මහජනයා බලා සිටියදීම එක් එක් ඵලයකින් අට අට බැගින් බෝ පැළ පැන නැංගේය. එකක් සතර රියනක් පමණ විය. බෝ පැළ සතළිසක් විය. ඒවා මේ ශ්‍රී ලංකා ද්වීපයේ දඹුරු තොටය, ථූපාරාමය, ප්‍රාථමික චෛත්‍යස්ථානය, රුහුණේ කතරගමය, මල්වැස්සා වෙහෙරය, මහාඅල්ලිකා නම් ගමය, පොළොන්නරුව, රුහුණු රට මාගමය, මහියංගණය, බදුල්ලේ මුතියංගණය, රුහුණු රට සිතුල්පව්වය, වැලිගම් වෙහෙරය, මැද්දේගමය, පුසුල්පිටිය, බෙලිගල්ලය, වට්ටාරාමය, රස්සේරුවය, ගිරිබා වෙහෙරය, කසාගලය, නිවත්ත බ්‍රාහ්මණ ගමය, සඳගිරි වෙහෙරය, සැගිරිය, සඳුන්ගමය, තන්ත්‍රිමලයය, කොටිටියාරාමය, මාතලේ රුසිගමය, විල්වලය, විල්ගම් වෙහෙරය, මුත්තල හත්පෝරු වෙහෙරය, වනාවාස වෙහෙරය, පරගොඩපි, ගණේගමය, මායාරට බතුරය, පැපිලියානය, ගල්ලෙන්විලය, වදුරවය, පුළුගල්ලය, කටගාවය, යාපනුවය, රන්කල් වෙහෙරය යන ස්ථානයන්හි රෝපණය කරන ලද්දේය. මෙසේ සිරි ලක්දිව බෝධීන් වහන්සේලා සතළිස් එක් නමක් වූහ. වර්ෂ දෙදහස් ගණනකට පෙර රෝපණය කළ ඒ බෝධීන් අතුරෙන් ශ්‍රී මහා බෝධීන් වහන්සේගෙන් ස්වල්පයක් අද දක්වා පවතින්නේය. එය පවත්නේ බලවත් ආරක්ෂාවෙන්, සත්කාරයන් නිසාය. අනෙක් බෝධීන් වහන්සේලා දැනට ඇති නැති බව නොදත හැකිය. ඉහත කී ස්ථානවල දැනට ඇති බෝධීන් පසු කාලයේ රෝපණය කළ ඒවාද විය හැකිය. ශ්‍රී මහා බෝධි පරම්පරාවෙන් පැවත එන සියලුම බෝධි වෘක්ෂ වැඳුම් පිදුම් කිරීමට සුදුසුය. ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඩම වීමට කලින්ද මේ රටේ ඇසතු ගස් තිබෙන්නට ඇත. දැනට ඒ සියල්ලටම කියනුයේ බෝගස් කියාය. බෝධීන් වහන්සේලාට වැඳුම් පිදුම් කරන පැරැන්නන් ශ්‍රී මහා බෝධීන් වහන්සේ සලකා ගෙන උත්වහන්සේට කරන වන්දනා පූජාවක් වශයෙන් වැඳුම් පිදුම් කළ කල්හි අඩුවක් නැතිව බෝධි වන්දනා පූජා කුශලය ලැබෙනු ඇත. දැනට බෞද්ධයන් බෝධි වන්දනාව සඳහා භාවිත කරන,

"යස්ස මූලේ නිසින්නෝව
සබ්බාරි විජයං අකා
පත්තෝ සබ්බඤ්ඤුතං සත්ථා
වන්දේ තං බෝධිපාදපං"

යන ගාථාවද බුදුරජාණන් වහන්සේ පිරිනිවී වැඩ සිටි දශයේදී ශ්‍රී මහා බෝධීන් වහන්සේට වැඳීම සඳහා රචිත ගාථාවකි. එය මහා බෝධි වංශ නමැති පාලි ග්‍රන්ථය රචනා කළ ස්ථවිරතුමන් විසින් පළමු කොට ශ්‍රී මහා බෝධීන් වහන්සේට නමස්කාර කිරීම සඳහා එහි යොදා ඇති ගාථාවය.

ඉන්දියාවෙහිද ඇතැමුන් බෝගස දේවත්වයෙන් සලකති. පැරණි අශ්වත්ථස්තෝත්‍රයක්ද ඇත. ඇසතු ගස දැකීමෙන් රෝගයන්ගෙන් මිදෙන බවද, ස්පර්ශ කිරීමෙන් පාපයෙන් මිදෙන බවද, ඇසුරු කිරීමෙන් චිර ජීවනය ලබන බවද, ආයුෂය දරුවන්ය ධන ධාන්‍ය සෞභාග්‍යය සර්ව සම්පත්තිය බෝගසින් දෙන බවද එහි සඳහන් වේ. ඒ අනුව ග්‍රහ අපල රෝග සතුරු උවදුරු ආදිය දුරු වීමට සිනම් බෝධියකට වුවද වැඳුම් පිදුම් කිරීම හොඳ බව කිය යුතුය. බෝධි ස්තෝත්‍ර කීමෙන් බ්‍රාහ්මණයන් මැරීමේ පාපයෙන්ද, ගුරුන් මැරීමේ පාපයෙන්ද, දිළිඳු බවින්ද, රෝගවලින්ද මිදිය හැකි බව එහි කියා තිබේ. බෝධි මූලයෙහි එක් බමුණෙකුට දන් දීම බමුණන් කෝටියකට දීම වැනි යයිද එහි කියා තිබේ.

අප රටේ බෞද්ධයන්ට බෝධි පූජාව පුරුදු වී ඇතත් බෝධි මූලයේ දන් දීමක් පුරුදු වී නැත. ග්‍රහ අපල දුරුවීම් ආදියට එයත් යහපත් විය හැකිය.

**රේරුකානේ චන්දවිමල මහනාහිමියන් විසින් රචිත**
**"බෝධි පූජාව" ග්‍රන්ථයෙනි.**

"යම් කෙනෙකුගේ සිත දිවා රෑ දෙකේ අහිංසාවෙහි ඇලුණේද ඒ ගෞතම ශ්‍රාවකයෝ හැමදාම සුවසේ නිදා පිබිදිත්."

# සදහම් ප්‍රහේලිකා අංක - 81

ජයග්‍රාහී වාසනාවන්තයින් තිදෙනාට දයාවංශ ජයකොඩි පොත් මැදුරින් වටිනා
ත්‍යාගයක් හිමිකෙරේ... දුරකථනය - 011-2695773



## උපදෙස් :

1. මෙය නිවැරදිව හා අකුරු පැහැදිලිව පුරවා තැපැල් පතක අලවා පහත සඳහන් ලිපිනයට එවිය යුතුය.
2. ප්‍රහේලිකා අංක 78, දයාවංශ ජයකොඩි සහ සමාගම, 112, පූජ්‍ය එස්. මහින්ද හිමි මාවත, කොළඹ 10.
3. පිළිතුරු පත් නොවැම්බර් මස 20 ට පෙර එවිය යුතුය.
4. ජයග්‍රාහකයින් තේරීමේ අවසන් තීරණය ප්‍රධාන සංස්කාරක සතුවේ.
5. ප්‍රහේලිකාවේ අපැහැදිලි තැනක් වේ නම් 071 3391013 අමතන්න.
6. ත්‍යාගය සඳහා විමසීම් සඳහා 011 2695773 (සුසිල්) අමතන්න.

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 බ | | | 3 | ■ | 4 | | 5 ස | ■ |
| ■ | | ■ | ■ | 6 | | ■ | ■ | 7 | |
| 8 | | ■ | 9 | ර | ■ | 10 | | | ■ |
| | ■ | 11 | ■ | ■ | 12 | | ■ | ■ | 13 |
| | ■ | | ■ | ■ | ■ | | ■ | 14 | |
| ■ | 15 | ල | ■ | 16 | | ■ | 17 | | දි |
| 18 | | ■ | 19 | | ■ | 20 | | ■ | |

### ▶ හරහට

1. සතර ආහාර වර්ගවලින් එකකි.
4. දස අකුසල වස්තුවලින් එකකි.
6. රාශි 12 න් එකකි.
7. වාක්‍ය යන අරුත දෙයි.
8. සමහරු භික්ෂූන් වහන්සේලාට මේ නාමින්ද හඳුන්වති.
9. දේවියන්ට සමාන දෙයකි.
10. 'සින්දු' යන අරුත ගෙනදෙයි.
12. පිය සෙනෙහස පුරා දක්වෙන සිංහල චිත්‍රපටයකි.
14. බෝධි කොඩියට අයත් වර්ණයකි.
15. මෙය හස්තියාගේ තේජස පෙන්වයි.
16. ප්‍රත්‍යයන් මේ නාමින්ද හැඳින්වේ.
17. බඩු කිරීමට ගන්නා උපකරණයකි.
18. ඇලෙන සුළු ද්‍රව්‍යයකි.
19. දකුණු පළාතට අයත් කුඩා ගංගාවකි.
20. මේවා නිමෙන් පව් සිදුවේ.

### ▼ පහළට


2. දැකීන් යන දෙයට සමාන පදයකි.
3. මැනුම් සඳහා භාවිතයට ගැනේ.
5. මෙය පරම ධනය ලෙස බුදුදහමේ හැඳින්වේ.
8. අශෝකමාලා කැබොල්ලියට පෙම් කළ කුමරා.
10. බුදුන් සරණ ගිය ප්‍රථම අගතනතුර දැරූ උපාසිකාව.
11. සිත්කෙනා භික්ෂූන් අතර අගතැන්පත් තෙරණුවෝ.
13. දෙතිස් කුණප කොටස්වලට අයත්ය.
14. එක්තරා තුළ ගෝත්‍රයකි.
16. සමහර දඩයක්කාරයෝ සතුන් අල්ලා ගන්නට මේවා අටති.
17. රාත්‍රී කාලයට අහස එළිලවයි.

- අංක 80 ප්‍රහේලිකාවේ ජයග්‍රාහී වාසනාවන්තයන්ගේ නම් ලබන කලාපයෙන් (දෙසැම්බර්) බලාපොරොත්තු වන්න.

## මෙම පුදබිම කුමක්දැයි නම්කර වටිනා ත්‍යාගයක් හිමිකර ගන්න

මෙහි පහත දක්වෙන්නේ ශ්‍රී ලංකාවේ පිහිටි වටිනා පුද බිමක පැරණි ඡායාරූපයකි. එය කුමක්දැයි නම් කොට පිළිතුර තැපැල් පතක අලවා පහත සඳහන් ලිපිනයට එවන්න. එහි ඔබේ නම හා ලිපිනයද සඳහන් කරන්න. ඔබේ පිළිතුර එවිය යුත්තේ, සංස්කාරක, දළදා වරුණ, දළදා මාලිගය, මාධ්‍ය ඒකකය, මහනුවර යන ලිපිනයටයි.

(නිවැරදි පිළිතුර එවනු ලබන ජයග්‍රාහී වාසනාවන්තයාට දර්ශනීය ශ්‍රී දළදා පෙරහැර සහිත රාමු කරන ලද වටිනා තිළිණයක් පරිත්‍යාග කෙරේ. මෙම වටිනා ත්‍යාගය පිරිනැමීම සඳහා අනුග්‍රහය දක්වන්නේ ප්‍රකට විද්‍යා ලේඛකයකු වන අනුර සී. පෙරේරා මහතා විසිනි. එතුමාගේ ආදරණීය මෑණියන් වන චාලට් බෙනරගම මහත්මියට හා ලෝ වැසි සියලු දෙනාටම සෙත්පතා මෙම ත්‍යාගය පිරිනැමේ.)



අතීත කලාපයේ 'පුදබිම' නිවැරදිව නම්කොට ත්‍යාගය දිනූ වාසනාවන්තයා

**උපේක්ෂා කේෂානි**
වැගොඩගෙදර,
අංක 3/A,
මාවල පාර, උලපනෙ.

(ඔබේ ත්‍යාගය ලබා ගැනීම සඳහා හැඳුනුම්පත සමඟ ශ්‍රී දළදා මාලිගාවේ මාධ්‍ය විශේෂ ව්‍යාපෘති කාර්යාලය වෙත පැමිණෙන්න)

අතීත කලාපයේ (ඔක්තෝබර්) ප්‍රශ්නයට අදාළ නිවැරදි පිළිතුර:
**කැලණි විහාරය**

## මහනුවර ශ්‍රී දළදා මාළිගය



**මහනුවර** ශ්‍රී දළදා මාළිගාවේ කඨින පින්කම මල්වතු අස්ගිරි අතිපූජ්‍ය මහානායක, අනුනායක හිමිවරුන්ගේ සහ දියවඩන නිලමේතුමාගේ අනුශාසනා පරිදි මහනුවර කටුකැලේ ආරාමාධිපතිනී කොත්මලේ සුධර්මා සිල් මැණියන්ගේ මූලිකත්වයෙන් සහ මහනුවර ලයනල් ගුණතිලක මහතා ප්‍රධාන එම පවුලේ දායකත්වයෙන් 2014 ඔක්තෝබර් මස 10-11 දෙදින තුළ පැවැත්විණ. පෙරහැරින් වැඩම වූ කඨින චීවරය පිරුවට ඔබට පත්කර දෙන මෙන් සුධර්මා සිල් මැණියන් විසින් එම චීවරය ශ්‍රී දළදා මාළිගාවේ තේවාව භාර අස්ගිරිය ගෙඩිගේ රජමහා විහාරාධිකාරී, සොළොස්මස්ථානාධිපති, ශාස්ත්‍රපති, වේඩරුවේ උපාලි නාහිමි වෙත භාරදුන් අයුරු ඡායාරූපයේ දක්වේ. ශ්‍රී දළදා මාළිගාවේ තේවාවේ නියුතු කාරක සංඝ සභික අරාවියේ සරණංකර නාහිමි, අස්ගිරි මහාවිහාර පරිවේණපති කාරක සංඝ සභික නියෝජ්‍ය ලේඛකාධිකාරී නාරම්පනාවේ ආනන්ද නාහිමි යන නාහිමිවරු මෙහි වැඩ සිටිති.

## අස්ගිරිය ගෙඩිගේ රජමහා විහාරය



**මහනුවර** අස්ගිරිය ඓතිහාසික ගෙඩිගේ රජමහා විහාරයේ කඨින පින්කම් පුණ්‍යෝත්සවය අස්ගිරිය මහා විහාරයීය කාරක මහා සංඝ සභාවේ කාරක සංඝ සභික පොළොන්නරුව සොළොස්මස්ථානාධිපති ශාස්ත්‍රපති ශ්‍රී දළදා තේවාව භාර වේඩරුවේ උපාලි නායක ස්වාමීන් වහන්සේගේ අනුශාසකත්වයෙන් අස්ගිරි පාර්ශ්වයේ අනුනායක මහියංගන රජමහා විහාරාධිපති ගලගම අත්ථදස්සී නාහිමිගේ ප්‍රධානත්වයෙන් සහ සාවිලුන්නගේ සුනන්දා මහෝපාසිකාවගේ දායකත්වයෙන් පසුගියදා පැවැත්විණි. සංඝයා වහන්සේලාගේ සම්මතයෙන් වස් වැසූ අස්ගිරිය මහා විහාර පිරිවෙන් ධර්මාචාර්ය පරුස්සැල්ලේ නන්ද හිමි (මැද) කඨින චීවර අතැතිව වැඩ සිටින අස්ගිරි අනුනායක හිමි (දකුණේ) ගෙන් ආශිර් ලබයි මෙසේය. උපාලි නාහිමි වමේ වැඩ සිටිති.

බොදු පුවත්

## ඉල් පෝද කඨින පින්කම්

**මහනුවර** ශ්‍රී නාථ දේවාල විහාරයේ කඨින පින්කම් පුණ්‍යෝත්සවය නොවැම්බර් 5, 6 දිනයන්හි මහෝපාධ්‍යාය අස්ගිරි මහා විහාරයීය කාරක සභික, නාථ දේවාල විහාරාධිපති, ගොඩමගොඩ රතනසාර නාහිමිගේ ප්‍රධානත්වයෙන් පැවැත්වේ. ඉල් පුර පෝය දිනට පෙරහර (5) අස්ගිරිය මහා විහාර පිරිවෙන් නියෝජ්‍ය පරිවේණාධිපති ශාස්ත්‍රපති ඇටිපොල මහින්ද හිමිගේ ප්‍රධානත්වයෙන් ආගමික වැඩසටහන් මාලාවකි.

මහනුවර, දේවැල්ල ගංගාරාමයේ කඨින පින්කම, මල්වතු මහා විහාර කාරක සංඝ සභාවේ ජ්‍යෙෂ්ඨ කාරක සභික සංඝරාජ පරිවේණාධිපති, ගංගාරාමයේ භාරකාර, ශාස්ත්‍රපති නැහැනිවල පියදස්සී හිමි ප්‍රධානත්වයෙන් පැවැත්වේ. 5 වෙනිද සවස සෙත් පිරිතකි, බෝධි පූජාවකි.

හලාංගමුව පින්නගොල්ල ශ්‍රී සද්ධර්මාරාමාධිපති, මහනුවර දිසා ගණන ආරණ්‍යක මණ්ඩලයේ ලේඛකාධිකාරී නාවුරන්නෙත සද්ධානන්ද හිමි ප්‍රධානත්වයෙන් කඨින පින්කම නොවැම්බර් 5, 6 දිනවල සිදුකෙරෙන අතර ඉල් පෝද මහා සංඝරත්නය හතළිස් නමක් වියෙහි සිවුරක් සහිත සටපිරිකර සංඝගත දක්ෂිණාවක් පිරිනැමේ.

පේරාදෙණිය, ගන්නොරුව රජමහා විහාරාධිපති, යටිනුවර උප ප්‍රධාන සංඝනායක, ධර්මාචාර්ය අම්බන්පොල සුමංගල නාහිමි ප්‍රධානත්වයෙන් කඨින පින්කම නොවැම්බර් 5, 6 දිනවලද, කටුගස්තොට ඉල්ලදෙට පොත්ගුල් පුරාණ විහාරයේ කඨින පින්කම නොවැම්බර් 5, 6 දිනවලදී විහාරාධිපති යටිනුවර ප්‍රධාන සංඝනායක ශාස්ත්‍රපති මීවල සෝරත නාහිමි මූලිකත්වයෙන් පැවැත්වේ.

## සාහිත්‍යාචාර්ය අම්පිටියේ ධම්මකිත්ති නාහිමිපාණෝ අසූ වියට පා තබති

**මාතලේ,** කොහොඹිලිවල බෞද්ධ සේවා මධ්‍යස්ථානාධිපති, ශ්‍රී ලංකා රාමඤ්ඤ නිකායේ මාතලේ දිසා මණ්ඩලයේ ක්‍රියාකාරී සාහිත්‍යාචාර්ය, සාහිත්‍යසූරී අම්පිටියේ ධම්මකිත්ති නාහිමිපාණන්ගේ අසූවෙනි ජන්මෝත්සවය නිමිත්තෙන් උන්වහන්සේට දීඝායු ප්‍රාර්ථනා කිරීමේ ආගමික වැඩසටහන් මාලාවක් නොවැම්බර් 16, 17 දිනවලදී කොහොඹිලිවල බෞද්ධ සේවා මධ්‍යස්ථානයේදී පැවැත්වේ.

බෞද්ධ සාහිත්‍යය මූලිකරගෙන නව දශකයේ කොත්මලේ පුරවරයෙන් කඳුරට සාහිත්‍ය සංගමය ආරම්භ කර කාලයකදී කඳුරට පාස හේවාහැට ප්‍රදේශයේ දහම් පාසල් අතර ව්‍යාප්ත කරමින් දහම් පාසල් අධ්‍යාපනයෙන් බෞද්ධ සාහිත්‍යයට නැඹුරු ශිෂ්‍ය පිරිසක් බිහිකිරීමේ සාහිත්‍ය වැඩසටහනක් ආරම්භ කළ අම්පිටියේ ධම්මකිත්ති හිමි එම වැඩසටහන අනුව දශකයේ මාතලේ දිසාව දක්වා ව්‍යාප්ත කර ශිෂ්‍යයන් අතර අධ්‍යාපන මට්ටම දියුණු කිරීමට උර දුන් සාහිත්‍යධර පඬිවරුවෙකි.

## අග්ගමහා පණ්ඩිත මහෝපාධ්‍ය අලුත්ගම ධම්මානන්ද නාහිමිපාණන්ට දීඝායු

**මහනුවර,** මල්වතු මහා විහාර පාර්ශ්වයේ විශ්‍රාන්තිකාමී කාරක මහා සංඝ සභාවේ ජ්‍යෙෂ්ඨ කාරක සභික මහෝපාධ්‍ය අග්ගමහා පණ්ඩිත අලුත්ගම ධම්මානන්ද නාහිමිපාණන් නොවැම්බර් මස 22 වෙනි දිනට අනූ නව වියට (99) පත්වීම නිමිත්තෙන් නාහිමිපාණන්ට දීඝායු ප්‍රාර්ථනා කිරීමේ ආගමික වැඩසටහන් මාලාවක් මල්වතු මහා විහාරීය ඓතිහාසික මංගල උපෝසථාගාරය මූලිකරගෙන පැවැත්වීමට ධම්මානන්ද නාහිමි අනුශාසකත්වය දරන ශ්‍රී සංඝරාජ ගුණානුස්මරණ සමිතිය ප්‍රධාන බෞද්ධ සමිති පිළිවෙළින් යොදා ඇත.

වර්ෂ 1915 නොවැම්බර් 22 දිනයෙහි අලුත්ගම ග්‍රාමයේ උපත ලබා මුරුදෙණිය, ඉටමෙගම රජයේ පාසල් තුළින් මූලික අධ්‍යාපනය ලබා 1934 සැප්තැම්බර් 6 වෙනි දින මල්වතු මහා විහාරයේදී පැවිදි බිමට ඇතුළත්ව සංඝරාජ පිරිවෙනෙන් ධර්ම ශාස්ත්‍රය හදාරා කරගත් ධම්මානන්ද නාහිමි 1950 දී ධර්මරාජ විද්‍යාලයේ ධර්මාචාර්ය වශයෙන් පත්විය. එම වසරේම ධර්මරාජ විද්‍යාලයේ දහම් පාසලත්, 1951 දී මල්වතු මහා විහාරයේ සංඝරාජ දහම් පාසලත්, 1950 සැප්තැම්බර් බත්ගොඩ පුස්තකාලය දහම් පාසල් වැඩසටහන ආරම්භ කර මේ සියලුම ආගමික සේවාවන් අද දක්වා පවත්වාගෙන යනු ලබන ධම්මානන්ද නාහිමියෝ මහනුවර ප්‍රධාන දිවයිනේ බෞද්ධ සමිති සම්මේලන ගණනාවකම අනුශාසක වශයෙන් ප්‍රමුඛ අධිෂ්ඨානයකින්, නිර්භීතව සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය වෙනුවෙන් කටයුතු කරන ප්‍රශස්ත භික්ෂුවකි මහ තෙරනමකි. දශක තුනක් අඛණ්ඩව මල්වතු මහා විහාරයේ වස් දාන වැඩසටහනක්, 68 වසරක් සංඝරාජ ගුණ සමරු පෙරහරක් පවත්වාගෙන යති. 1983 ආරම්භ කළ කඳුරට ශාසනහිතකාමී භික්ෂු සංගමය, තුන් නිකායේ මහා සංඝරත්නයේ ආගමික, සාමාජීය කටයුතුවලට ශක්තියක් කරන ධම්මානන්ද නාහිමියෝ 99 වියට පා තබන්නේ නිදි පැවිදි දෙපිරිසගේ දීර්ඝායුශ ලබමිනි.

කේ. බණ්ඩාරනායක



# ඔබ සියල්ල දෛවයට කරන්නට ඉඩදී බලා සිටිනවාද?

## දිවි මග ජයගන්න බුදු දහමින් උපදෙස්

දෛවය යනු ඉන්දීය වෛදික සම්ප්‍රදායේ හින්දු සමය හා බැඳුණු විශ්වාසයකි. සංස්කෘත භාෂාවෙහි දෛවය යන වදනෙහි නිරුක්තිය දක්වා ඇත්තේ "දේවේභ්‍යඃ ආගතඃ දෛවඃ" යනුවෙනි.

එහි අදහස දෙවියන්ගෙන් පැමිණි දෙය දෛවය යන්නයි. මෙහි පැමිණි දෙය වශයෙන් අර්ථ ගැන්වී ඇත්තේ දේව අභිමතය, දේව කැමැත්ත මිස අනෙකක් නොවේ.

● බණ පොතේ දෛවය ගැන කියවේද?

දෛවයට පදනම් වන සර්වබලධාරී දෙවියකු පිළිබඳ විශ්වාසය බුදු දහමින් ඉඳුරාම ප්‍රතික්ෂේප කෙරෙන අතර ත්‍රිපිටක සාහිත්‍යයේ කිසිදු තැනෙක දෛවය යන්නට සමාන අරුතක් ඇති වදනක් හෝ නැත. එහෙත් සූත්‍ර පිටකයෙහි එන මුල්ම සූත්‍ර දේශනාව වන දීඝනිකායේ බ්‍රහ්මජාල සූත්‍රයෙහිම දෛවය පිළිබඳ ඉගැන්වීම "සස්සතවාද මිච්ඡා දිට්ඨි" යනුවෙන් ඉතා පැහැදිලිවම හඳුන්වා දී තිබේ.



● දෛවය කීමට බුදු දහමින් ඉඩක් තිබේද?

දෛවය පදනම් කොට අංජනම්, නිමිති, ශාස්ත්‍ර ආදී අනාගත වාක්‍ය කීම ආදී වූ ක්‍රියාවන් ආර්ය ශ්‍රාවකයන් විසින් අත් හල යුතු වැරදි පැවැත්මක් (මිච්ඡා ආජීව) ලෙස සඳහන් වන අතර එවන් විශ්වාසයන් වැරදි දෘෂ්ටි හෙවත් මිච්ඡා දිට්ඨි බවද එම සූත්‍රයෙහි ඉතා පැහැදිලිවම කියැවෙයි.

● මහා ධර්මපාල ජාතකයේ එන කතා පුවත කුමක්ද?

අපේ බෞද්ධයන් බොහෝ දෙනෙකු දහම දකිමේ ක්‍රමවේදයේ වරදක් තිබේ. එනම් මූලික ධර්ම විනය පදනම් කොට ශ්‍රී සද්ධර්මය විමසීම පසෙක ලා බෞද්ධ සාහිත්‍යය පදනම් කර ගනිමින් ධර්ම විනය පිළිබඳ නිශ්චයකට එළඹීමට වෙර දැරීමය. බුදු දහම ශාස්ත්‍රීය ලෙස අධ්‍යයනය නොකළ විද්වත්හුද මෙම වරද කරති.

අපි මේ සම්බන්ධව නිදසුනක් ගනිමු. ජාතකට්ඨ කතාවෙහි එන මහා ධර්මපාල ජාතකයට අනුව බෞද්ධ සදාචාර මාර්ගයෙහි නිසි ලෙස හික්මෙන කිසිවෙකුත් අල්පායුෂ්ක නොවෙති. එය ජාතක පාලියෙහි එන "ධම්මෝ හවේ රක්ඛති ධම්ම චාරිං" නම් ශ්‍රී මුඛ පාඨය පදනම් කරගත් අර්ථ කතාවය. ඉන් බෞද්ධ සදාචාරයෙහි හික්මෙන්නවුන්ගේ රැකවරණය දහමින්ම සැලසෙන බව කාව්‍යාත්මකව විවරණය වේ. එහෙත් මිනිසාගේ දීර්ඝායුෂ පිළිබඳ බෞද්ධ ආකල්පය අනාවරණය කර ගනු පිණිස යමකු ජාතකට්ඨ කතාවෙහි දක්වෙන මෙම පුවත පදනම් කර ගැනීම මූලික ධර්ම විනය ඉඳුරාම පිටු දකිමකි. ඒ නිසාම බුදු දහම වටහා ගැනීමේ නිවැරදි ක්‍රමවේදයක් පිළිබඳව බුදුරජාණන් වහන්සේ දේශනා කොට ඇත. මහාපදේශ සූත්‍ර දේශනාවෙහි මෙම ක්‍රමවේදය පිළිබඳ ධර්ම කරුණු අඩංගු වී ඇත.

එසේ නොමැතිව මෙවැනි ආකාරවලින් දහමට පිවිසීම සර්පයකු වලිගයෙන් අල්ලා ගැනීමට සමාන බව බුදුරජාණන් වහන්සේම දේශනා කොට තිබේ. අලගද්දූපම සූත්‍රයෙහි මෙම ශ්‍රී මුඛ දේශනාව ඇතුළත්ය.

● නුපන් අනාගතයක් ගැන දහම කියන්නේ කොහොමද?

දෛවය පදනම් කරගනිමින් අනාගත වාක්‍ය කීම සහ ප්‍රඥාව මුල්කර ගනිමින් අනාගතය පිළිබඳව යම් යම් දේ කීම එකකට එකක් ඉඳුරාම වෙනස්ය. ඉන් පළමු වැන්න සඳහා මෝහය පදනම් කරගත් සස්සතවාද නම් මිථ්‍යා දිට්ඨිය මුල්වන අතර දෙවැන්න ප්‍රඥාව පදනම් කරගත් ඉදප්පච්චයතා සමුප්පාදය වටහා ගත යුතු වෙයි. මෙහිදී බුදුවරුන් විසින් අනුගමනය කරන ලද්දේ ලෝක ධර්මතාවයකට අනුව යමක් පැවතීමට ඇති හැකියාව එනම් භව්‍යතාවය මුල් කොට අනාගතය පිළිබඳ එවැනි ප්‍රකාශ කිරීමය. එහෙත් ඒවා පැවැතීම සම්බන්ධයෙන් පූර්ණ හැකියාවක් නොමැති බව බුදු දහමින්ම මනා සේ තහවුරු වන නිසා බුදුරජාණන් වහන්සේ විසින් අනාගතය සම්බන්ධයෙන් කරනු ලැබූ ප්‍රකාශ සූත්‍ර දේශනාවෙහි දකිය හැක්කේ ඉතා සුළු ප්‍රමාණයකි. ඒ බව ත්‍රිපිටකය හැදෑරීමේදී මැනවින් පසක් වෙයි.

● දෛවය විශ්වාස කරන්නා බෞද්ධ විරෝධියෙක්ද?

ඒ අනුව මිනිසාගේ පරම විමුක්තිය උදාකර ගත හැකි චිත්ත දමනය පෙරටු කොට ගත් සදාචාර මාර්ගය හෙවත් ආර්ය අෂ්ටාංගික මාර්ගය ලොවට හඳුන්වා දුන් බුදුන් වහන්සේ, මෙලොව පැවැත්ම දෙවියන්ගේ අභිමතය හෙවත් දෛවය මත රඳා පවතින බවක් දේශනා කොට ඇතැයි කීම බුදු දහමට කරන ලබන නිග්‍රහයකි. දෛවය විශ්වාස කරන්නා බෞද්ධ විරෝධියකු සහ බුදුන්ට එරෙහි වන්නකු වන්නේ එබැවිනි.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය පාලි සහ බෞද්ධ අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සහ විශ්වවිද්‍යාලයීය බෞද්ධ විහාරාධිපති රාජකීය පණ්ඩිත
**ආචාර්ය පූජ්‍ය මබුළුගම ශාන්තවිමල හිමි**

"කෝපයෙන් මත් වූ තැනැත්තා උමතු අශ්වයෙකු පිට නැගී යන්නෙකු වැනිය"




# යථාර්ථයට මුහුණ දෙන්න

## ත්‍රිලක්ෂණය අවබෝධ කරගන්න

අප උපන්නේ කුමක් සඳහාදැයි කිසිවකු අපෙන් විමසූ විටක දිය හැකි නිවැරදි පිළිතුර කුමක්දැයි නිශ්චය කරගැනීම අසීරුය. එහෙත් බෞද්ධ ඉගැන්වීම් පිළිබඳ සාමාන්‍ය දැනීමක් ඇති පුද්ගලයකු මීට නිවැරදි පිළිතුරක් සපයා ගනු ඇත. එවැනි නිරවද්‍ය පිළිතුරු රාශියක් අතරින් එළැඹිය හැකි පැහැදිලි නිගමනය මෙයයි.

**"සංසාර ගමනේ නිමාවක් දකිනු පිණිස විදර්ශනා ඥානය උපදවා ගැනීම මිනිස් ලොව ඉපදීමේ අරමුණයි."**

මෙවැනි අරමුණක් මිනිස් වර්ගයා තුළ නොව බෞද්ධයන් යැයි කියාගන්නා පිරිස තුළවත් ඇත්තේ කීයෙන් කී දෙනෙක් තුළද? තමුන් විදර්ශනා නුවණ යනු කුමක්දැයි අරුත් සහිතව විමසා බැලූ විට මෙය සකලවිධ මානව වර්ගයාගේ ජීවයන අරමුණ වී ඇති බව පැහැදිලිය.

විදර්ශනා යනු විස්තර සහිතව දර්ශන කිරීමයි. හෙවත් සවිස්තරාත්මකව බැලීමයි. ලෝකයේ පැවැත්ම දෙස විස්තරාත්මකව බලන විට අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන ත්‍රිලක්ෂණය තුය අවබෝධ වෙයි. අනිත්‍ය යනු ස්ථිරත්වයක් නැති බවයි. මෙම අස්ථිරත්වය ලොව පුරා පැතිරී ඇති යථාර්ථයයි. නොවෙනස් වන කිසිවක් ලෝකය තුළ අපට හමු නොවේ. පරිණාමය-විපරිණාමය ආදී ලෝකය පිළිබඳ ස්වභාවයන් අපට දක්වන වචන සකළ වී ඇත්තේ මේ වෙනස්වීම සඳහා ම කරගෙනය.

අප මෙලොව ජීවත් වන විට සතුට, ප්‍රීතිය, සිනහව, සොම්නස ආදී වචන් සුඛවාදී ආකල්ප සමග නැගිරෙන්නේ හුදෙක් ඉතා කී අනිත්‍යතාවය මදකට අමතක කරමිනි. හෙවත් යථාර්ථය යටපත් කරගැනීමෙනි. ඉඳහිට හෝ අප අනිත්‍යතාවයන් පිළිබඳ අත්දැකීම්වලට මුහුණ දෙන විට තදා වැළපෙමු. දුක් සුසුම් හෙළමු. ලෝකය තුළින් සදාකාලික සැප ප්‍රාර්ථනා කරන පුද්ගලයන් දුක් සහිත අත්දැකීම් ලත් විට සියදිවි පවා නසාගන්නේ එබැවිනි. මේ අනුව පැහැදිලි වන දෙවන ලක්ෂණය නම් "දුක්ඛ" යනුවෙන් සඳහන් වන සිතට පීඩා ගෙන දෙන සංකල්පයයි.

අප ජීවත් වන ලෝකය වෙනස්වීම සහිතයි. එබැවින් දුක් සහිතයි. මේ කරුණු දෙක නිසා පැහැදිලි වන තුන්වන යථාර්ථය නම් අනාත්ම යන්නයි. ඉන් අදහස් වන්නේ (න + ආත්ම = අනාත්ම) ආත්මයක් හෙවත් මමය, මාගේය, යන උරුමකරුවකු පිළිබඳ පවතින මායාවයි. "මගේය" යනුවෙන් වැළඳ ගැනීමට හෝ උරුමකර ගැනීමට යමක් මෙහි නැති බව අපට පසක් වන්නේ මේ තුන්වන ලක්ෂණය තේරුම් ගත් විටයි.

මේ අනුව ත්‍රිලක්ෂණය යනු තෘෂ්ණා මායාවෙන් වෙළී සිටින, ආශා රැහැනින් බැඳී සිටින ජීවිත වගලුන් විසින් තේරුම් නොගන්නා ලෝකය පිළිබඳ ස්වභාවයයි. මෙය දැන දැන පසක් කරගත් පුද්ගලයා ලෝකය දිනුවෙකි. ලෝකයේ ඉපදීම පිළිබඳ අරමුණ ඉටුකර ගන්නෙකි.

විකසිත කුසුමක අසිරිය බැලූ මේ සුන්දර රූප ශෝභාව ළඟා විය. තරුණ විය ඉක්මවා මහළු විය පත්වන තුරු කෙතරම් වෙනස්වීම්වලට බඳුන් වේද? ළදරු වියේ මල් කැකුලක් බඳු ශරීරය යොවුන් වියේ ආකර්ෂණීය පිපිලුන් මලකින් සමලංකෘත වූ විට එය ආත්මීය වශයෙන් වැළඳ ගන්නේ තමන්ම පමණක් නොවේ.

සෞන්දර්යාත්මක යොවුන් සිරුර වැහැරෙන්නට නොදී රැකගැනීමට වෙර දරන වියපත් පුද්ගලයන් ඒ සඳහා සිදුකරන කැපකිරීම් සීමා උපදවන සුළුය. තමන් වෙතින් ගිලිහී යන සුන්දරත්වය රැකගනු පිණිස දහස් ගණන් මුදල් වැය කරන ගැහැනුන්ගෙන් හා මිනිසුන්ගෙන් අප සමාජය පිරී පවතී.

කිසිදු කාලයකිලිය නොහැකි විපරිනාමීය ධර්මතාවයකට යටත්ව ඇති දෙතිස් ලක්ෂණයන්ගෙන් යුතු මේ සිරුර ඇසුරු කොට පහිතිත මිල කළ නොහැකි සිත හා සිතුවිලි නිවැරදි කර ගැනීමටත්, පිරිසිදු කරගැනීමටත්, ආරක්ෂා කරගැනීමටත් උත්සාහ දරන කිසිවෙකු මේ අතර සිටීද?

බුදුපියාණන් වහන්සේට මල් පූජා කරන විට අප ගයන ගාථාවේ මෙබඳු අදහසක් ඇත. 'මල් මැලවී යයි (පුප්ඵං මිලායාති) එසේම මාගේ ශරීරයද විනාශ භාවයට පත්වෙයි (කායො තථා යාති විනාසභාවං)' බුදුන් පුදන කුසුම් පවා අපට කියා දෙන්නේ මැලවෙන මලක් බඳු ශරීරය විනාශ වී ගියත් එහි රැඳුණු ගුණ සුවඳ චිරස්ථායී දහය කළ හැකි බවයි. යථාර්ථය තේරුම් ගත් සිතක මිහිමය කුසුම් යන සිරුරක හැඩරුවට වඩා කෙතරම් සිලුවත්ද?

ත්‍රිලක්ෂණය අවබෝධ කරගත් ජයග්‍රාහී මිනිසා සියලු අභියෝග ඉදිරියේ අකම්පිතය. ලෝකයේ සිදුවන වෙනස්වීම් ඔහු උගත් දහමට එකඟ බැවින් කම්පාවට හේතුවක් කර නොගනී. විපරිනාමීය දුක ඔහුට නොදනේ. උරුම කරගත හැකි යමක් මෙලොව නැති බව පිළිගන්නා මෙම ජයග්‍රාහකයා අහිමිවන කිසිවකින් කම්පා නොවේ. ඔහු මෙලොව කිසිවක් ආත්මීය වශයෙන් අල්ල බැඳගෙන නොසිටි බැවිනි.

අනිත්‍ය - දුක්ඛ - අනාත්ම යන ත්‍රිලක්ෂණයට ජාති, ආගම්, කුල, පාට, පක්ෂ ආදී සියලු භේදයන්ගෙන් තොරව සත්ව වර්ගයා මුහුණ දිය යුතුය. එයට පටහැනිව ක්‍රියා කරන සියලු තැනැත්තන් දුක් දෙමිනක් හමුවේ කම්පාවටත්, අසහනයටත් පත්ව මෙලොවින් සමුගනී. මෙය වටහා ගත් තැනැත්තා මෙලොව සුවසේ වෙසෙයි. ඔහු අනුභව කරන ආහාරපාන, අඳින පළඳින ඇඳුම් පැළඳුම්, ගමන් බිමන් යන යාන වාහන, වාසය කරන ගේ දොර ඉඩකඩම් සියල්ල පරිහරණය කරන්නේ ඉතා වගකීමෙන් යුතුවය. ඒ සියල්ල මෙලොව ජීවත්වීම සඳහා පමණක් තාවකාලිකව උරුම වී ඇති නමුදු හෝ අත්හැරිය යුතු වස්තූන් ලෙස සැලකීමට ඔහුට නුවණ තිබේ.

මෙලොව සැනසීම ඔහුට හිමිවේ. නිවනද ඔහුට දුර නොවේ.

කුරුණෑගල විශුද්ධාරාම විද්‍යායතන පිරිවෙණේ
**ආචාර්ය, ශාස්ත්‍රපති වික්‍රමසිංහ අතපත්තු**